# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
# 2017

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව

# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2017

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ
10 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

**මංගල සමරවීර, පා.ම.**
**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය**

**2017 ජූනි 30**

## වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

## 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ

## 10 වෙනි වගන්තිය යටතේ

## ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වෙනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වර්ෂයේ ජුනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැනගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත් කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්ය සාධනය මෙම වාර්තාවේ ඇතුලත් වේ. 2017 පළමු කාර්තුව සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබා ගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්ය සාධනය, මිල ගණන් වෙනස් වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය සහ නිල සංචිත පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුලත් වේ.

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1 වන පරිච්ඡේදය | **ආර්ථිකය** | |
| | 1.1 ආර්ථික වර්ධනය | 1 |
| | 1.2 උද්ධමනය | 5 |
| | 1.3 මුදල් හා ණය | 6 |
| | 1.4 කොටස් වෙළඳපොළ | 7 |
| | 1.5 විදේශ අංශයේ ප්‍රවණතා | 7 |
| 2 වන පරිච්ඡේදය | **ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා** | |
| | 2.1 ආර්ථික වර්ධනය | 11 |
| | 2.2 උද්ධමනය | 12 |
| | 2.3 පොලී අනුපාතික | 12 |
| | 2.4 විනිමය අනුපාත | 12 |
| | 2.5 අයවැය හිඟය | 13 |
| | 2.6 රාජ්‍ය ණය | 13 |
| | 2.7 ජාත්‍යන්තර වෙළඳාම | 13 |
| | 2.8 භාණ්ඩ මිල | 13 |
| 3 වන පරිච්ඡේදය | **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා** | |
| | 3.1 සමාලෝචනය | 15 |
| | 3.2 රජයේ ආදායම | 17 |
| | 3.3 රජයේ වියදම් | 25 |
| | 3.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 48 |
| 4 වන පරිච්ඡේදය | **රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය** | |
| | 4.1 සමාලෝචනය | 53 |
| | 4.2 රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් දහය පිළිබඳ කෙටි සමාලෝචනය | 53 |
| 5 වන පරිච්ඡේදය | **විදේශ මූල්‍යනය** | |
| | 5.1 විදේශ මූල්‍යයන එකඟතා | 61 |
| | 5.2 විදේශ මූල්‍යයන ප්‍රතිලාභීන් | 64 |
| | 5.3 පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලාභී වීමට නියමිත ශේෂය | 66 |
| | 5.4 ගෙවීමට ඇති විදේශ ණය සහ ණය සේවාකරණය | 67 |

ශද

**මූලික ආර්ථික දර්ශක**

| දර්ශකය | කාල පරිච්ඡේදය | ඒකකය | වටිනාකම 2016 | 2017 (තාවකාලික) |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | 5.5 | 3.8 |
| කෘෂි කර්මාන්ත | පළමු කාර්තුව | % | 1.9 | (3.2) |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | 8.3 | 6.3 |
| සේවා | පළමු කාර්තුව | % | 4.9 | 3.5 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | මැයි අවසානයට | % | 4.8 | 6.0 |
| උද්ධමනය (සාමාන්‍යය) | මැයි අවසානයට | % | 2.7 | 5.4 |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 4.4 | ලැබී නොමැත |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | වාර්ෂික | % | 53.8 | ලැබී නොමැත |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන. - අප්‍රේල් | රු. මිලියන | -233,444 | -233,171 |
| මුළු ආදායම | ජන. - අප්‍රේල් | රු. මිලියන | 472,689 | 589,019 |
| බදු ආදායම | ජන. - අප්‍රේල් | රු. මිලියන | 441,211 | 554,294 |
| බදු නොවන ආදායම | ජන. - අප්‍රේල් | රු. මිලියන | 31,478 | 34,725 |
| වර්තන වියදම | ජන. - අප්‍රේල් | රු. මිලියන | 559,697 | 626,049 |
| රාජ්‍ය ආයෝජන | ජන. - අප්‍රේල් | රු. මිලියන | 151,978 | 201,012 |
| රාජ්‍ය ණය | දෙසැම්බර් අවසානයට | රු. බිලියන | 9,387.3 | ලැබී නොමැත |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 3,450 | 3,569 |
| එයින් කෘෂි අපනයන | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 722 | 852 |
| කාර්මික අපනයන | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 2,714 | 2,701 |
| රෙදිපිළි හා ඇඟලුම් | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 1,710 | 1,626 |
| වෙනත් | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 1,004 | 1,075 |
| ආනයන | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 6,055 | 6,883 |
| පාරිභෝගික භාණ්ඩ | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 1,426 | 1,516 |
| අන්තර් භාණ්ඩ | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 3,019 | 3,692 |
| එයින් ඛනිජ නිෂ්පාදන | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 687 | 1,208 |
| ආයෝජන භාණ්ඩ | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 1,608 | 1,615 |
| වෙළඳ ශේෂය | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | -2,606 | -3,314 |
| සංචාරක පැමිණීම් | ජන. - මැයි | සංඛ්‍යාව | 846,229 | 887,093 |
| සංචාරක ඉපයීම් | ජන. - මැයි | ඇ. ඩො. මිලියන | 1,451.8 | 1,521.9 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | 2,371 | 2,222 |
| කොටස් වෙළඳපොළ විවිධ ආයෝජන (ශුද්ධ) | ජන. - අප්‍රේල් | ඇ. ඩො. මිලියන | -19.5 | 154.5 |
| සමස්ත ගෙවුම්ශේෂය | ජන. - මාර්තු | ඇ. ඩො. මිලියන | (720.2) | (175.9) |
| දළ නිල සංචිත | මාර්තු අවසානයට | ඇ. ඩො. මිලියන | 6,221 | 5,117 |
| විනිමය අනුපාතය (මාසය අග) | මැයි අවසානයට | ඇ. ඩොලරයට රුපියල් | 145.75 | 152.71 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන. - මැයි | ඇ. ඩොලරයට රුපියල් | 145.65 | 152.33 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | ජූනි අවසානයට | % | 6.50 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | ජූනි අවසානයට | % | 8.00 | 8.75 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | ජූනි අවසානයට | % | 7.50 | 7.50 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය | ජූනි අවසානයට | % | 10.23 | 11.88 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ණය අනුපාතිකය | අප්‍රේල් අවසානයට | % | 11.66 | 13.52 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 01) | ජූනි අවසානයට | % | 9.50 | 10.52 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | ජූනි අවසානයට | % | 8.86 | 9.60 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | ජූනි අවසානයට | % | 10.55 | 10.47 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | අප්‍රේ. 2017/අප්‍රේ. 2016 | % | 18.2 | 20.1 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | අප්‍රේ. 2017/අප්‍රේ. 2016 | % | 28.1 | 20.0 |

**ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක**

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| **විදුලි බලය** | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2016 | % | 99.3 |
| **ජලය** | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2016 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 89.7 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2016 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 47.7 |
| **මාර්ග** | | | |
| මාර්ග ඝනත්වය | 2016 | වර්ග කි.මී. | 2.0 |
| මාර්ග වල මුළු දිග | 2016 | කි.මී. | 118,059 |
| **පණිවුඩ හුවමාරුව** | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2016 | පුද්ගලයින් 100 කට | 135.7 |
| අන්තර් ජාලය සඳහා ප්‍රවේශය | 2016 | පුද්ගලයින් 100 කට | 23.2 |
| **අධ්‍යාපනය** | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසැල් සඳහා ඇතුලත්වීමේ අනුපාතය | 2016 | % | 95.9 |
| ගුරු /ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2016 | සංඛ්‍යාව | 18 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2015 | % | 93.2 |
| පරිගණක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 06) | 2016 | % | 27.5 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ගුරු /ශිෂ්‍ය අනුපාතය | 2016 | සංඛ්‍යාව | 17.5 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23)(අ) | 2016 | % | 6.9 |
| **සෞඛ්‍ය** | | | |
| රෝහල් (ආ) | 2016 | සංඛ්‍යාව | 598 |
| ඇඳන් (ආ) | 2016 | සංඛ්‍යාව | 76,829 |
| රෝහල් ඇඳන් | 2016 | පුද්ගලයින් 1,000 කට | 3.6 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2016 | සංඛ්‍යාව | 1,036 |
| **ජනගහනය** | | | |
| ජනගහන ඝනත්වය | 2016 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 338 |
| ජනගහන වර්ධනය | 2016 | % | 1.1 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2015 | අවුරුදු | 75.0 |
| ළදරු මරණ අනුපාතිකය | 2013 | සජීවීඋපත් 1,000 කට | 8.2 |
| මාතෘ මරණ අනුපාතිකය | 2013 | සජීවීඋපත් 1,000 කට | 26.8 |
| දළ උපත් අනුපාතිකය | 2016 | පුද්ගලයින් 1,000 කට | 15.6 |
| දළ මරණ අනුපාතිකය | 2016 | පුද්ගලයින් 1,000 කට | 6.2 |
| යැපුම් අනුපාතය | 2016 | % | 49.4 |
| **දරිද්‍රතාවය** | | | |
| ජනගහන දරිද්‍රතා දර්ශකය | 2012/2013 | % | 6.7 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණක අගය | 2012/2013 | සංගුණකය | 0.48 |
| අන්තර දරිද්‍රතා දර්ශකය | 2012/2013 | % | 1.2 |
| සාමාන්‍ය දෛනික ඒකපුද්ගල ශක්ති පරිභෝජනය | 2012/2013 | කිලෝ කැලරි | 2,111 |
| **ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාව** | | | ස්ථානය |
| මානව සංවර්ධන දර්ශකය | 2015 | රටවල් 188 ක් අතරින් ස්ථානය | 73 |
| ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශකය | 2017 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 110 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2016/17 | රටවල් 138 ක් අතරින් ස්ථානය | 71 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2017 | රටවල් 180 ක් අතරින් ස්ථානය | 112 |
| ගෝලීය සාම දර්ශකය | 2017 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 80 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2015 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 79 |

*(අ) අභ්‍යන්තරිකව බඳවා ගන්නා ශිෂ්‍යයන් පමණක් ඇතුළත් වේ.*

*(ආ) රාජ්‍ය*


# 1 වන පරිච්ඡේදය

## ආර්ථිකය

### 1.1 ආර්ථික වර්ධනය

දේශීය හා ජාත්‍යන්තර අභියෝග රැසක් මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය, 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කරන ලද සියයට 5.1 ක වර්ධනයට සාපේක්ෂව, 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 3.8 කින් වර්ධනය වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, පතල් හා කැණීම්, මූල්‍ය සේවා, රක්ෂණ කටයුතු, රෙදිපිළි සහ නිමි ඇඳුම් සහ මිරිදිය හා කරදිය ධීවර කර්මාන්ත කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවිය. මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළ ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන, ජලය සැපයීම සහ සෞඛ්‍යමය සේවාවන් යනාදී කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කරයි. මේ අතර, 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී කර්මාන්ත සහ සේවා අංශයන් පිළිවෙළින් සියයට 6.3 කින් සහ සියයට 3.5 කින් වර්ධනය විය. ඇතැම් ආර්ථිකමය කටයුතු වල වර්ධනයක් පෙන්නුම් කළද, දළ දේශීය නිෂ්පාදනය විය. එකතු කළ අගය සහිත කෘෂිකාර්මික කටයුතු 2016 වර්ෂයේ අනුරූප කාර්තුවේ දී වාර්තා කරන ලද සියයට 0.2 ක සෘණාත්මක වර්ධනයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 3.2 කින් සංකෝචනය වී ඇත. කෘෂිකාර්මික අංශයේ වර්ධනය මන්දගාමී වීම සඳහා වී, ධාන්‍ය, පොල්, තේ, රබර්, සීනි සහ එළවළු යනාදී එකතු කළ අගය සහිත නිෂ්පාදන අංශයන් සංකෝචනය වීම හේතු වූ අතර මේ සඳහා අයහපත් කාලගුණික තත්ත්වයන් ප්‍රධාන වශයෙන් බලපා ඇත. කෙසේ වුවද, මිරිදිය සහ කරදිය ධීවර කර්මාන්තය, වනවගා වෙනත් ක්ෂේත්‍ර බෝග, කුළුබඩු හා පානීය බෝග සහ පළතුරු වගාව යනාදී අංශයන් කෘෂිකාර්මික අංශයේ වර්ධනයට දායක වී ඇත. වී නිෂ්පාදනය 2015/16 මහ කන්නයේ වාර්තා කරන ලද මෙ.ටො. මිලියන 2.9 ට සාපේක්ෂව 2016/17 මහ කන්නයේදී මෙ.ටො. මිලියන 1.4 දක්වා සියයට 51.1 කින් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති


රූපසටහන 1.1 : දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය වර්ධනය




පහළ යාම කෙරෙහි කෘෂිකාර්මික අංශයේ සිදුවූ සංකෝචනය මූලික වශයෙන් හේතු වී ඇත. ඇතැම් ප්‍රදේශ වල පැවති දිගුකාලීන නියං තත්ත්වයන් සහ රටෙහි තෙත් කලාපය ආශ්‍රිතව සිදු වූ ගංවතුර සහ නායයෑම් දේශීය එකතු කළ අගය සහිත කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය කෙරෙහි අහිතකරව බලපා ඇත.

2017 වර්ෂයේ පළමු කාර්තුවේදී කෘෂිකාර්මික, කර්මාන්ත, සේවා සහ නිෂ්පාදන මත වන සහනාධාර අඩු කරන ලද බදු යනාදී අංශ පිළිවෙළින් ද.දේ.නිෂ්පාදිතයට සියයට 7.2 කින්, සියයට 32.2 කින්, සියයට 55.9 කින් සහ සියයට 4.7 කින් දායක අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් දිගුකාලීන නියං තත්ත්වයන් සමඟින් වගා කළ හැකි භූමි ප්‍රමාණය අඩු වීම හේතු වී ඇත. මේ අතර, කව්පි, කුරක්කන්, රටකජු යනාදියෙන් සමන්විත ධාන්‍ය උප අංශය 2016 අනුරූප කාර්තුවේදී වාර්තා කරන ලද සියයට 5.6 ක ධනාත්මක වර්ධනයට සාපේක්ෂව 2017 පළමු කාර්තුවේදී සියයට 15.1 කින් සංකෝචනය විය. තේ සහ රබර් නිෂ්පාදනය සැපයුම් සහ ඉල්ලුම් සාධක හේතුකොටගෙන සැලකිය යුතු ලෙස පහළ යන ලදී. තේ නිෂ්පාදනය, තේ වගා කරන ප්‍රදේශයන්හි පැවති දිගුකාලීන නියං තත්ත්වයන්, ගෝලීය වෙළෙඳ භාණ්ඩ වල මිල පහළ යාම සහ තේ අපනයනය කරන ඇතැම්

**රූපසටහන 1.2 :පවත්නා මිල අනුව ද.දේ.නි. ආංශික සංයුතිය - පළමු කාර්තුව 2017**




රටවල පවතින භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් 2016 වර්ෂයේ අනුරූප කාර්තුවේදී වාර්තා කරන ලද කිලෝ මිලියන 70.4 ට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේ දී කින් කිලෝ මිලියන 66.2 ක් දක්වා සියයට 6.1 අඩුවිය.

2016 වර්ෂයේ අනුරූප කාර්තුවේ දී කිලෝවට රු. 426.67 ක් ලෙස වාර්තා වූ කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සාමාන්‍ය මිල සැපයුම් හිඟ තත්ත්වයන් හේතුවෙන් 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී රු. 643.79 දක්වා සියයට 50.9 කින් ඉහළ යන ලදී. මේ අතර, 2016 වර්ෂයේ පළමු කාර්තුවේදී කිලෝ මිලියන 28.2 ක් වූ රබර් නිෂ්පාදනය අදාල කාලපරිච්ඡේදය තුළදී කිලෝ මිලියන 23.3 ක් දක්වා සියයට 17.2 කින් පහත ගොස් ඇත. රබර් නිෂ්පාදනය පහළ යාම කෙරෙහි රබර් කිරි කපනු ලබන දින ගණන් අඩුවීම සහ ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීම හේතු වී ඇත. කොළඹ රබර් වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන් පහළ ගොස් ඇත. 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී කොළඹ රබර් වෙන්දේසියේ දුම් ගැසූ දාර ෂීට් රබර් (RSSI) කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 250 ක් දක්වා සියයට 10.3 කින් පහළ යන ලදී. පොල් වගාකරන ප්‍රදේශයන්හි පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී පොල් නිෂ්පාදනය පොල්ගෙඩි මිලියන 683.6 ක් දක්වා සියයට 6.5 කින් පහත වැටුණි. එළවළු සහ සීනි යනාදී උප අංශයන් අදාල කාලපරිච්ඡේදය තුළදී පිළිවෙළින් සියයට 3.2 කින් සහ සියයට 11 කින් සංකෝචනය විය.

2017 වර්ෂයේ පළමු කාර්තුවේදී ධීවර අංශය නැවත එහි වර්ධන ගම්‍යතාවය අත්කර ගන්නා ලදී. එකතු කළ අගය සහිත මිරිදිය සහ කරදිය ධීවර කර්මාන්තය 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සිදු වූ සංකෝචනයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී පිළිවෙළින් සියයට 5.8 කින් සහ සියයට 21.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ජලාශ වෙත මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම ඉහළ යාම මිරිදිය ධීවර කර්මාන්තයේ හිතකර වර්ධනය සඳහා හේතු වී ඇති අතර යුරෝපා සංගමය විසින් මත්ස්‍ය අපනයන මත පනවා තිබූ තහනම ඉවත් කිරීමෙන් පසු ශ්‍රී ලාංකීය මුහුදු ආහාර සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම කරදිය ධීවර කර්මාන්තය පුළුල් වීම සඳහා දායක වී ඇත. මේ අතර, එකතු කළ අගය සහිත සත්ත්ව නිෂ්පාදන උප අංශය අදාල කාලපරිච්ඡේදය තුළදී සියයට 6.9 කින් ඉහළ ගොස් ඇති අතර මේ සඳහා දේශීය කිරි නිෂ්පාදනය සහ කුකුළු පාලනය යනාදී අංශ ඉහළ නැංවීමට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් හේතුවිය.

එකතු කළ අගය සහිත කර්මාන්ත අංශය 2016 වර්ෂයේ සමාන කාර්තුවේදී වාර්තා කළ සියයට 9.1 ට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 6.3 කින් වර්ධනය වී ඇත. කර්මාන්ත අංශයේ මෙම වර්ධනය සඳහා පතල් හා කැණීම්, ඉදිකිරීම්, රෙදිපිළි හා නිමි ඇඳුම්, කඩදාසි නිෂ්පාදන, ලෝහමය නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ නිෂ්පාදන, ජල සැපයීම සහ මලාපවාහන කටයුතු සහ කසල කළමනාකරණ යනාදී කර්මාන්ත කටයුතු ධනාත්මක බලපාන ලදී. ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කරන ලද සියයට 16.3 ක වර්ධනයට සාපේක්ෂව අදාල කාලපරිච්ඡේදයේදී සියයට 16.1 කින් වර්ධනය විය. කර්මාන්ත අංශයේ මෙම සුවිශේෂී වර්ධනය පිළිඹිබු කරමින් 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී දේශීය නිෂ්පාදනය සහ ආනයන ඇතුලත්ව සමස්ත සිමෙන්ති සැපයුම මෙ. ටො. මිලියන 2 දක්වා සියයට 6.4 කින් ඉහළ යන ලදී. 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළ වූ සියයට 0.9 ක සංකෝචනය යථා තත්ත්වයට පත් කරමින්, පතල් හා කැණීම් කටයුතු 2017 පළමු කාර්තුව තුළදී සියයට 17.9 කින් වර්ධනය වී ඇත. මෙම අංශය නැවත යථා තත්ත්වයට පත්වීම, ඛනිජ ද්‍රව්‍ය අපනයන සහ අනෙකුත් යන උප අංශය 2017 පළමු කාර්තුවේදී ඇ.ඩො. මිලියන 11.9 ක් දක්වා සියයට 4.2 කින් ඉහළ යාම මගින් පෙන්නුම් කරනු ඇත. එකතුකළ අගය

සහිත රෙදිපිළි හා නිමි ඇඳුම් අංශය සමස්ත කාර්මික අපනයන වලට ඉහළම දායකත්වය ලබා දුන්නද, අදාල කාලපරිච්ඡේදයේදී සියයට 0.6 කින් ආන්තික වශයෙන් වර්ධනය විය. කෙසේ වුවද, රෙදිපිළි හා නිමි ඇඳුම් අපනයනයෙන් ලද ආදායම 2016 වර්ෂයේ ඇ.ඩො. මිලියන 1,369.3 ක් වූ අතර 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී ඇ.ඩො. මිලියන 1,275.8 ක් දක්වා සියයට 6.8 කින් පහළ යන ලදී. මෙයට සමගාමීව, කාර්මික අපනයන වලින් ලද සමස්ත අපනයන ආදායම ඇ.ඩො. මිලියන 2,106.6 ක් දක්වා සියයට 2.7 කින් සංකෝචනය වූ අතර මේ සඳහා රෙදිපිළි, රබර් නිෂ්පාදන, ආහාර හා පාන වර්ග සහ ප්ලාස්ටික් නිෂ්පාදන යනාදියෙන් ලද අපනයන ආදායම අඩුවීම හේතු වී ඇත. එකතු කළ අගය සැලකු විට විදුලිය, ගෑස්, වායු සහ වායුසමීකරණ සැපයීම යන උප අංශය 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 0.3 ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, 2016 වර්ෂයේ පළමු කාර්තුවේදී ගිගාවොට් පැය 3,440 ක් වූ විදුලිබල උත්පාදනය 2017 වර්ෂයේ ජනවාරි-මාර්තු යන කාලපරිච්ඡේදය තුළදී ගිගාවොට් පැය 3,463 ක් දක්වා සියයට 0.7 කින් ආන්තික වශයෙන් වර්ධනය විය. ජල විදුලි බල උත්පාදනය ජලපෝෂක ප්‍රදේශයන්හි පැවති දිගුකාලීන නියං තත්ත්වයන් හේතුකොටගෙන අදාල කාලපරිච්ඡේදය තුළදී ගිගාවොට් පැය 347 ක් දක්වා සියයට 66.9 කින් පහළ යන ලදී.

ද.දේ.නිෂ්පාදනයට සියයට 55.9 ක දායකත්වයක් දරන සේවා අංශය එකතු කළ අගය මත වටිනාකම අනුව 2016 වර්ෂයේ අනුරූප කාර්තුවේදී වාර්තා කරන ලද සියයට 3.7 වර්ධනයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 3.5 කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කටයුතු, වෘත්තීමය සේවාවන් සහ රාජ්‍ය පරිපාලනය යනාදී උප අංශ හැරුණු විට අනෙකුත් බොහොමයක් සේවා අංශයට ඇතුලත් කටයුතු ධනාත්මකව බලපාන ලදී. සේවා අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා හා රක්ෂණ කටයුතු, තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, ආහාර හා පාන වර්ග සැපයීමේ සේවා සහ තැපැල් හා කුරියර් සේවාවන් හේතු වී ඇත. අදාල කාලපරිච්ඡේදයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල බදු වලට පෙර ලාභය ඉහළයාම පිළිඹිබු කරමින් මූල්‍ය සේවා කටයුතු එකතු කළ අගය මත වටිනාකම අනුව 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ සියයට 15.1 ක වර්ධනයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 14.9 කින් වර්ධනය විය. මේ අතර, අදාල කාලය තුළ රක්ෂණ කටයුතු සියයට 9.7 කින් වර්ධනය විය.

දේශීය ක්‍රියාකාරකම් ඉහළයාම සහ ආනයන ක්ෂේත්‍රය සැලකිය යුතු අන්දමින් වර්ධනය විම හේතුවෙන් 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේදී තොග හා සිල්ලර වෙළඳාම් උප අංශය එකතු කළ අගය මත වටිනාකම අනුව වාර්තා කරන ලද සියයට 3.2 ක වර්ධනයට සාපේකෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 4.5 කින් වර්ධනය වී ඇත. 2016 වර්ෂයේ ඇ.ඩො. මිලියන 2,739.2 ක් වූ සමස්ත අපනයන ආදායම අදාල කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො.මිලියන 2,774.3 ක් දක්වා සියයට 1.3 කින් ඉහළ ගොස් ඇති අතර, මේ සඳහා තේ, පොල්, කුළුබඩු සහ යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ අපනයනයෙන් ලද ආදායම ඉහළයාම හේතු වී ඇත. පාරිභෝගික සහ අන්තර් භාණ්ඩ අපනයනය ඉහළ යාම සමග 2016 වර්ෂයේ පළමු කාර්තුවේදී ඇ.ඩො.මිලියන 4,594.5 ක් වූ ආනයන වියදම 2017 වර්ෂයේ සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො.මිලියන 5,278.9 ක් දක්වා සියයට 14.9 කින් ඉහළ ගොස් ඇත.

2017 වර්ෂයේ පළමු කාර්තුවේදී ප්‍රවාහන සේවාවන් සියයට 3.1 කින් මධ්‍යස්ථ ලෙස ඉහළ යන ලදී. මෙය සලකා බලන කාලපරිච්ඡේදය තුළදී මෝටර් රථ ලියාපදිංචිය සියයට 6.4 කින් ඉහළ යාම මගින් පිළිඹිබු වේ. විදුලි සංදේශ සේවා උප අංශය එකතුකළ අගය මත වටිනාකම අනුව 2016 වර්ෂයේ අනුරූප කාර්තුවේදී වාර්තා කරන ලද සියයට 12 ක වර්ධනයට සාපේක්ෂව 2017 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 3.4 කින් වර්ධනය විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී තැපැල් හා කුරියර් සේවාවන්, නවාතැන් හා ආහාර පාන වර්ග සැපයීමේ සේවාවන් සහ දේපළ වෙළඳාම යනාදී අංශ පිළිවෙළින් සියයට 2.7 කින්, සියයට 3.7 කින් සහ සියයට 1.0 කින් වර්ධනය වී ඇත.

**1.1 වගුව : ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි. ආංශික සංයුතිය පළමු කාර්තුව - 2016 - 2017**

රු. මිලියන

| | අංශය | 2016 | 2017 (අ) | වර්ධනය (%) |
|---|---|---|---|---|
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **161,662** | **156,419** | **-3.2** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 4,104 | 3,483 | -15.1 |
| 2 | වී වගාව | 10,646 | 4,993 | -53.1 |
| 3 | එළවළු වගාව | 13,851 | 13,406 | -3.2 |
| 4 | උක් වගාව,දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික භෝග නොවන | 534 | 475 | -11.0 |

| | | | | රු. මිලියන |
|---|---|---|---|---|
| | අංශය | 2016 | 2017 (අ) | වර්ධනය (%) |
| 5 | පළතුරු වගාව | 14,260 | 14,539 | 2.0 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 18,884 | 16,966 | -10.2 |
| 7 | තේ වගාව | 15,411 | 14,534 | -5.7 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 338 | 341 | 0.9 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් ඖෂධීය පැලෑටි වගාව | 17,081 | 18,115 | 6.1 |
| 10 | රබර් වගාව | 8,214 | 6,800 | -17.2 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 4,042 | 4,481 | 10.9 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 12,625 | 13,498 | 6.9 |
| 13 | පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 2,399 | 2,556 | 6.5 |
| 14 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 10,682 | 11,679 | 9.3 |
| 15 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 26,625 | 28,162 | 5.8 |
| 16 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 1,967 | 2,390 | 21.5 |
| | **කර්මාන්ත** | **655,053** | **696,380** | **6.3** |
| 17 | පතල් හා කැණීම් කර්මාන්තය | 51,584 | 60,794 | 17.9 |
| 18 | ආහාර,බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 152,460 | 151,954 | -0.3 |
| 19 | රෙදිපිළි, නිමි ඇඳුම්,සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය | 97,119 | 97,736 | 0.6 |
| 20 | ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 9,023 | 8,833 | -2.1 |
| 21 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 9,831 | 10,557 | 7.4 |
| 22 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 13,569 | 11,463 | -15.5 |
| 23 | රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 19,355 | 19,337 | -0.1 |
| 24 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 11,608 | 11,579 | -0.2 |
| 25 | ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 16,573 | 19,801 | 19.5 |
| 26 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 10,975 | 11,578 | 5.5 |
| 27 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 11,485 | 13,579 | 18.2 |
| 28 | ගෘහභාණ්ඩ නිෂ්පාදනය | 29,242 | 30,357 | 3.8 |
| 29 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත,යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව සහ සවි කිරීම | 21,120 | 18,973 | -10.2 |
| 30 | විදුලිය ,ගෑස්,වායු හා වායු සමීකරණ සැපයීම | 22,501 | 22,441 | -0.3 |
| 31 | ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 2,816 | 3,424 | 21.6 |
| 32 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 5,996 | 6,793 | 13.3 |
| 33 | ඉදිකිරීම් කර්මාන්තය | 169,794 | 197,182 | 16.1 |
| | **සේවාවන්** | **1,167,216** | **1,207,523** | **3.5** |
| 34 | තොග හා සිල්ලර වෙළඳාම | 233,533 | 244,006 | 4.5 |
| 35 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 208,190 | 214,586 | 3.1 |
| 36 | තැපැල් හා කුරියර් සේවාවන් | 1,056 | 1,084 | 2.7 |
| 37 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 34,377 | 35,658 | 3.7 |
| 38 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 703 | 637 | -9.4 |
| 39 | විදුලි සංදේශ සේවාවන් | 9,281 | 9,593 | 3.4 |
| 40 | තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 3,133 | 3,223 | 2.9 |

| | | | | රු. මිලියන |
|---|---|---|---|---|
| | අංශය | 2016 | 2017 (අ) | වර්ධනය (%) |
| 41 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 110,424 | 126,836 | 14.9 |
| 42 | රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 15,152 | 16,628 | 9.7 |
| 43 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 127,798 | 129,137 | 1.0 |
| 44 | වෘත්තිමය සේවාවන් | 37,606 | 37,153 | -1.2 |
| 45 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව | 101,235 | 96,321 | -4.9 |
| 46 | අධ්‍යාපනය | 41,239 | 41,617 | 0.9 |
| 47 | සෞඛ්‍ය,නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 29,449 | 32,728 | 11.1 |
| 48 | වෙනත් පෞද්ගලික සේවාවන් | 214,040 | 218,315 | 2.0 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **1,983,930** | **2,060,322** | **3.9** |
| | (+) **භාණ්ඩ හා සේවා මත අය කරන බදු (-) සහනාධාර** | **98,614** | **101,448** | **2.9** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළඳපල මිල** | **2,082,544** | **2,161,770** | **3.8** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### 1.2 උද්ධමනය

ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) අනුව ගණනය කරනු ලබන උද්ධමනය 2017 අප්‍රේල් මස වාර්තා වූ සියයට 8.4 සිට 2017 වර්ෂයේ මැයි මස අවසානයේදී සියයට 7.1 ක් දක්වා අඩු වී ඇත. 2016 වර්ෂයේ මැයි මස උද්ධමනය සියයට 5.3 ක අගයක් වාර්තා කළ අතර පදනම් වර්ෂයේ බලපෑම පිළිඹිබු කරමින් එය 2017 වර්ෂයේ දී මැයි මසදී තවදුරටත් ඉහළ යන ලදී. 2017 වර්ෂයේ ජනවාරි මස උද්ධමනය සියයට 6.5 ක් වූ අතර එය එම වර්ෂයේ අප්‍රේල් මස වන විට සියයට 8.4 ක් දක්වා ඉහළ යන ලදී. අයහපත් කාලගුණික තත්ත්වය බදු සංශෝධනයන් හි බලපෑම සහ ජාත්‍යන්තර පාරිභෝගික භාණ්ඩ මිල ගණන් වල ඉහළ යාම මෙයට හේතු වී ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය පදනම් වර්ෂයේ බලපෑම හේතුවෙන් 2016 මැයි මස වාර්තා වූ සියයට 7.2 සිට 2017 වර්ෂයේ මැයි මස සියයට 4.7 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. කෙසේ වුවත්, ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් ගණනය කරනු ලබන මූලික උද්ධමනයේ වාර්ෂික සාමාන්‍ය 2016 මැයි මස වාර්තා වූ සියයට 5.0 සිට 2017 මැයි මස වන විට සියයට 6.4 දක්වා ඉහළ ගොස් ඇත.

මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.) මගින් ගණනය කරනු ලබන මතුපිට උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2016 වසරේ මැයි මස වාර්තා වූ සියයට 4.8 සිට 2017 වසරේ මැයි මස වන විට සියයට 6.0 දක්වා වැඩි වී ඇත. 2017 වසරේ මැයි මස දී කො.පා.මි. දර්ශකය මගින් ගණනය කරනු ලබන උද්ධමනය සඳහා ආහාර හා ආහාර නොවන අයිතමයන් මගින් සිදුකරන දායකත්වය පිළිවෙළින් සියයට 2.7 සහ සියයට 3.27 ක් විය. කො.පා.මි. දර්ශකය මගින් ගණනය කරනු ලබන උද්ධමනයේ වාර්ෂික සාමාන්‍ය 2016 මැයි මස වාර්තා වූ සියයට 2.7 සිට 2017 මැයි මස දී සියයට 5.4 දක්වා වැඩි වී ඇත. කෙසේ වුවත් ආහාර, බලශක්ති හා ප්‍රවාහන සේවා හැර අනෙකුත් භාණ්ඩ වල මිල ගණන් වෙනස්වීම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය 2016 මැයි මාසයේ වාර්තා කළ සියයට 5.6 ට සාපේක්ෂව 2017 වර්ෂයේ මැයි මාසයේ දී සියයට 5.2 දක්වා පහළ ගොස් ඇත. කො.පා.මි. දර්ශකය අනුව ගණනය කරනු ලබන වාර්ෂික ලක්ෂමය පදනම මත මූලික උද්ධමනය 2016 මැයි මාසයේ වාර්තා වූ සියයට 5.0 සිට 2017 මැයි මස දී සියයට 5.5 දක්වා වර්ධනය වී ඇත. ඉල්ලුම මගින් ඇතිවන පීඩනය ක්‍රමිකව කළමනාකරණය කිරීම හරහා උද්ධමනය තවදුරටත් මැදි තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂිතය.

වගුව 1.2 : උද්ධමනයේ විචලනය (%)

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/2007=100) | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය | | | | | |
| | | ලක්ෂ්‍යමය | වාර්ගික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ගික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ගික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ගික සාමාන්‍ය |
| 2016 | ජනවාරි | 1.7 | 2.1 | 3.6 | 4.9 | -0.7 | 2.9 | 3.0 | 4.3 |
| | පෙබරවාරි | 2.9 | 2.1 | 4.4 | 5.0 | 1.7 | 2.6 | 4.6 | 4.4 |
| | මාර්තු | 2.6 | 2.2 | 3.7 | 5.0 | 2.2 | 2.4 | 5.0 | 4.5 |
| | අප්‍රේල් | 3.4 | 2.4 | 3.5 | 4.9 | 4.3 | 2.6 | 5.9 | 4.7 |
| | මැයි | 4.8 | 2.7 | 5.6 | 5.0 | 5.3 | 2.7 | 7.2 | 5.0 |
| | ජූනි | 5.5 | 3.0 | 5.4 | 5.1 | 6.4 | 3.1 | 7.5 | 5.3 |
| | ජූලි | 5.8 | 3.4 | 5.0 | 5.1 | 5.8 | 3.4 | 6.8 | 5.5 |
| | අගෝස්තු | 4.4 | 3.7 | 3.8 | 4.9 | 4.5 | 3.6 | 6.0 | 5.6 |
| | සැප්තැම්බර් | 4.2 | 3.9 | 3.7 | 4.8 | 4.7 | 3.8 | 5.7 | 5.7 |
| | ඔක්තෝබර් | 4.1 | 4.0 | 3.8 | 4.6 | 5 | 4.0 | 5.7 | 5.7 |
| | නොවැම්බර් | 4.0 | 4.0 | 4.8 | 4.5 | 4.1 | 4.0 | 6.8 | 5.8 |
| | දෙසැම්බර | 4.5 | 4.0 | 5.8 | 4.4 | 4.2 | 4.0 | 6.7 | 5.9 |
| 2017 | ජනවාරි | 5.5 | 4.3 | 7.0 | 4.7 | 6.5 | 4.6 | 7.1 | 6.2 |
| | පෙබරවාරි | 6.8 | 4.6 | 7.1 | 5.0 | 8.2 | 5.1 | 7.1 | 6.4 |
| | මාර්තු | 7.3 | 5.0 | 7.3 | 5.3 | 8.6 | 5.6 | 7.0 | 6.6 |
| | අප්‍රේල් | 6.9 | 5.3 | 6.8 | 5.5 | 8.4 | 6.0 | 5.9 | 6.6 |
| | මැයි | 6.0 | 5.4 | 5.2 | 5.5 | 7.1 | 6.1 | 4.7 | 6.4 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
*ආහාර, බලශක්ති, සහ ප්‍රවාහනය හැර*

## 1.3 මුදල් හා ණය

2017 වර්ෂයේ පළමු මාස 04 තුළදී සංචිත මුදල් හා පුළුල් මුදල් සැපයුම මෙන්ම පෞද්ගලික අංශය සඳහා වූ ණය සැපයුම් ද වර්ධනය වී ඇත. 2017 වර්ෂයේ මාර්තු මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 25 කින් පිළිවෙළින් සියයට 7.25 සහ සියයට 8.75 දක්වා ඉහළ දැමීම මගින් මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, කෙටි කාලීන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එහි බලපෑම මූල්‍ය ආයතන වල ණය සහ තැන්පතු සඳහා වන පොලී අනුපාතික දක්වා ක්‍රමයෙන් සම්ප්‍රේෂණය විය. 2016 වර්ෂයේ අප්‍රේල් මස වාර්තා වූ සියයට 18.2 හා සැසඳීමේ දී 2017 වර්ෂයේ අප්‍රේල් මස දී ලක්ෂමය පදනම මත පුළුල් මුදල් සැපයුම් ($M_2b$) සියයට 20.1 කින් වර්ධනය වී ඇති අතර පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ණය ප්‍රසාරණය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙහිදී සංචිත මුදල් ලක්ෂමය පදනම මත 2017 අප්‍රේල් මස දී සියයට 16 කින් වර්ධනය වී ඇත. මේ අතර, 2017 අප්‍රේල් මස දී ලක්ෂමය පදනම මත ගණනය කරන ලද පෞද්ගලික අංශයේ ණය සියයට 20 කින් වර්ධනය වී ඇත. ආංශික වශයෙන් ණය ව්‍යාප්තිය සැලකීමේ දී කර්මාන්ත හා සේවා අංශයන්ගෙන් වැඩි ණය ප්‍රමාණයක් ආකර්ෂණය කරගත් අතර, පෞද්ගලික ණය ගැනීම් ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

වගුව 1.3 : මුදල් සහ පුද්ගලික අංශයට ලබාදුන් ණය

රු. බිලියන

| අයිතමය | 2016 | | | | 2017 | | | | 2017 අප්‍රේල් / 2016 අප්‍රේල් වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | |
| සංචිත මුදල් | 718.6 | 739.3 | 791.6 | 763.1 | 828.5 | 847.6 | 892.2 | 885.6 | **16.1** |
| පුළුල් මුදල් | 4,638.3 | 4,703.8 | 4,731.6 | 4,772.1 | 5,460.4 | 5,552.0 | 5,677.4 | 5,731.0 | **20.1** |
| පුද්ගලික අංශයට ලබාදුන් ණය | 3,493.1 | 3,546.8 | 3,634.6 | 3,662.0 | 4,222.3 | 4,293.2 | 4,375.2 | 4,394.0 | **20.0** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## 1.4 කොටස් වෙළඳපොළ

2017 වර්ෂයේ පළමු මාස පහක කාලය තුළ ශුද්ධ විදේශ ප්‍රාග්ධන ගලා ඒම් වැඩිවීම හේතුවෙන් කොටස් වෙළඳපොළ නැවත වර්ධනය වීමක් දක ගත හැකිය. සමස්ත කොටස් මිල දර්ශකය 2017 වර්ෂයේ මැයි මස අවසානයේ දී ඒකක 6,610 ක් දක්වා සියයට 1.4 කින් වර්ධනය විය. එමෙන්ම එස්.ඇන්ඩ් පී.එස්.එල් 20 දර්ශකය 2016 වර්ෂයේ මැයි මස අග භාගයේ දී වාර්තා වූ ඒකක 3,436 හා සැසඳීමේ දී 2017 වර්ෂයේ මැයි මස අග භාගය වන විට ඒකක 3,786 ක් දක්වා සියයට 10.2 කින් වර්ධනය විය. දෛනික පිරිවැටුමේ සාමාන්‍ය අගය පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රු. මිලියන 794 ට සාපේක්ෂව 2017 වර්ෂයේ මැයි මස අග වන විට රු. මිලියන 901 දක්වා සියයට 13.5 කින් වර්ධනය වී ඇත. මීට අමතරව, 2016 වර්ෂයේ අදාල කාලය තුළ වාර්තා වූ රු.ට්‍රිලියන 2.8 ක් වූ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2017 වර්ෂයේ මැයි මස අවසානයේ දී රු. ට්‍රිලියන 2.9 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය වී ඇත. මේ අතරතුර, සමුච්චිත විදේශ මිලදී ගැනීම් 2017 වර්ෂයේ මැයි මස අවසානයේ දී රු. බිලියන 50 ක් දක්වා සියයට 81 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්වීය. මෙහිදී කොටස් වෙළඳපොළ වෙත ලැබූ ශුද්ධ විදේශ ගලා ඒම් රු. බිලියන 19 ක් දක්වා වර්ධනය වීම පිළිඹිබු කරමින් විදේශ විකිණුම් 2017 මැයි මස අවසානයේ දී රු. බිලියන 32 ක් දක්වා සියයට 6 කින් පහළ ගොස් ඇත.

**වගුව 1.4 : ප්‍රාග්ධන වෙළඳපොල කාර්යසාධනය**

| දර්ශකය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | මැයි අග වන විට 2016 | මැයි අග වන විට 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| 'සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,074 | 5,643 | 5,913 | 7,299 | 6,895 | 6,228 | 6,516 | 6,610 |
| මිලංකා මිල දර්ශකය පී .එස්. එල් 20 දර්ශකය* | 5,229 | 3,085 | 3,264 | 4,089 | 3,626 | 3,496 | 3,436 | 3,786 |
| වෙළඳපොල ප්‍රාග්ධනීකරණය (රු.බිලියන) | 2,214 | 2,168 | 2,460 | 3,105 | 2,938 | 2,745 | 2,777 | 2,909 |
| වෙළඳපොල කටයුතු සිදුකරනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන | 272 | 287 | 289 | 294 | 294 | 295 | 294 | 296 |
| වාර්ෂික පිරිවැටුම (රු.බිලියන) | 546 | 214 | 200 | 341 | 253 | 177 | 76 | 89 |
| විදේශ විකිණුම් (රු.මිලියන) | 68,854 | 33,954 | 60,873 | 83,554 | 89,790 | 74,270 | 33,649 | 31,615 |
| විදේශ මිලදි ගැනිම් (රු.මිලියන) | 49,875 | 72,614 | 83,657 | 104,771 | 84,418 | 74,608 | 27,855 | 50,411 |
| ශුද්ධ මිලදි ගැනිම් (රු.මිලියන) | -18,979 | 38,660 | 22,784 | 21,217 | -5,372 | 338 | -5,794 | 18,796 |

*මූලාශ්‍රය : කොළඹ කොටස් වෙළෙඳපොල හා ශ්‍රී ලංකා මහ බැංකුව*
** 2012 ජුනි සිට මිලංකා මිල දර්ශකය වෙනුවට එස් ඇන්ඩ් පී .එස්. එල් 20 දර්ශකය ආදේශ කරන ලදී.**
*** පියවන ලද අරමුදල් හැර*

## 1.5 විදේශ අංශයේ ප්‍රවණතා

2017 වසරේ පළමු මාස හතර තුළදී සංචාරක ව්‍යාපාරය මගින් ලැබූ ආදායමෙහි වර්ධනයක් දකිය හැකි වුවද වෙළඳ හිගය වර්ධනය වීම සහ විදේශ ශ්‍රමික ප්‍රේෂණ අඩුවීම හමුවේ විදේශ අංශයේ කාර්යසාධනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2016 වසරේ පළමු මාස හතර තුළදී ඇ.ඩො.මිලියන 2,605.8 ක් වූ වෙළඳ හිගය හා සැසඳීමේදී අපනයන ආදායමෙහි මධ්‍යස්ථ වර්ධනයට සාපේක්ෂව ආනයන වියදම සැළකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන් 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී වෙළඳ හිගය ඇ.ඩො.මිලියන 3,313.8 ක් ලෙස සියයට 27.2 කින් වර්ධනය වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළදී අපනයන ආදායම ඇ.ඩො.මිලියන 3,569.0 ක් ලෙස සියයට 3.5 කින්ද ආනයන වියදම ඇ.ඩො.මිලියන 6,882.8 ක් ලෙස සියයට 13.7 කින්ද වර්ධනය වී ඇත. 2016 වසරේ මුල් මාස තුන තුළදී මැදපෙරදිග කලාපයේ පැවති අයහපත් ආර්ථික හා භූ දේශපාලනික තත්ත්වය හේතුවෙන් ඇ.ඩො.මිලියන 1,793.4 ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො.මිලියන 1,733.7 දක්වා සියයට 3.3 කින් අඩු වී ඇත. කෙසේවෙතත්, 2016 වසරේ පළමු මාස තුන තුළදී ඇ.ඩො.මිලියන 1,003.3 ක් වූ සංචාරක අංශයේ ඉපැයීම් 2017 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො.මිලියන 1,037.9 ලෙස සියයට 3.4 කින් වැඩි වී ඇත. මේ අතර, 2017 මාර්තු මස අග වන විට රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.1 කට සමාන වන පරිදි ඇ. ඩො. බිලියන 5.1 ක් වූ අතර සමස්ත සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි ඇ. ඩො. බිලියන 7.1 ක් විය.

### 1.5.1 අපනයන

2016 වසරේ මුල් මාස හතර තුළදී ඇ.ඩො. මිලියන 3,449.6 ක් වූ අපනයන ආදායම 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදි අන්තර්ජාතික වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් පහත වැටීම සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අපනයනය කරනු ලබන රටවල ආර්ථිකයන් මන්දගාමී ලෙස යථා තත්ත්වයට පත්වීම හමුවේ ඇ.ඩො. මිල 3,569.0 ක් ලෙස සියයට 3.5 කින් මධ්‍යස්ථව වර්ධනය වි ඇත. මේ සඳහා තේ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ කුළුබඩු අපනයන ආදායම ඉහළ යාම මෙම වර්ධනයට හේතු වි ඇත. 2016 වසරේ සළකා බලන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී අපනයනය කරන ලද තේ පරිමාව අඩු වුවද අන්තර්ජාතික වෙළඳපොළෙහි තේ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් 2017 වසරේ මුල් මාස හතර තුළදී තේ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 458.2 ක් ලෙස සියයට 12.8 කින් වැඩි වී ඇත. මේ අතර, 2016 වසරේ එම කාලපරිච්ඡේදය තුළදි වාර්තා වූ ඇ.ඩො. මිලියන 73.9 හා සැසඳීමේ දී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මගින් ලද අපනයන ආදායම 2017 වසරේ මුල් මාස තුන තුළදී ඇ.ඩො. මිලියන 101.8 ක් ලෙස සියයට 37.8 කින් වර්ධනය වී ඇත. 2016 වසරේ සළකා බලන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 60.9 හා සැසඳීමේ දී සැලකිය යුතු ලෙස කරාබු නැටි, කුරුඳු සහ ගම්මිරිස් අපනයන ධාරිතාවය වැඩිවීම හේතුවෙන් 2017 වසරේ මුල් මාස තුන තුළදී ඇ.ඩො. මිලියන 86.0 ක් ලෙස කුළුබඩු අපනයන ආදායම සියයට 41.1 කින් වැඩි වී ඇත. මීට අමතරව, 2016 වසරේ සළකා බලන කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 87.8 ක් ලෙස වාර්තා වූ පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම 2017 වසරේ පළමු මාස තුන තුළදී ඇ.ඩො. මිලියන 91.0 ක් දක්වා සියයට 3.6 කින් වැඩි වි ඇත. මේ අතර, 2016 වසරේ පළමු මාස හතර තුළදී ඇ.ඩො. මිලියන 92.3 ක් වූ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදි ඇ.ඩො. මිල 120.1 ක් ලෙස සියයට 30.1 කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, යුරෝපා කලාපය සහ ඇමරිකා එක්සත් ජනපදය වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් 2016 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ මුල් මාස හතර තුළදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඇ.ඩො. මිල මිලියන 1,626.3 ක් ලෙස සියයට 4.9 කින් අඩු වී ඇත. එමෙන්ම, 2017 වසරේ මුල් මාස තුන තුළදී රබර් ආශ්‍රිත නිෂ්පාදන, ආහාර හා පාන වර්ග හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම් පිළිවෙළින් සියයට 1.8 ක්, සියයට 17.5 ක් සහ සියයට 17.3 ක් බැගින් අඩු වී ඇත. ඇ.එ.ජ., එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය 2017 වසරේ පළමු මාස තුන තුළදී අපනයන සිදු කරනු ලැබූ ප්‍රධානතම රටවල් වූ අතර එය සමස්ත අපනයන ප්‍රමාණයෙන් සියයට 51 ක් පමණ විය.

වගුව 1.5 : විදේශ වෙළඳාම (ජනවාරි - අප්‍රේල්)

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2016 | 2017 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| **අපනයන** | **3,449.6** | **3,569.0** | **3.5** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 721.8 | 851.7 | 18.0 |
| තේ | 406.3 | 458.2 | 12.8 |
| ප්‍රාථමික නිෂ්පාදන (රබර් හා පොල් නිෂ්පාදන) | 127.4 | 134.7 | 5.7 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 188.1 | 258.8 | 37.6 |
| කාර්මික නිෂ්පාදන | 2,713.5 | 2,701.5 | -0.4 |
| රෙදිපිළි හාඇඟලුම් | 1,709.8 | 1,626.3 | -4.9 |
| ඛණිජතෙල් නිෂ්පාදන | 92.3 | 120.1 | 30.1 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 911.5 | 955.1 | 4.8 |
| ඛනිජ නිෂ්පාදන | 9.2 | 10.0 | 8.2 |
| අනෙකුත් | 5.1 | 5.9 | 15.7 |
| **ආනයන** | **6,055.4** | **6,882.8** | **13.7** |
| පාරිභෝගික භාණ්ඩ | 1,425.5 | 1,515.6 | 6.3 |
| ආහාරහාපාන වර්ග | 516.9 | 629.2 | 21.7 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 908.6 | 886.5 | -2.4 |

| | | ඇ. ඩො. මිලියන | |
|---|---|---|---|
| **අයිතමය** | **2016** | **2017 තාවකාලික** | **වර්ධනය (%)** |
| අතරමැදි භාණ්ඩ | 3,019.3 | 3,691.7 | 22.3 |
| බණිජතෙල් නිෂ්පාදන | 686.5 | 1,207.7 | 75.9 |
| පොහොර | 54.1 | 22.6 | -58.2 |
| රෙදිපිළි හාඇගලුම් | 896.8 | 860.6 | -4.0 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,381.9 | 1,600.7 | 15.8 |
| ආයෝජන භාණ්ඩ | 1,607.8 | 1,614.6 | 0.4 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 925.2 | 871.9 | -5.8 |
| ප්‍රවාහන උපකරණ | 195.1 | 215.1 | 10.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 485.3 | 524.1 | 8.0 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 2.2 | 3.4 | 53.8 |
| අනෙකුත් | 2.8 | 60.9 | 2059.2 |
| **වෙළඳ ශේෂය** | **(2,605.8)** | **(3,313.8)** | **27.2** |

*මූලාශ්‍ර : රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

### 1.5.2 ආනයන

ආනයන මත වියදම 2016 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා වූ ඇ.ඩො. මිලියන 6,055.4 හා සැසඳීමේදී 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 6,882.8 ක් ලෙස සියයට 13.7 කින් වැඩි වී ඇත. මීට ප්‍රධාන වශයෙන්, පිරිපහදු කරන ලද බණිජ තෙල්, ගල් අඟුරු ඇතුළු ඉන්ධන ආනයනය , රත්තරන් ආනයනය සහ සහල් ඇතුළු ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ආනයන සඳහා වූ වියදම් වැඩි වීම හේතු වී ඇත. තාප හා ගල් අඟුරු බල ශක්ති උත්පාදනය සඳහා පවතින ඉල්ලුම වැඩි වීම නිසා පිරිපහදු කරන ලද බණිජ තෙල් සහ ගල් අඟුරු ආනයන වියදම අධික වීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස තුන තුළදී ඉන්ධන ආනයන වියදම ඇ.ඩො. මිලියන 882.1 ක් ලෙස සියයට 81.6 කින් වැඩි වී ඇත. මීට අමතරව, 2016 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස තුන තුළදී දියමන්ති, රත්තරන් ඇතුළු වටිනා ගල් සහ ලෝහ වර්ග ආනයන වියදම ඇ.ඩො. මිලියන 175.1 දක්වා සියයට 116.5 කින් වැඩිවී ඇත. මේ අතර, දේශීය වෙළඳපලෙහි පැවැති සහල් හිඟය නිසා සහල් ආනයනය වැඩිකිරීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස තුන තුළදී සහල් ඇතුළු ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ආනයන වියදම ඇ.ඩො. මිලියන 103.4 ක් ලෙස සියයට 1,972.4 කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, 2016 වසරේ පළමු මාස තුන තුළදී ඇ.ඩො. මිලියන 231.6 ක් වූ වාහන ආනයන වියදම 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 191.9 ලෙස සියයට 17.2 කින් අඩු වී ඇත. 2016 වසරේ පළමු මාස හතර තුළදී ඇ.ඩො. මිලියන 896.8 ක් ලෙස වාර්තා වූ රෙදිපිළි ආශ්‍රිත ආනයන වියදම ද 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 860.6 ක් ලෙස සියයට 4.0 කින් අඩු වී ඇත. මීට අමතරව, ප්‍රධාන වශයෙන් විදුලි සංදේශ කර්මාන්තයට අදාළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයනය අඩුවීම හේතුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළදී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 871.9 ක් ලෙස සියයට 5.8 කින් අඩුවී ඇත. ඉන්දියාව, චීනය, අරාබි එක්සත් එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය 2017 වසරේ පළමු මාස තුන තුළදී ආනයන සිදු කරනු ලැබූ ප්‍රධානතම රටවල් වූ අතර එය සමස්ත ආනයන වලින් සියයට 59 ක් පමණ විය.

# 2 වන පරිච්ඡේදය

## ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා

### 2.1 සමාලෝචනය

2017 වර්ෂයේ ගෝලීය ආර්ථික දක්ම, සංවර්ධිත සහ නැඟී එන වෙළෙඳපොල ආර්ථිකයන්හි පවතින සුවිශේෂී ආර්ථික සංරචකයන්ගේ වර්ධනය සමඟින් ධනාත්මක තත්ත්වයක් පෙන්නුම් කර ඇත. 2016 වර්ෂයේ සියයට 3.1 ක් ලෙස පැවති ගෝලීය ආර්ථික වර්ධනය 2017 සහ 2018 යන වර්ෂ වලදී පිළිවෙළින් සියයට 3.5 කින් සහ සියයට 3.6 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කොට ඇත. මේ සඳහා ආයෝජන, වෙළඳාම සහ නිෂ්පාදන කර්මාන්ත යථා තත්ත්වයට පත්වීම අර්ධ වශයෙන් හේතු වී ඇත. 2016 වර්ෂයේ සියයට 1.7 ක් වූ සංවර්ධිත ආර්ථික වර්ධනය, 2017 වර්ෂයේ දී සියයට 2.0 ක පමණ මධ්‍යස්ථ මට්ටමකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ව්‍යාපාරික විශ්වාසය, ශ්‍රම වෙළෙඳපොළ ශක්තිමත් වීම සමඟින් පාරිභෝජනය ඉහළයාම හේතුකොට ගෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ කාර්යසාධනය වැඩිදියුණු වීම හේතු වී ඇත. මේ අතර, යුරෝ කලාපය යථා තත්ත්වයට පත්වීම මධ්‍යස්ථ මට්ටමක පවතින අතර, එය 2017 සහ 2018 යන වර්ෂ වලදී පිළිවෙළින් සියයට 1.7 කින් සහ සියයට 1.6 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කොට ඇති අතර, මේ සඳහා 2016 ජුනි මස එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත්වීම සම්බන්ධ ව පවත්වන ලද ජනමත විචාරණයේ ප්‍රතිඵලයක් ලෙස ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි වූ විචලනයන් ඉහළයාම හේතු වී ඇත. යුරෝ කලාපීය සමහරක් රටවල පවතින අක්‍රීය ණය ප්‍රමාණය ඉහළයාම හේතුකොට ගෙන එම කලාපය අවදානමකට ලක්ව ඇත. කෙසේ වුවද, ගෝලීය වෙළඳාම ශක්තිමත් වීම සමඟින් ආයෝජන ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් යුරෝ කලාපයේ නිෂ්පාදන කටයුතු සහ අපනයන වෙළඳාම වර්ධනය වී ඇත. 2016 වර්ෂයේ දී සියයට 1.0 ක් ලෙස පැවති ජපානයෙහි ආර්ථික වර්ධනය 2017 වර්ෂයේ දී සියයට 1.2 ක් දක්වා මධ්‍යස්ථ මට්ටමකින් වර්ධනය වීමට අපේක්ෂිත අතර, මේ සඳහා පාරිභෝජන බදු ඉහළ දැමීම ප්‍රමාද කිරීම සමඟින් ජපානයෙහි ආර්ථිකය නඟා සිටුවීමේ අරමුණ ඇතිව 2016 දී හඳුන්වා දෙනු ලැබූ ආර්ථික සංවර්ධනව වැඩපිළිවෙළ හේතු වී ඇත.

නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආර්ථිකමය කටයුතු ප්‍රශස්ත මට්ටමක පවතිනු ඇත. ගෝලීය ඉල්ලුම ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමත් සමඟ හැරුණු විට 2016 වර්ෂයේ සියයට 4.1 ක් වූ ආර්ථික වර්ධනය 2017 වර්ෂයේ දී සියයට 4.5 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම වෙළඳ භාණ්ඩ ආනයනික රටවල් වන නැගෙනහිර ආසියාතික පැසිපික් කලාපීය සහ දකුණු ආසියාතික රටවල ආර්ථික වර්ධනය ඉහළ මට්ටමක පවතින අතර, මේ සඳහා දේශීය ඉල්ලුම ශක්තිමත් වීම, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා වූ ආයෝජන ඉහළ යාම, සෘජු විදෙස් ආයෝජන මූලික කොටගත් ඉහළ තරඟකාරිත්වයක් පවතින නිෂ්පාදන කර්මාන්ත සහ සේවා යනාදී අංශයන් සඳහා සිදුකළ ආයෝජන සහ ඉහළ යන ගෝලීය ඉල්ලුම හේතු වී ඇත. ලෝක බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ලද "Global Economic Perspectives" හි දක්වා ඇති පරිදි අන්තර් කලාපීය වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවාහ ඉහළ යාම, නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආසියානු රටවල් වලට වාසිදායක වී ඇති අතර, එය තවදුරටත් චීනයෙහි එක සැපයුමක් එක මාවතක් " One Belt One Road" යන මූලාරම්භය සමඟින් ශක්තිමත් වනු ඇත.

මේ අතර, ආර්ජන්ටිනාව, බ්‍රසීලය සහ රුසියාව යනාදී වෙළඳ භාණ්ඩ අපනයනික ආර්ථිකයන් 2017 වර්ෂයේ දී සියයට 1.8 කින් සහ 2018-19 යන කාලය තුළ දී සාමාන්‍යයෙන් සියයට 2.8 කින් වර්ධනය වීමට අපේක්ෂිත අතර, මේ සඳහා ව්‍යාපාරික විශ්වාසය සහ වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම හේතු වී ඇත. චීනයේ 2017 සහ 2018 වර්ෂ සඳහා වූ ආර්ථික ඉලක්කයන් ණයෙහි වර්ධනය ළඟා කර ගැනීමට ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණයන් හා ණයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ඉන්දියාවේ ආර්ථික පෙර දක්ම ශ්‍රී ලංකාවට වැදගත් වනු ඇත. මධ්‍යකාලීන පුරෝකථනයන්ට අනුව, ඉන්දියාව ලෝකයේ වේගයෙන්ම වර්ධනය වන ආර්ථිකය ලෙස පවතින අතර, මේ සඳහා මුදල් සහ මූල්‍ය අංශයන්වල සිදු කරනු ලැබූ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණයන් සමඟින් වංචා දූෂණය මැඩලීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතු වී ඇත. ඉන්දියාවේ ආර්ථික වර්ධනය 2017 සහ 2018 වර්ෂ සඳහා පිළිවෙළින් සියයට 7.2 ක් සහ සියයට 7.7 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, මෑතකදී සංසරණය වන්නා වූ මුදල් නෝට්ටු ආපසු ගැනීමට තීරණය කිරීම, ඉන්දීය ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ ඇති අතර එය පරිභෝජනය කෙරෙහි ආර්ථිකයන් සෘණාත්මකව බලපාන ලදී. ඉන්දුනීසියාව, පිලිපීනය සහ වියට්නාමය යනාදී රටවල් ප්‍රශස්ත මට්ටමක පවතින අතර, මැලේසියාව හා තායිලන්තය යන රටවල්වල ආර්ථික කටයුතු මධ්‍යස්ථ මට්ටමක පවතිනු ඇත.

2016 වර්ෂයේ දී පැවති ආර්ථික මන්දගාමී තත්ත්වයට පසුව, 2017 වර්ෂයේ දී අඩු ආදායම් රටවල් සියයට 4.7 ක පමණ ආර්ථික වර්ධනයක්

ලබා ගැනීමට අපේක්ෂිත අතර, මේ සඳහා වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම සහ සාර්ව ආර්ථික අසමතුලිතතාවයක් වළක්වාලීම සඳහා ගනු ලැබූ ගෝලීය වෙළඳ හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් හේතු වී ඇත. ලෝහවල මිල ගණන් ඉහළ යාම කොංගෝ රාජ්‍යය, ගිනියාව සහ නයිජර් යන ලෝහ අපනයනික රටවලට වාසිදායක වී ඇත. සම්පත් හිඟ අඩු ආදායම් බොහොමයක (ඉතියෝපියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, රුවන්ඩාව, සෙනගාල් සහ ටැන්සානියාව) සේවා අංශය පුළුල් වීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ආයෝජන සහ කෘෂිකාර්මික කටයුතු වැඩිදියුණු වීම එහි ආර්ථික වර්ධනය වේගවත් කිරිමට ඉවහල් වී ඇත. කෙසේ වුවද, ආරක්ෂාව සම්බන්ධයෙන් වූ තර්ජන තීව්‍ර විම, භූ දේශපාලනික අස්ථාවරත්වය, රටවල් අතර අරගලමය තත්ත්වයන් පැන නැගීම සහ අයහපත් කාලගුණික තත්ත්වයන් යනාදී ආර්ථිකමය නොවන කරුණු අඩු ආදායම් රටවල්වල ආර්ථික වර්ධනය කෙරෙහි තීව්‍ර ලෙස බලපෑම් එල්ල කරනු ඇත.

## 2.2. උද්ධමනය

සංවර්ධිත හා නැගී එන වෙළෙඳපොල මෙන්ම දියුණුවෙමින් පවතින ආර්ථිකයන්හි වෙළඳ භාණ්ඩ වල මිල ඉහළ යාම හේතුවෙන් 2017 වර්ෂයේදී ගෝලීය මතුපිට උද්ධමනය වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2017 වර්ෂයේදී නෝර්වේ හැර සියළු සංවර්ධිත ආර්ථිකයන්හි උද්ධමනය 2016 වර්ෂයට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂිතය. 2016 වර්ෂයේදී සංවර්ධිත ආර්ථිකයන්හි පාරිභෝගික මිල උද්ධමනය සියයට 0.8 ක් වූ අතර එය 2017 වර්ෂයේදී සියයට 2.0 දක්වා වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත. බලශක්ති මිල වැඩිවීම හේතුවෙන්, ඇ.එ.ජ.යේ වාර්ෂික උද්ධමනය 2016 වර්ෂයේදී පැවති සියයට 1.3 ක අගයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 2.7 දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂිතය. යුරෝ ආර්ථිකයන්හි උද්ධමනය 2016 වර්ෂයේදී සියයට 0.2 ක් ලෙස පැවති අතර බල ශක්ති හා ආහාර මිල ගණන් වල පදනම් වර්ෂයේ බලපෑම හේතුවෙන්එ ය 2017 වර්ෂයේදී සියයට 1.7 දක්වා වර්ධනය වනු ඇත. 2016 වර්ෂයේදී සියයට 0.6 ක්ව පැවති එක්සත් රාජධානියේ උද්ධමනය 2017 දී සියයට 2.5 දක්වා වැඩිවී ඇති අතර ස්ටර්ලින් පවුම අවප්‍රමාණ වීම හා බලශක්ති මිල වැඩිවීම හේතුවෙන් පාරිභෝජන වියදම අඩුවීම මේ සඳහා හේතු වී ඇත. බලශක්ති මිල වැඩිවීම ජපන් යෙන් අගය අවප්‍රමාණ වීම සහ 2017 දී වැටුප් සුළු වශයෙන් වැඩිවීම හේතුවෙන් ජපානයේ උද්ධමනය සියයට 1.0 ක සාමාන්‍ය අගයක් ගනු ඇතැයි අපේක්ෂිතය.

නැගී එන වෙළෙඳපොල සහ දියුණු වෙමින් පවතින ආර්ථික වල (ආර්ජන්ටිනාව සහ වෙනිසියුලාව හැර) උද්ධමනය 2016 දී සියයට 4.4 ක් ලෙස පැවති අතර, ප්‍රධාන වශයෙන් පාරිභෝජන භාණ්ඩ මිල වැඩිවීම හේතු කොට ගෙන 2017 වර්ෂයේ දී එය සියයට 4.7 දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂිතය. චීනයේ උද්ධමනය 2016 වර්ෂයේදී සියයට 2.0 ක් වූ අතර, නිෂ්පාදන මිල ගණන් ඉහළ යාම හා දේපල වෙළඳාම් ආයෝජන යථා තත්වයට පත්වීම හේතුවෙන් එය 2017 වර්ෂයේදී සියයට 2.4 දක්වා වැඩිවී ඇත. ඉන්දියාවේ උද්ධමනය 2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 4.8 ක් හා සියයට 5.1 ක් වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, මුදල් ඒකක අවප්‍රමාණ වීම සීමා කිරීමට ගත් ක්‍රියාමාර්ග හා මිල ඉහල යාම් පරිපාලනය කිරීම හේතුවෙන් බ්‍රසීලයේ හා රුසියාවේ උද්ධමනය තව දුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂිතය.

## 2.3 පොලී අනුපාතික

2017 සහ 2018 වර්ෂ වලදී සහ මාසික ඇ.එ.ජ.ඩොලර් තැන්පතු මත, ලන්ඩන් අන්තර් බැංකු ඒක්ෂණ පොලී අනුපාත (LIBOR) පිළිවෙලින් සියයට 1.7ක් සහ සියයට 2.8 ක සාමාන්‍ය අගයක පවතිනු ඇතැයි 2017 "ලෝක ආර්ථික දැක්ම" (WEO) වාර්තාව මගින් පුරෝකථනය කර ඇත. මේ අතර, ත්‍රෛමාසික යුරෝ තැන්පතු අනුපාත 2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් සියයට -0.3 ක හා සියයට -0.2 ක සාමාන්‍ය අගයක පවතිනු ඇත. එය මාසික ජපන් යෙන් තැන්පතු මත වන පොලී අනුපාතය 2017 හා 2018 සඳහා සියයට 0.0 ක් වනු ඇත.

## 2.4 විනිමය අනුපාත

පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ශක්තිමත් වීම හේතුවෙන් 2017 දී සංවර්ධිත ආර්ථිකයන් සහ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි විනිමය අනුපාත ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. ඇ.එ.ජ. මැතිවරණයෙන් පසුව සහ FED අනුපාත වැඩිවීමත් සමඟ ඇ.එ.ජ.ඩොලරය අධිප්‍රමාණ වීම ආරම්භ විය. විනිමය අනුපාත විචලනය පුළුල් වීමත් සමඟ 2016 අගෝස්තු සහ 2017 මාර්තු අග භාගය අතර කාලසීමාවේදී ඇ.එ.ජ.ඩොලරය - සියයට 3.5කින් පමණ ශක්තිමත් වූ අතර යුරෝ සහ විශේෂයෙන්ම ජපන් යෙන් අගය දුර්වල වී ඇත. විශේෂයෙන්ම තුර්කි ලීරා සහ මැක්සිකානු පෙසෝ ඇතුළුව, නැගී එන වෙළෙඳපොල කිහිපයක මුදල් ඒකක පසුගිය මාස කිහිපය තුල කැපී පෙනෙන ලෙස අඩුවී ඇත. නැගී එන වෙළෙඳපොල වල මුදල් ඒකක ඩොලරයට සාපේක්ෂව තීව්‍ර ලෙස අවප්‍රමාණ වීම නැගී එන වෙළෙඳපොල වල මූල්‍යමය නොවන ආයතන වල ඩොලර් මත පදනම් වූ ණය ඉහළ යාම සඳහා හේතුවී ඇත. කෙසේ වෙතත්, බණිජ තෙල්

මිල ගණන් ක්‍රමයෙන් යථා තත්වයට පත්වීමත් සමගම රුසියාව ඇතුළු පාරිභෝගික භාණ්ඩ අපනයනකරුවන්ගේ මුදල් ඒකක අධිප්‍රමාණ වී ඇත.

### 2.5 අයවැය හිඟය

ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගෝලීය රාජ්‍ය මූල්‍ය ශේෂයසාමාන්‍ය අගය 2016 වර්ෂයේදී සියයට 3.6 ක අගයක් වාර්තා කළ අතර, එය 2017 වර්ෂයේදී සියයට 3.4 දක්වා සියයට 0.2 කින් අඩුවී ඇත. එය 2018 වර්ෂයේදී තව-දුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂිතය. සංවර්ධිත ආර්ථිකයන් සහ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආර්ථික කටයුතු වර්ධනය වීමත්, වෙළඳ භාණ්ඩ වල මිල ක්‍රමයෙන් යථා තත්වයට පත් වීමත් ගෝලීය වෙළඳාම යථා තත්වයට පත්වීමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. සංවර්ධිත ආර්ථිකයන්හි ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟයේ සාමාන්‍ය අගය 2017 වර්ෂයේදී සියයට 2.7 දක්වා ආන්තිකව අඩු වී ඇති අතර එය 2018 වර්ෂයේදීද එම මට්ටමෙන් පවතිනු ඇතැයි අපේක්ෂිතය. කෙසේවෙතත්, 2016 වර්ෂයේ දී නැගී එන වෙළඳපොළ සහ මැදි ආදායම් ආර්ථිකයන්හි අයවැය හිඟය ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.8 ක් වූ අතර ඛණිජ තෙල් හා ලෝහ මිල ගණන් වැඩිවීම හේතුවෙන් සහ අයවැය හිඟය අඩු කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් එය 2017 වර්ෂයේදී සියයට 4.4 දක්වා සුළු වශයෙන් අඩුවී ඇත.

එමෙන්ම, මූල්‍ය තත්වය ක්‍රමයෙන් දෘඩවීමේ අපේක්ෂාව හේතුවෙන් අඩු ආදායම් සහිත දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් අයවැය හිඟයේ සාමාන්‍ය අගය සියයට 4.4 ක අගයක තවදුරටත් පැවතිනි.

### 2.6 රාජ්‍ය ණය

2016 වර්ෂයේ ගෝලීය ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 83.6 ක් වූ ගෝලීය රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වර්ෂයේදී සියයට 83.1 ක් දක්වා අඩු වී ඇත. සංවර්ධිත ආර්ථිකයන්හි 2016 වර්ෂයේදී, ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 107.6 ක් වූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වර්ෂයේදී සියයට 107.1 දක්වා ආන්තිකව අඩුවී ඇති අතර එය මධ්‍යකාලීනව ස්ථාවර වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේවෙතත්, නැගී එන වෙළඳපොළ සහ දියුණුවෙමින් පවතින ආර්ථිකයන්හි ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වර්ෂයේදී සහ 2018 වර්ෂයේදී පිළිවෙළින් සියයට 48.6 ක් සහ සියයට 49.8 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මන්දගාමී වර්ධනය, ඉහළ මූල්‍ය වියදම්, සහ විනිමය අනුපාත අවප්‍රමාණ වීම හේතුවෙන් මූල්‍ය තත්වය දුර්වල වීම මගින් නැගී එන වෙළෙඳපොළ සහ දියුණුවෙමින් පවතින ආර්ථිකයන්හි රාජ්‍ය ණය ද.දේ. නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වැඩිවී ඇත.

මේ අතර, අඩු ආදායම් සහිත දියුණුවෙමින් පවතින රටවල රාජ්‍ය ණය 2016 වර්ෂයේ දී ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට 40.4 ක් වූ අතර බදු ආදායම අඩුවීම, රාජ්‍ය ආයෝජන සහ පුනරාවර්ථන වියදම් වැඩි වීම්, ඉහළ පොලී වියදම් හේතුවෙන් මූල්‍ය හිඟය පුළුල් වීම වැනි හේතු නිසා එය 2017 වර්ෂයේ දී සියයට41.9 දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂිතය.

### 2.7 අන්තර්ජාතික වෙළඳාම

අන්තර්ජාතික වෙළඳාම 2016 දෙවන භාගයේ සිට ආපසු හැරවී ඇති අතර, එය 2017 පළමු කාර්තුව තුළ තවදුරටත් ශක්තිමත්ව පැවතුණි. කාර්මික ක්‍රියාකාරකම් ශක්තිමත්වීම, සංවර්ධිත ආර්ථික වල ආයෝජන වර්ධනය වීම, චීනය වෙත සහ ඉන් පිටතට සිදුවන වෙළඳ ප්‍රවාහ වර්ධනය වීම සහ වෙළඳ භාණ්ඩ අපනයනය කරනු ලබන නැගී එන වෙළඳපොළ හා දියුණුවෙමින් පවතින ආර්ථික වලදු ර්වල ආනයන ඉල්ලුම අඩුවීම 2017 වර්ෂයේ වෙළඳාම වර්ධනය වීම යථා තත්වයට පත්වීම කෙරෙහි හේතු වනු ඇත. ලෝක වෙළඳ ධාරිතාව පෙර වර්ෂයේදී සියයට 1.3 ක සුළු වර්ධනයක් පෙන්වා ඇති අතර එය 2017 වර්ෂයේදී සියයට 2.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. 2018 වර්ෂයේදී වෙළඳ වර්ධනය සියයට 2.1 හා සියයට 40% අතර වනු ඇතැයි ලෝක වෙළඳ සංවිධානය (WTO) මගින් පුරෝකථනය කර ඇත. ලෝක වෙළඳ සංවිධානයේ මෑත කාලීන ප්‍රකාශනයන්ට අනුව 2017 වර්ෂයේදී සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන ආර්ථිකවල අපනයන වර්ධනය පිළිවෙළින් සියයට 2.8 ක් හා සියයට 2.2 ක් වනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන රට වලආනයනය 2017 වර්ෂයේදී පිළිවෙළින් සියයට 3.0 ක් හා සියයට 2.2 ක්වනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, විශේෂයෙන් ප්‍රධාන සංවර්ධිත ආර්ථික වල පාරිභෝගික වියදම් තීව්‍ර ලෙස වැඩිවීම හා ගෝලීය භාණ්ඩ වෙළඳාම ශක්තිමත්වීම හේතුවෙන් සේවා වෙළඳාම වර්ෂය තුළ ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 2.8 භාණ්ඩ මිල

2017 වර්ෂයේදී භාණ්ඩ මිල ගණන් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. ඇතැම් ඔපෙක් හා ඔපෙක් නොවන නිෂ්පාදකයින් එකඟ වූ පරිදි 2016 නොවැම්බර් මාසයේදී නිෂ්පාදන අඩු කිරීම හේතුවෙන් 2017 වර්ෂයේ මුල් කාලයේදී ඛණිජ තෙල් නිෂ්පාදනය අඩුවිය. කෙසේ වෙතත්, තීව්‍ර ඵලදායීතා වර්ධනය හේතුවෙන් ඇ.එ.ජ. ඛණිජ තෙල් නිෂ්පාදනය

බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා වැඩිවීම මගින් මෙම ඛණිජ තෙල් නිෂ්පාදනය අඩුවීම යාමනය වී ඇත. කෙසේ වෙතත්, 2016 වර්ෂයේදීබොර තෙල් මිලෙහි සාමාන්‍ය අගය බැරලයට ඇ.ඩො 43 ක් වූ අතර 2017 වර්ෂයේදී එය බැරලයට ඇ.ඩො. 55 ක අගයක් ගනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම වැඩි වීම කෙරෙහි ඛණිජ තෙල් ඉල්ලුම වැඩිවීම සහ සංචිත පහළ බැසීම මෙන්ම ඔපෙක් හා ඔපෙක් නොවන නිෂ්පාදකයන් විසින් නිෂ්පාදනය සීමා කිරීම 2018 මාර්තු දක්වා දීර්ඝ කිරීමද හේතු වී ඇත. කෘෂිකාර්මික මිල ගණන් 2017 වර්ෂයේදී හා 2018 වර්ෂයේදී ස්ථාවරව පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ " WEO 2017 "වාර්ථාවට අනුව, නැගෙනහිර ආසියාතික හා දකුණු ඇමෙරිකානු සැපයුම සීමාවීමත් සමඟ ඛණිජ තෙල් හා ලෝහ මිල ගණන් සියයට 3 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. බටහිර අප්‍රිකාවෙන් කරනු ලබන කොකාකෝලා සැපයුම ඉහළ යාමත් සමඟ 2017 වර්ෂයේදී පාන වර්ග වල මිල සියයට 6 කින් පහළ යනු ඇතැයි අපේක්ෂිත. ස්වාභාවික රබර් සැපයුම පහළ යෑම හේතුවෙන් අමුද්‍රව්‍ය මිල ගණන් සියයට 4 කින් වැඩි වනු ඇත. පොහොර මිල ගණන් සියයට 1 කින් වැඩි වනු ඇත. චීනයේ ඉල්ලුම ඉහළ යාම හා බොහෝ ලෝහ වර්ග සඳහා වෙළෙඳපොළ පටුවීම හේතුවෙන් 2017 වර්ෂයේදී ලෝහ මිල ගණන් සියයට 16 දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂිතය.

# 3 පරිච්ඡේදය

## රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

### 3.1 සමාලෝචනය

මධ්‍යකාලීනව අයවැය හිඟය අඩු මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වෙමින් ආදායම පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය 2017 වසරේ පළමු මාස හතර තුළදී රජය විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 2016 වසරේ ළඟා කරගත් පරිදි අයවැය හිඟය තිරසාර මට්ටමකට නැවත ගෙන ඒම උදෙසා වූ රජයේ ප්‍රබල කැපවීමත් සමඟින් 2017 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී මුළු ආදායම රු.බිලියන 589.7 ක් දක්වා සියයට 24.6 කින් කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර එය 2016 වසරේ අදාල කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 472.7 ක් විය. එමෙන්ම සමාලෝචිත කාලපරිච්ඡේදයේදී බදු නොවන ආදායම රු. බිලියන 35 ක් දක්වා සියයට 10.3කින් වැඩි වූ අතර එය 2016 වසරේ අදාල කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 31 ක් විය. මෙම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය 2017 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය මූල්‍ය අවකාශය සාපේක්ෂව පුළුල් කර ගැනීම සඳහා උපකාරී වූ අතර රාජ්‍ය ආයෝජන සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යෙදවීමට රජයට හැකි විය. 2017 වසරේ පළමු මාස හතර තුළදී රාජ්‍ය ආයෝජන රු.බිලියන 201 ක් වූ අතර එය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක වාර්තා වූ රු. බිලියන 152 ට සාපේක්ෂව සියයට 32.3 කින් වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මුළු වියදම රු. බිලියන 822.8 ක් දක්වා සියයට 16.5 කින් වර්ධනය විය.

බදු පරිපාලනය ශක්තිමත් කිරීම, බදු නිදහස් කිරීම් තාර්කීකරණය කිරීම, බදු පද්ධතිය සරල කිරීම හා බදු පදනම පුළුල් කිරීම තුළින් රජයේ ආදායම වැඩි කිරීම සඳහා බදු ප්‍රතිසංස්කරණ කීපයක් සිදු කරන ලදී. මෙම එකතු කළ අගය මත බදු (එ.අ.බ.) අනුපාතය සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කිරීම, එ.අ.බ. ගෙවීම සඳහා ලියාපදිංචි විය යුතු බදු බැඳියාවට යටත් සීමාව අඩු කිරීම සහ බදු නිදහස් කිරීම් කිහිපයක් ඉවත් කිරීම තුළින් එ.අ.බ පදනම පුළුල් කිරීම, ජාතිය ගොඩනැගීමේ බද්ද (ජ.ගො.බ.)ගෙ විය යුතු බදු බැඳියාවට යටත්වන සීමාව අඩුකිරීම, ආර්ථික සේවා ගාස්තු අනුපාතය වැඩි කිරීම, මෝටර් වාහන සඳහා අදාල වන ඒකක අගය මත නිෂ්පාදන බද්ද වැඩිකිරීමත් සමඟින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS), ශ්‍රී ලංකා රේගුවේ තනි කවුළුවකින් සේවා සැපයීම (Single Window System) සහ මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) ක්‍රියාත්මක කිරීම තුළින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම මෙම බදු ප්‍රතිසංස්කරණ සඳහා ඇතුලත් වේ. මීට අමතරව රජයේ බදු ආදායම එකතුව වැඩිකිරීමට උපකාරී වන ලෙස බදු නීතිය සරල කිරීමට නව දේශීය ආදායම් පනතක් දැනටමත් කෙටුම්පත් කර ඇත.

දේශීය කටයුතු වැඩිවීමත් සමඟින් රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලයක් වශයෙන් 2017 පළමු මාස හතර සඳහා වක්‍ර බදු තුලින් ලද ආදායම ඉහළ අගයක් අත් කර ගන්නා ලදී. 2017 පළමු මාස හතර සඳහා දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ජේදයක් සමඟ සැසඳීමේ දී රු. මිලියන 177,153 ක් දක්වා සියයට 32.3 කින් කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර ආනයන මත පදනම් වු බදු ආදායම රු. මිලියන 277,927 ක් දක්වා සියයට 22.5 කින් වැඩි විය. 2017 පළමු මාස හතර තුළදී දේශීය ක්‍රියාකාරකම් මත එ.අ.බ. තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ජේදයකට සාපේක්ෂව සැසඳීමේ දී රු.මිලියන 96,811 ක් දක්වා සියයට 88.6 කින් වැඩි වූ අතර ආනයන මත එ.අ.බ. ආදායම රු.මිලියන 55,759 ක් දක්වා සියයට 95.1 කින් වර්ධනය විය. එ.අ.බ. අනුපාතය සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කිරීම සමඟින් එ.අ.බ. ගෙවිය යුතු බද්දට යටත් සීමාව වසරකට රු.මිලියන 12 ක් දක්වා ද තොග සහ සිල්ලර වෙළදාම සඳහා වු එ.අ.බ. ගෙවිය යුතු පිරිවැටුමට අදාළව බද්දට යටත් සීමාව කාර්තුවකට රු. මිලියන 100 සිට රු. මිලියන 12.5 දක්වා ද අඩු කිරීමෙන් එකතුකළ අගය මත බදු පදනම පුළුල් කිරීම සඳහා හේතු විය. ජාතිය ගොඩනැගීමේ බද්ද ලියාපදිංචිය සඳහා බද්දට යටත් සීමාව වසරකට මිලියන 15 සිට වසරකට මිලියන 12 දක්වා අඩු කිරිමට ගත් ප්‍රතිපත්තිමය තීරණය පෙන්නුම් කරමින් දේශීය ක්‍රියාකාරකම් මත ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු. බිලියන 16,644 ක් දක්වා සියයට 55.3කින් වැඩි විය. ඒ අතර සමාලෝචන කාලපරිච්ඡේදය තුළ ආනයන ක්‍රියාකාරකම් ජාතිය ගොඩනැගීමේ බද්ද රු. මිලියන 6,119 ක් දක්වා සියයට 1.6කින් සුළු වශයෙන් වැඩි විය.

සමාලෝචිත කාල පරිච්ඡේදයේදි මත්පැන් හා සිගරට් මත නිෂ්පාදන බදු තුලින් ලද ආදායම පිළිවෙලින් සියයට 9.3ක් හා සියයට 17.1 කින් අඩු වු අතර මත්පැන් හා සිගරට් නිෂ්පාදනය මත නිෂ්පාදන බදු අනුපාතයේ වැඩි කිරීම නිසා පරිභෝජනය අඩුවීමත් සමඟින් නිෂ්පාදනය අඩුවීම මේ සඳහා හේතු විය. මෝටර් වාහන මත නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2016 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. මිලියන 59,433 ට සාපේක්ෂව 2017 වසරේ අදාල

කාලපරිච්ඡේදයේ දී රු. මිලියන 64,004 ක් දක්වා සියයට 7.7 කින් වැඩිවිය. විද්‍යුත් මෝටර් රථ හා යතුරු පැදි සඳහා ඒකක අගය මත නිෂ්පාදන බද්දක් හඳුන්වාදීමත්, බදු අනුපාතයන් ඉහළ දැමීමත් මෝටර් රථ ආනයනය සියයට 16.8කින් වැඩිවීමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර පෙට්‍රල් ආනයනය සියයට 43 කින් වැඩිවීමත් ඩීසල් /ගෑස් ඔයිල් ආනයනය සියයට 30 කින් වැඩිවීමක් පෙන්නුම් කරමින් 2017 පළමු මාස හතර සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාල පරිච්ඡේදයක් තුළ වාර්තා වූ රු. මිලියන 17,221 ට සාපේක්ෂව, රු. මිලියන 27,995 ක් දක්වා සියයට 62.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

ආනයන වැඩිවීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස හතර සඳහා වූ ගුවන් තොටුපළ හා වරාය සංවර්ධන බදු තුළින් ලද ආදායම රු. මිලියන 32,353 ක් වූ අතර, එය 2016 සමාන කාලපරිච්ඡේදයක වූ රු. මිලියන 27,406 කට සාපේක්ෂව, සියයට 18.1 ක වර්ධනයකි. සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය (Cess) බදු මගින් ලද ආදායම රු. මිලියන 20,214 ක් දක්වා සියයට 8.2 කින් වැඩි වූ අතර, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තුළින් ලද ආදායම රු. මිලියන 24,091 ක් දක්වා සියයට 14.1 කින් වැඩිවිය. දේශීය නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා උපකාරී වෙමින් තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල බදු අනුපාත සංශෝධනය කිරීම මේ සඳහා හේතුවිය. මේ අතර, 2017 වසරේ පළමු මාස හතර තුළ ආනයන බදු තුළින් ලද ආදායම රු. මිලියන 47,392 ක් දක්වා සියයට 2.2 කින් අඩුවිය.

**වගුව 3.1 : අයවැය සාරාංශය : (ජනවාරි - අප්‍රේල්)**

රු. මිලියන

| අයිතමය | 2016 | 2017 (තාවකාලික) |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **472,689** | **589,669** |
| ආදායම | 472,689 | 589,019 |
| බදු නොවන | 441,211 | 554,294 |
| බදු | 31,478 | 34,725 |
| ප්‍රදාන | - | 650 |
| **වියදම** | **706,133** | **822,840** |
| පුනරාවර්තන | 559,697 | 626,049 |
| පොළී ගෙවීම් | 196,676 | 243,499 |
| අනෙකුත් | 363,021 | 382,550 |
| රාජ්‍ය ආයෝජන | 151,978 | 201,012 |
| අනෙකුත් | -5,542 | -4,221 |
| **ආදායම් හිඟය (-) අතිරික්තය (+)** | **-87,008** | **-37,030** |
| **සමස්ත අයවැය හඟය (-) අතිරික්තය (+)** | **-233,444** | **-233,171** |
| **මූල්‍යනය** | **233,444** | **233,171** |
| විදේශීය මූල්‍යනය | -17,058 | 14,342 |
| ණය ගැනීම් | 42,400 | 75,000 |
| ණය ආපසු ගෙවීම් | -59,458 | -60,658 |
| දේශීය මූල්‍යනය | 250,502 | 218,829 |
| ණය ගැනීම් | 410,070 | 613,456 |
| ණය ආපසු ගෙවීම් | -159,568 | -394,627 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

සෘජු බදු සම්බන්ධයෙන් සැලකීමේ දී, බැංකු හා මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළෙඳාම සහ නිෂ්පාදන අංශවල වර්ධනය වීම පෙන්නුම් කරමින් 2017 වසරේ පළමු මාස හතර තුළදී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු තුළින් ලද ආදායම රු. මිලියන 34,643 ක් දක්වා සියයට 13.3 කින් වර්ධනය විය. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙහිම වැටුප් හා වේතන වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත

කාල පරිච්ඡේදයේ දී උපයන විට ගෙවීම් බදු තුළින් ලද ආදායම රු. මිලියන 12,274 ක් දක්වා සියයට 24.9 කින් වැඩිවිය. මේ අතර, ආර්ථික සේවා ගාස්තු අනුපාතය සියයට 0.25 සිට සියයට 0.5 දක්වා වැඩි කිරීම, ලාභ ලබන ව්‍යාපාර වෙත ලබා දී තිබූ බදු නිදහස ඉවත් කිරීම සහ භාණ්ඩ කිහිපයක් මත ආනයන අවස්ථාවේ දී ආර්ථික සේවා ගාස්තු පැනවීම හි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ආර්ථික සේවා ගාස්තු තුළින් ලද ආදායම රු. මිලියන 19,199 ක් දක්වා සියයට 564.4 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ නමුත්, 2017 වසරේ සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී පොලී මත බදු ආදායම රු. මිලියන 18,359 ක් දක්වා සියයට 14.8 කින් අඩුවිය.

මේ අතර, 2017 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම 2016 වසරේ සමාන පරිච්ඡේදයක වූ රු. මිලියන 31,478 ට සාපේක්ෂව රු. මිලියන 34,725 ක් දක්වා සියයට 10.3 කින් වැඩිවිය. මෙම වර්ධනය සඳහා කුලී, පොලිය, විකුණුම් හා ගාස්තු යන සමාජ රක්ෂණ දායක මුදල් ආවරණය කරමින් සියලුම බදු නොවන මූලාශ්‍ර දායක විය. මෙයට වෙනස් වූ එකම මූලාශ්‍රය ලෙස සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී සියයට 44.1 කින් අඩු වූ ලාභ හා ලාභාංශ ආදායම දැක්විය හැකිය.

2017 වසරේ මුල් මාස හතර තුළ රාජ්‍ය වියදම 2016 වසරේ සමාන කාල පරිච්ඡේදයක වාර්තා වූ රු. මිලියන 706,133 කට සාපේක්ෂව රු. මිලියන 822,840 ක් දක්වා සියයට 16.5 කින් වර්ධනය විය. මුළු වියදමෙන් සියයට 78.1 ක් වූ පුනරාවර්තන වියදම රු. මිලියන 626,049 ක් දක්වා සියයට 11.9 කින් වැඩි වූ අතර, සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී රාජ්‍ය ආයෝජන වන වියදම රු. මිලියන 201,012 ක් දක්වා සියයට 32.3 කින් වර්ධනය විය. 2017 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රජයේ අයවැය හිඟය 2016 වසරේ සමාන කාල පරිච්ඡේදයකදී වාර්තා වූ රු. මිලියන 233,444 ට සාපේක්ෂව රු. මිලියන 233,171 ක් දක්වා සියයට 0.1 කින් ආන්තිකව අඩු විය.

රාජ්‍ය ආයෝජන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් වියදම තාර්කීකරණය තුළින් රාජ්‍ය වියදම අඩු කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ශුන්‍ය පාදක අයවැය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය ඵලදායී නොවන වියදම් අඩු කිරීමට මග පාදනු ඇත. මීට අමතරව, කාර්තුමය වශයෙන් වියදම් හා ආදායම් සම්බන්ධ වගකීම රජයේ මුදල් ඵලදායී කළමනාකරණයකට උපකාරී වනු ඇත. මේ අතර, ප්‍රධාන රජය සතු වාණිජ ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා එම ආයතන මත ව්‍යුහාත්මක වෙනස්කම් කරනු ලබයි.

**වගුව 3.2 : ඇස්තමේන්තුගත සහ තත්‍ය ආදායම සහ වියදම - 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| මුළු ආදායම | **654.1** | **589.0** | **(65.1)** |
| බදු ආදායම | 580.6 | 554.3 | **(26.3)** |
| බදු නොවන ආදායම | 73.5 | 34.7 | **(38.8)** |
| මුළු වියදම | **820.0** | **822.8** | **2.8** |
| පුනරාවර්තන වියදම | 600.0 | 626.0 | **26.0** |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් | 220.0 | 196.8 | **(23.2)** |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## 3.2 රජයේ ආදායම

2016 වර්ෂයේ අනුරූප කාලසීමාව තුළ රු. මිලියන 472,689 ක් වූ රජයේ මුළු ආදායමේ නාමික අගය 2017 මුල් මාස හතර තුළ රු. මිලියන 589,017 දක්වා සියයට 24.6 කින් වැඩි වී ඇති අතර මෙම කාලසීමාව තුළ බදු ආදායම සහ බදු නොවන ආදායම වර්ධනය වීම මේ සඳහා හේතු වී ඇත. ආදායම් බදු, දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු සහ ආනයන මත පනවා ඇති බදු ආදායම් වල වර්ධනය හේතුවෙන් 2017 වර්ෂයේ මුල් මාස හතර තුළ බදු ආදායම 2016 වර්ෂයේ සමාන කාලසීමාව තුළ වූ රු. මිලියන 441,211 සිට රු.මිලියන 554,294 දක්වා සියයට 25.6 කින් වර්ධනය වී ඇත.

දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු ආදායම 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්ථා කළ රු. මිලියන 133,862 සිට රු. මිලියන 177,153 දක්වා සියයට 32.3 කින් වර්ධනය වී ඇති අතර මෙම කාලයේදී ආනයන මත පදනම් වූ බදු ආදායම 2016 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු.මිලියන 226,892 සිට රු.මිලියන 277,927 දක්වා සියයට 22.5 කින් වර්ධනය වී ඇත. මෙම ඉහළ වර්ධනය කෙරෙහි එකතු කළ අගය මත බදු (සියයට

90.9), ආදායම් බදු (සියයට 30.2), පෙට්‍රෝලියම් නිෂ්පාදන මත වන නිෂ්පාදන බදු (සියයට 62.6), වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු (සියයට 18.1) සහ ජාතිය ගොඩනැගීමේ බදු (සියයට 36) යන බදු වලින් ලද ඉහළ බදු ආදායම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. විශේෂයෙන්, ආර්ථික සේවා ගාස්තු අනුපාත සියයට 0.25 සිට සියයට 0.5 දක්වා වැඩි වීම, වසරකට රු.මිලියන 120 ක උපරිම සීමාව ඉවත් කිරීම සහ ලාභ ලබන ව්‍යාපාර ආර්ථික සේවා ගාස්තු සඳහා යටත් කිරීම හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු ආදායම 2017 මුල් මාස හතර තුළ රු. මිලියන 19,199 දක්වා සියයට 564.4 කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, 2017 වර්ෂයේ මුල් මාස හතර තුළ මධ්‍යසාර, දුම්කොළ සහ දුම්වැටි සඳහා වන නිෂ්පාදන බදු, තීරුබදු, සන්නිවේදන සේවා බදු, සහ රඳවා ගැනීමේ බදු ආදායම 2016 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වී ඇත.

මේ අතර, වෙළඳ ගාස්තු, සමාජ ආරක්ෂණ දායකත්ව සහ කුලී ආදායම් ඉහළ යාම හේතුවෙන් බදු නොවන ආදායම 2017 වර්ෂයේ මුල් මාස හතර තුළ රු. මිලියන 34,725 දක්වා සියයට 10.3 කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, රජය සතු ව්‍යාපාර (SOBEs) වල ලාභ සහ ලාභාංශ මගින් ලද ආදායම මෙම කාල පරිච්ඡේදය තුළ අඩු වී ඇත.

**වගුව 3.3 : ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම - 2017 ජනවාරි සිට අප්‍රේල්**

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත | තත්‍ය |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | |
| ආදායම් සහ ලාභ මත බදු | 102.7 | 84.5 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 75.0 | 96.8 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | 13.0 | 16.6 |
| **උප එකතුව** | **190.7** | **197.9** |
| රේගු දෙපාර්තමේන්තුව | | |
| ආනයන බදු | 55.0 | 47.4 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 50.0 | 55.8 |
| ජාතිය ගොඩනැගීමේ බදු -ආනයන | 7.0 | 6.1 |
| වරාය ගුවන්තොටුපොල සංවර්ධන බදු | 35.0 | 32.4 |
| සෙස් - ආනයන / අපනයන | 20.0 | 20.2 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ අනෙකුත් | 20.0 | 24.1 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 121.8 | 117.4 |
| දුම්වැටි මත නිෂ්පාදන බදු | 32.0 | 23.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 18.0 | 28.0 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 71.8 | 65.6 |
| **උප එකතුව** | **308.8** | **303.4** |
| සුරා බදු දෙපාර්තමේන්තුව | | |
| මත්පැන් | 55.0 | 38.3 |
| **උප එකතුව** | **55.0** | **38.3** |
| අනෙකුත් | | |
| විදුලි සංදේශ බද්ද | 15.0 | 11.6 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 7.0 | 3.1 |
| **උප එකතුව** | **22.0** | **14.7** |
| මුළු බදු ආදායම | **576.5** | **554.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*


වගුව 3.4 : රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය (ජනවාරි - අප්‍රේල්)

රු. මිලියන

| අයිතමය | 2016 | 2017 තාවකාලික | වර්ධනය % |
|---|---|---|---|
| **බදු ආදායම** | **441,211** | **554,294** | **25.6** |
| ආදායම් බදු | 64,857 | 84,475 | 30.2 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 133,862 | 177,153 | 32.3 |
| එකතු කළ අගය මත බදු | 51,342 | 96,811 | 88.6 |
| නිෂ්පාදන බදු | 71,804 | 63,698 | -11.3 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 10,716 | 16,644 | 55.3 |
| ආනයන මත පදනම් වූ බදු | 226,892 | 277,927 | 22.5 |
| රේගු බදු | 48,441 | 47,392 | -2.2 |
| එකතු කළ අගය මත බදු | 28,574 | 55,759 | 95.1 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 6,024 | 6,119 | 1.6 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 27,406 | 32,353 | 18.1 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 21,119 | 24,091 | 14.1 |
| නිෂ්පාදන බදු | 76,654 | 91,999 | 20.0 |
| සෙස් | 18,674 | 20,214 | 8.2 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 15,601 | 14,739 | -5.5 |
| **බදු නොවන ආදායම** | **31,478** | **34,725** | **10.3** |
| **මුළු ආදායම** | **472,689** | **589,019** | **24.6** |

*මූලාශ්‍රයට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**රූපසටහන 3.1: රජයේ ආදායම් කාර්යසාධනය (ජනවාරි-අප්‍රේල්, 2017)**



### ආදායම් බද්ද

අදායම් බදු මගින් සමස්ත ආදායම පසුගිය වසරේ අදාල කාලපරිච්ජේදයේ දී ලැබු රු. මිලියන 64,857 සමඟ සැසඳීමේ දි රු. මිලියන 84,475 ක් දක්වා සියයට 30.2 කින් වර්ධනය විය. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන අදායම් බදු මගින් ලද ආදායම 2016 වසරේ අදාල කාලපරිච්ජේදයේ දී ලැබු රු. මිලියන 30,582 සමඟ සැසඳීමේ දි රු. මිලියන 34,643 ක් දක්වා සියයට 13.3 කින් ඉහළ ගොස් ඇත. මෙම වර්ධනය සඳහා බැංකු හා මූල්‍ය සේවා, තොග වෙළඳාම සහ නිෂ්පාදන කර්මාන්ත අංශයන් දායක වී ඇත. උපයන විට ගෙවීම් බදු (PAYE) මගින් ලද ආදායම 2016 වසරේ සමාලෝචිත කාලපරිච්ජේදයේ දී ලැබු රු. මිලියන 9,828 ට සාපේක්ෂව රු. මිලියන 12,274 ක් දක්වා සියයට 24.9 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා රාජ්‍ය අංශය සහ පුද්ගලික අංශය යන දෙඅංශයෙහිම වැටුප් වේතන සහ වෘත්තීමය සේවා, බැංකු අංශය සහ සංචාරක අංශය වැනි ඉහළ ඉපයීම් ලබන අංශයන්හි රැකියා වැඩිවීම හේතු වී ඇත.

**වගුව 3.5 : ආදායම් බදු කාර්යසාධනය (ජනවාරි-අප්‍රේල්)**

රු. මිලියන

| බදු පදනම | 2016 | 2017 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 30,582 | 34,643 | 13.3 |
| උපයන විට ගෙවීම් | 9,828 | 12,274 | 24.9 |
| පොලී ආදායම මත බදු | 21,557 | 18,359 | -14.8 |
| ආර්ථික සේවා ගාස්තු | 2,890 | 19,199 | 564.3 |
| **එකතුව** | **64,857** | **84,475** | **30.2** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

ආර්ථක සේවා ගාස්තු (ESC) මගින් ලද ආදායම 2016 වසරේ අනුරූප කාලපරිච්ජේදයට සාපේක්ෂව 2017 වසරේ රු.මිලියන 19,199 ක් දක්වා සියයට 564.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වි ඇති අතර මේ සඳහා ලාභ ලබන ව්‍යාපාර සඳහා වු ආර්ථක සේවා ගාස්තු නිදහස ඉවත් කිරීම සහ ආර්ථක සේවා ගාස්තු අනුපාතය සියයට 0.25 සිට 0.50 දක්වා වැඩිකිරීමට හේතුවිය. කෙසේවුවද, පොලී ආදායම මත වි රඳවා ගැනිම් බද්ද මගින් ලද ආදායම රු. මිලියන 18,359 ක් දක්වා සියයට 14.8 කින් පහළ යන ලදි.

### එකතු කළ අගය මත බදු

2017 වර්ෂයේ මුල් මාස 4 තුළ එකතු කළ අගය මත බදු ආදායම 2016 වර්ෂයේ අනුරූප කාලය තුළ වූ රු.මිලියන 79,916 ට සාපේක්ෂව රු.මිලියන 152,570 දක්වා සියයට 90.9 ක කැපී පෙනෙන වර්ධනයක් ලබා ඇත. එකතු කළ අගය මත බදු අනුපාත සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි වීම, එ.අ. බදු සඳහා ලියාපදිංචි විය යුතු සීමාව අඩු කිරීම නිසා බදු පදනම පුළුල් වීම, බදු නිදහස් කිරීම් කිහියක් ඉවත් කිරීම, සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එ.අ. බදු බැඳියාව වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වි ඇත.

දේශීය කටයුතුබ වලින් එ.අ. බදු ආදායම 2016 වර්ෂය කාලයේ පැවති රු. මිලියන 51,342 ට සාපේක්ෂව 2017 වර්ෂයේ මුල් මාස 4 තුළ රු. මිලියන 96,811 දක්වා සියයට 88.6 කින් වර්ධනය වී ඇති අතර ආනයන මත වූ එ.අ. බදු ආදායම අනුරූප කාලයේ වාර්තා වූ රු. මිලියන 28,574 ට සාපේක්ෂව 2017 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රු. මිලියන 55,759 දක්වා සියයට 95.1 කින් වර්ධනය වි ඇත.

**වගුව 3.6 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය (ජනවාරි - අප්‍රේල්)**

රු. මිලියන

| බදු පදනම | 2016 | 2017 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 51,342 | 96,811 | 88.6 |
| ආනයන | 28,574 | 55,759 | 95.1 |
| දළ ආදායම | **79,916** | **152,570** | 90.9 |
| ආපසු ගෙවුම් | 123 | 199 | 61.9 |
| ශුද්ධ ආදායම | **79,793** | **152,371** | 91.0 |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.2 | 0.1 | |

*මූලාශ්‍රය ඵ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### නිෂ්පාදන බදු

නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාල පරිච්ඡේදයේ තුළ වාර්තා වූ රු. මිලියන 148,458 ට සාපේක්ෂව රු. මිලියන 155,697 ක් දක්වා සියයට 4.9 කින් 2017 වසරේ පළමු මාස හතර තුළ වර්ධනය වූ අතර, මෝටර් වාහන සහ ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම වැඩිවීම මීට හේතු විය. 2017 වසරේ මුල් මාස හතර තුළ ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක වාර්තා වූ රු. මිලියන 17,221 කට සාපේක්ෂව රු. මිලියන 27,995 ක් දක්වා සියයට 62.6 කින් කැපී පෙනෙන වර්ධනය විය. ආර්ථිකය තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ඉල්ලුම වැඩිවීමත් සමගින් පෙට්‍රල් ආනයන සියයට 43 කින් ද ඩීසල්/ ගෑස්, ඔයිල් ආනයන සියයට 30 කින් ද වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 3.7 : නිෂ්පාදන බදු/ සුරාබදු ආදායම් කාර්යසාධනය (ජනවාරි - අප්‍රේල්)**

රු. මිලියන


| බදු පදනම | 2016 | 2017 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 42,193 | 38,262 | -9.3 |
| දුම්වැටි හා දුම්කොළ | 28,764 | 23,840 | -17.1 |
| මෝටර් වාහන | 59,433 | 64,004 | 7.7 |
| ඛනිජ තෙල් | 17,221 | 27,995 | 62.6 |
| අනෙකුත් | 847 | 1,596 | 88.5 |
| **එකතුව** | **148,458** | **155,697** | **4.9** |

*මූලාශ්‍රය ඊ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

2017 වසරේ පළමු මාස හතර තුළ මෝටර් වාහන ආනයනය මගින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක වාර්තා වූ රු. මිලියන 59,433 කට සාපේක්ෂව රු. මිලියන 64,004 ක් දක්වා සියයට සියයට 7.7 කින් වර්ධනය විය. ඉහළ විමෝචක වාහන රට තුළම ආනයනය කිරීම අධෛර්යමත් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සමගින් සමාලෝචිත කාලය තුළ මෝටර් රථ සඳහා අදාල වන ඒකක අගය මත නිෂ්පාදන බද්ද වැඩි කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2017 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාහන ආනයන ප්‍රමාණය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක වාර්තා වූ 133,511 ට සාපේක්ෂව 155,942 ක් දක්වා සියයට 16.8 කින් වර්ධනය විය. යතුරුපැදි ආනයනය සියයට 40.6 කින් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, නිෂ්පාදන බදු අනුපාත වැඩිකිරීම හේතුවෙන් මෝටර් රථ ආනයන සියයට 13.8 කින් ද ත්‍රීරෝද රථ ආනයනය සියයට 69.2 කින් ද අඩුවිය.

කෙසේ නමුත්, 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය සඳහා මත්පැන් තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක් තුළ වූ රු. මිලියන 42,193 ට සාපේක්ෂව රු. මිලියන 38,262 ක් දක්වා සියයට 9.3 කින් වැඩි වූ අතර, සැර මත්පැන් නිෂ්පාදනය සියයට 7.3 කින් සහ ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සියයට 38.9 කින් අඩු වීම මේ සඳහා හේතු විය. එමෙන්ම, 2017 වසරේ පළමු මාස හතර තුළ සිගරට් සහ දුම්කොළ නිෂ්පාදනය තුළින් ලද ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයක වාර්තා වූ රු. මිලියන 28,764 ට

**රූපසටහන 3.2: නිෂ්පාදන බදු කාර්යසාධනය (ජනවාරි-අප්‍රේල් 2016 සහ 2017)**



සාපේක්ෂව රු. මිලියන 23,840 ක් දක්වා සියයට 17.1 කින් අඩුවිය. සිගරැට් මත බදු වැඩි කිරීමත් සමඟින් සිගරැට් නිෂ්පාදනය සියයට 31 කින් අඩු වීම මේ සඳහා හේතු විය.

### ආනයන බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

2016 වර්ෂයේ මුල් මාස හතර තුළදී රු. මිලියන 48,440 ක් වූ ආනයන බදු ආදායම 2017 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 47,392 ක් ලෙස සියයට 2.2 කින් අඩු වී ඇත.

2016 වර්ෂයේ මුල් මාස හතර තුළ රු. මිලියන 21,119 ක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම 2017 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 24,091 දක්වා සියයට 14.1 කින් වර්ධනය වී ඇත. විශේෂ වෙළෙඳ භාණ්ඩ ලේඛණය යටතේ ගැනෙන භාණ්ඩ සංඛ්‍යාව ඉහළ දැමීම සහ අර්තාපල්, ලොකු ළූණු, ළූණු, මුං ඇට සහ සීනි වැනි ද්‍රව්‍යයන්ගේ දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ දැමීම මෙම කාර්යය සාධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**වගුව 3.8 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම (ජනවාරි - අප්‍රේල්)**

ඒකකය: සංඛ්‍යාව

| අයිතමය | ආනයන | | | | නව ලියාපදිංචි කිරීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | වෙනස | වර්ධනය (%) | 2016 | 2017 | වෙනස | වර්ධනය (%) |
| මෝටර් රථ | 15,436 | 13,313 | (2,123) | (13.8) | 15,300 | 12,760 | (2,540) | (16.6) |
| ත්‍රී රෝද රථ | 13,345 | 4,112 | (9,233) | (69.2) | 14,555 | 7,546 | (7,009) | (48.2) |
| යතුරු පැදි | 88,198 | 123,999 | 35,801 | 40.6 | 99,006 | 113,225 | 14,219 | 14.4 |
| මගී ප්‍රවාහන රථ | 923 | 955 | 32 | 3.5 | 871 | 999 | 128 | 14.7 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 9,853 | 9,605 | (248) | (2.5) | 9,346 | 9,507 | 161 | 1.7 |
| ඉඩම් වාහන (ආ) | 5,756 | 3,958 | (1,798) | (31.2) | 4,103 | 4,398 | 295 | 7.2 |
| **එකතුව** | **133,511** | **155,942** | **22,431** | **16.8** | **143,181** | **148,435** | **5,254** | **3.7** |

*මූලාශ්‍ර : රේගු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*
*(අ) ලොරි රථ සහ අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන රථ*
*(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ අනෙකුත් ඉඩම් වාහන*

### ජාතිය ගොඩනැගීමේ බද්ද

2016 වර්ෂයේ මුල් මාස හතර තුළ රු. මිලියන 16,740 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2017 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 22,763 දක්වා සියයට 36.0 කින් වර්ධනය වී ඇත. ජාතිය ගොඩනැගීමේ බදු අයවීම සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සීමාව වාර්ෂිකව රු. මිලියන 15 සිට රු. මිලියන 12 දක්වා අඩු කිරීමේ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් 2017 වර්ෂයේ මුල් මාස හතර තුළදී දේශීය ක්‍රියාකාරකම් මත රැස් කරන ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු. මිලියන 16,644 දක්වා සියයට 55.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මේ අතර, 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 6,024 ක් වූ ආනයන මත ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2017 වර්ෂයේ පළමු මාස හතර තුළදී රු. මිලියන 6,119 දක්වා සියයට 1.6 කින් ආන්තිකව වැඩි වී ඇත.

මේ අතර, 2016 වසරේ මුල් මාස හතර තුළදී පළාත් සභා වෙත සමස්ත පැවරුම් රු. මිලියන 12,537 හා සැසඳීමේදී සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පළාත් සභා වෙත මාරු කිරීම් රු. මිලියන 15,546 ක් විය.

### වෙනත් බදු

2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ මුල් මාස හතර තුළදී වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද මගින් ලද බදු ආදායම රු. මිලියන 32,353 දක්වා සියයට 18.1 කින් වර්ධනය වී ඇත. 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 18,674 ක් වූ ආනයන හා අපනයන මත රැස් කරන ලද සමස්ත සෙස් බදු ආදායම 2017 වසරේ මුල් මාස හතර තුළදී රු. මිලියන 20,214 දක්වා සියයට 8.2 කින් වැඩි වී ඇත. තෝරා ගත් ආනයන හා අඩු එකතු කළ අගයක් සහිත අපනයන මත සෙස් බදු පැනවීම හේතුවෙන් මෙම මූලාශ්‍රයෙන් ලද බදු ආදායමේ වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාරී විය. තෝරා ගත් අංශයන්ගේ හා නිෂ්පාදිතයන්ගේ උන්නතිය උදෙසා මෙම බදු ආදායම මූලික වශයෙන් යොදා ගැනේ. කෙසේ වෙතත්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී රැස් කරන ලද විදුලි සංදේශ බදු ආදායම රු. මිලියන 11,616 ක් ලෙස සියයට 2 කින් අඩු වී ඇත.

වගුව 3.9 : පළාත් සභා වෙත ආදායම් මාරු කිරීම (ජනවාරි - අප්‍රේල් 2017)

රු. මිලියන

| මාසය | ජාතිය ගොඩනැගීමේ බද්ද | | මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | මුද්දර බද්ද | එකතුව |
|---|---|---|---|---|---|
| | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා රේගුව | | | |
| ජනවාරි | 2,210 | 783 | 186 | 1,538 | 4,717 |
| පෙබරවාරි | 1,556 | 716 | 138 | 197 | 2,607 |
| මාර්තු | 2,197 | 934 | 179 | 209 | 3,519 |
| අප්‍රේල් | 2,450 | 682 | 138 | 1,433 | 4,703 |
| **එකතුව** | **8,413** | **3,115** | **641** | **3,377** | **15,546** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**සටහන 3.1 : රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් ජනවාරි : 2017 - මැයි 2017**

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | **සුරාබදු** |
| 2017.01.01 | අංක 991 දරන සුරාබදු නිවේදනය (2016.12.09 දිනැති අංක 1996/52 දරන ගැසට් නිවේදනය) එතනෝල් ප්‍රවාහනයේදී සහ ගබඩා කිරීමේදී වාෂ්පවීම මගින් ඇතිවන පාඩුව සඳහා ලබා දී තිබූ දීමනාව අඩු කිරීම. |
| 2017.01.01 | අංක 992 දරන සුරාබදු නිවේදනය (2016.12.15 දිනැති අංක 1997/16 දරන ගැසට් නිවේදනය) වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම |
| 2017.01.01 | අංක 993 දරන සුරාබදු නිවේදනය (2016.12.20 දිනැති අංක 1998/6 දරන ගැසට් නිවේදනය) බෝතල් කල රා සඳහා ලීටරයකට රු.30 ක් ව පැවති සුරාබදු අනුපාතය ලීටරයකට රු.50 ක් දක්වා ඉහළ දැමීම' |
| 2017.01.01 | අංක 994 දරන සුරාබදු නිවේදනය (2016.12.20 දිනැති අංක 1998/7 දරන ගැසට් නිවේදනය) විදේශ මත්පැන් බලපත්‍ර සමග නිකුත් කරනු ලබන රු. 100,000 ක අරක්කු බලපත්‍ර ගාස්තුවක් හා බෝතල් කල රා සඳහා රු.50,000 බලපත්‍ර ගාස්තුවක් පැනවීම. |
| 2017.03.13 | අංක 995 දරන සුරාබදු නිවේදනය (2017.03.10 දිනැති අංක 2009/45 දරන ගැසට් නිවේදනය) විදේශීය මත්පැන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම |
| | **මුද්දර ගාස්තු** |
| 2017.02.21 | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2017.02.21 දිනැති 2007/24 දරන ගැසට් නිවේදනය) කුළී සින්නක්කර ගිවිසුම්, මූල්‍ය කල්බදු ගිවිසුම්, රක්ෂණ ඔප්පු ආදී මුද්දර ගාස්තු ගෙවීම සඳහා වගකීමට බැඳී ඇති මෝටර් රථ කාණ්ඩ විශේෂකොට දැක්වීම. |
| | **සෙස් බද්ද** |
| 2017.03.22 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (2017.03.21 දිනැති අංක 2011/9 දරන ගැසට් නිවේදනය) සලකුණු නොමැති නව ටයර් ආවරණ, තාපයෙන් මැඩීම, තාපයෙන් ඇදීම හෝ තෙරපීම හැර තව දුරටත් නොසැකසූ වානේ දඬු හා පොලු සහ රේඛීය අඩුසනත්වයෙන් යුතු පොලි එතනීල් සඳහා වූ සෙස් බද්ද ඉවත්කිරීම. |
| | **ආර්ථික සේවා ගාස්තුව (ESC)** |
| 2017.04.01 | 2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධිත පනත රථවාහන ආනයනය කරනු ලබන අවස්ථාවේදී අයකරනු ලබන ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම සහ ආර්ථික සේවා ගාස්තුවට යටත් සීමාව කාර්තුවකට රු.මිලියන 50 සිට කාර්තුවකට රු.මිලියන 12.5 දක්වා පහත දැමීම. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | **ආදායම් සංරක්ෂණ බදු** |
| 2017.01.07 | 1962 අංක 19 දරන අ යම් සංරක්ෂණ පනත (2017.01.06 දිනැති අංක 2000/86 දරන ගැසට් නිවේදනය) සහල් ප්‍රභේද සඳහා නව ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණයක් හඳුන්වා දීම. |
| 2017.02.01 | රේගු ආඥා පනත - ඩීසල් ලීටරයක් සඳහා රු. 3 ක රේගු බදු සහනයක් ලබා දීම ( ලීටරයක් සඳහා රු. 15 ක් වූ රේගු බද්දෙන්) සහ පෙට්‍රල් ලීටරයක් සඳහා රු. 10 ක රේගු බදු සහනයක් ලබාදීම. (ලීටරයක් සඳහා රු. 35 ක් වූ රේගු බද්දෙන්) |
| 2017.02.17 | 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත (2017.02.16 දිනැති අංක 2006/42 දරන ගැසට් නිවේදනය) වෙළඳාම් කටයුතු හා දේශීය කර්මාන්තකරුවන් සඳහා පහසුකම් සැලසීමට හඳුනාගත් රේගු සංකේතාංක සඳහා ආනයන තීරු බදු සංශෝධනය කිරීම. |
| 2017.03.15 | රේගු ආඥා පනත (2017.03.15 දිනැතිඅංක 2010/20 දරන ගැසට් නිවේදනය) නිෂ්පාදන සහ ඇඟලුම් අපනයන ව්‍යවසායයන් විසින් සහන පදනම යටතේ ආනයනය කරන ලද යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ක්ෂය කිරීමට අවශ්‍ය රේගු වටිනාකම් තීරණය කිරීමේ ක්‍රමවේදයක් නිර්දේශ කිරීම. |
| | **විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)** |
| 2017.01.07 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.01.06 දිනැති අංක 2000/85 දරන ගැසට් නිවේදනය) සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු) , නාඩු සහල් (රතු හෝ සුදු) සහ සම්බා සහල් (රතු හෝ සුදු) සඳහා කිලෝග්‍රෑමයකට රු. 15 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැනවීම. |
| 2017.01.19 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.01.18 දිනැති අංක 2002/29 දරන ගැසට් නිවේදනය) උම්බලකඩ, හාල් මැස්සන්, උඳු, මිරිස් කහ ආදි භාණ්ඩ වර්ග 9 සඳහා අය කල විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම සහ එළවළු තෙල සඳහා අය කල විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රු. 20 කින් පහත හෙළීම. |
| 2017.01.28 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.01.27 දිනැති අංක 2003/43 දරණ ගැසට් නිවේදනය) සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු සහල් (රතු හෝ සුදු) සහ සම්බා සහල් (රතු හෝ සුදු) සඳහා දින 30 ක කාලයක් බල පැවැත්වෙන පරිදි කිලෝ ග්‍රෑමයකට රු. 10 ක විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහනයක් ලබාදීම. |
| 2017.02.17 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.02.16 දිනැති අංක 2006/41 දරන ගැසට් නිවේදනය)- අර්තාපල් හා බී ළූණු සඳහා අයකල විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාල සීමාව මාස හයක් දක්වා දීර්ඝ කිරීම සහ රතු සහ කහ පරිප්පු සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රු. 5 කින් ඉහළ දැමීම. |
| 2017.02.24 | 2007 අංක48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.02.23 දිනැති අංක 2007/38 දරන ගැසට් නිවේදනය) - එළවළු තෙල් සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක 'සඳහා කිලෝග්‍රෑමයකට රු. 20 කින් අඩුකිරීම. |
| 2017.02.27 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.02.26 දිනැති අංක 2007/44 දරන ගැසට් නිවේදනය) සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා සහල '(රතු හෝ සුදු) සඳහා ලබාදුන් විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහනය දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කිරීම. |
| 2017.03.08 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත, (2017.03.07 දිනැති අංක 2009/05 දරන ගැසට් නිවේදනය) - මැකරල්, වටානා, කොණ්ඩ කඩල, කුරක්කන්, සුදු සීනි හැර සීනි ඇතුළු භාණ්ඩ වර්ග 6 ක් සඳහා පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාල සීමාව මාස 6 ක් දක්වා දීර්ඝ කිරීම. |
| 2017.03.28 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.03.28 දිනැති අංක 2012/16 දරන ගැසට් නිවේදනය) කැකුළු සහල්, නාඩු සහල් සහ සම්බා සහල් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝ ග්‍රෑමයකට රු. 10 ක විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහනයක් 28.03.2017 සිට 31.03.2017 දක්වා ලබාදීම. |
| 2017.04.01 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත, (2017.03.28 දිනැති අංක 2012/17 දරන ගැසට් නිවේදනය) සහල් සඳහා කිලෝග්‍රෑමයකට රු. 15 ක් වූ බද්ද රු.5 දක්වා දින 60 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි සංශෝධනය කිරීම. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2017.04.02 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.03.31 දිනැති අංක 2012/52 දරන ගැසට් නිවේදනය) කරවල,යෝගට්, බටර්, සුදුළූණු, දොඩම්, ඇපල්, ලූණු, කුරක්කන්, පිටි, ඇතුළු භාණ්ඩ වර්ග 12 ක් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2017.05.08 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත (2017.05.08 දිනැති අංක 2018/02 දරන ගැසට් නිවේදනය) මාළු, මුංඇට, මැංගුස්, වියලි දොඩම්, සහ කිවි ෆ්‍රැට් ආදී භාණ්ඩ වර්ග 09 ක් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |

## 3.3 රාජ්‍ය වියදම්

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 822.8 ක් වූ සමස්ත රාජ්‍ය වියදම 2016 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී සියයට 16.5 ක වැඩිවීමකි. එයින් රු.බිලියන 626 ක් පුනරාවර්තන වියදම් වූ අතර, මූලධන වියදම් හා ශුද්ධ ණයදීම් රු. බිලියන 196.8 ක් විය.

රාජ්‍ය සේවකයින්ගේ හා විශ්‍රාමිකයින්ගේ වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් හි වැඩිවීමක් පෙන්නුම් කරමින් පුනරාවර්තන වියදම සියයට 11.9 කින් ඉහළ ගොස් ඇති අතර, සමාලෝචන කාලසීමාව තුළදී රාජ්‍ය ආයෝජන සියයට 32.3 කින් ඉහළ ගොස් ඇත.

**වගුව 3.10 : රාජ්‍ය වියදම් : ජනවාරි – අප්‍රේල් 2017**

රු. මිලියන

| අයිතමය | 2016 | 2017 තාවකාලික |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **559,697** | **626,049** |
| වැටුප් හා වේතන | 188,604 | 197,518 |
| විශ්‍රාම වැටුප් | 56,008 | 59,186 |
| පොලී ගෙවීම් | 196,676 | 243,499 |
| වෙනත් | 118,409 | 125,846 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්** | **146,436** | **196,791** |
| **මුළු එකතුව** | **706,133** | **822,840** |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

### වැටුප් හා විශ්‍රාම වැටුප්

2016 වර්ෂයේ මෙම කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පළාත් සභා ඇතුළුව රාජ්‍ය සේවක වැටුප් හා වේතන 2017 වර්ෂයේ පළමු මාස හතර තුළදී රු. මිලියන 197,518 ක් දක්වා සියයට 5 කින් තරමක වර්ධනයක් වී ඇත.

2017 වර්ෂයේ පළමු මාස හතර සඳහා වන විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම රු. මිලියන 59,186 ක් වූ අතර, එය 2016 වර්ෂයේ එම කාලසීමාවට වඩා සියයට 6 ක වැඩිවීමකි.

### පොලී වියදම

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ පොලී ගෙවීම් වියදම රු. මිලියන 243,499 ක් වූ අතර, එය 2016 වර්ෂයේ එම කාලසීමාව තුල වැය කරන ලද රු.මිලියන 196,676 හා සැසඳීමේ දී සියයට 24 ක වැඩිවීමකි. මෙම මුළු වියදමින් රු. මිලියන 195,068 ක් දේශීය ණය සඳහා ද, ඉතිරි රු. මිලියන 48,431 ක් විදේශීය ණය සඳහා ද පොලී ගෙවීම් විය.

වගුව 3.11 : රජයේ සුරැකුම්පත් සඳහා වන ඵලදා අනුපාතික සහ විනිමය අනුපාතිකයේ හැසිරීම (%) 2016- 2017 ජූනි

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් | | | භාණ්ඩාගාර බැඳුම්කර | | | | මාසික සාමාන්‍ය විනිමය අනුපාතිකය (රු./ඇ.ඩො.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | අවු. 2 | අවු. 3 | අවු. 4 | අවු. 5 | |
| 2016 | ජනවාරි | 6.78 | 7.19 | 7.80 | - | - | - | - | 143.94 |
| | පෙබරවාරි | 7.14 | 8.07 | 8.50 | 10 | - | - | 11.42 | 143.93 |
| | මාර්තු | 8.90 | 9.76 | 10.64 | 11.75 | 11.75 | 12.78 | 13.00 | 143.96 |
| | අප්‍රේල් | 8.45 | 9.53 | 10.17 | - | 11.53 | 11.78 | - | 143.90 |
| | මැයි | 8.71 | 9.67 | 10.48 | 11.83 | 11.51 | 12.11 | 12.48 | 145.65 |
| | ජූනි | 8.88 | 9.86 | 10.55 | 11.42 | 11.58 | 11.93 | 11.89 | 145.28 |
| | ජූලි | 8.80 | 9.69 | 10.48 | 11.04 | 11.62 | - | 12.07 | 145.41 |
| | අගෝස්තු | 9.03 | 9.94 | 10.73 | - | - | - | 11.76 | 145.60 |
| | සැප්තැම්බර් | 8.55 | 9.39 | 10.11 | - | - | 10.61 | - | 145.78 |
| | ඔක්තෝම්බර් | 8.60 | 9.48 | 10.24 | - | - | - | - | 146.87 |
| | නොවැම්බර් | 8.60 | 9.55 | 10.10 | - | - | - | - | 147.77 |
| | දෙසැම්බර් | 8.72 | 9.63 | 10.17 | - | - | 11.94 | - | 148.88 |
| 2017 | ජනවාරි | 9.03 | 10.07 | 10.37 | - | - | - | 12.19 | 150.09 |
| | පෙබරවාරි | 9.32 | 10.19 | 10.58 | 12.10 | - | - | 12.89 | 150.82 |
| | මාර්තු | 9.63 | 10.62 | 10.98 | - | - | - | - | 151.43 |
| | අප්‍රේල් | 9.73 | 10.70 | 11.02 | - | - | - | - | 151.76 |
| | මැයි | 9.61 | 10.35 | 10.71 | 11.07 | - | - | 11.42 | 152.33 |
| | ජූනි * | 9.60 | 10.29 | 10.47 | - | - | - | - | 153.12 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*
** 2017 ජූනි 22 දිනට*

## සුභසාධන වියදම්

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ සුභසාධන හා සහනාධාර ගෙවීම් සඳහා වන වියදම පසුගිය වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී රු. මිලියන 37,309 සිට රු.මිලියන 38,976 දක්වා සියයට 4 කින් වැඩිවී ඇත. මෙම වැඩිවීම කෙරෙහි පහත ප්‍රධාන සුභසාධන වැඩසටහන් දායක වී ඇත.

- සමෘද්ධි සහනාධාර
- පාසල් පෙළපොත් සහ නිල ඇඳුම්
- වැඩිහිටි දීමනාව
- පොහොර සහනාධාරය
- ගැබිණි මව්වරුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වැඩසටහන (පෝෂණ මල්ල)
- වකුගඩු රෝගීන් සඳහා විශේෂ දීමනාව
- ගංවතුර හා නියං සහනාධාර

සමෘද්ධි මුදල් ආධාර, වැඩිහිටි දීමනාව, ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ දෙමව්පියන් සඳහා වන දීමනා සහ ගංවතුරින් හා නියඟයෙන් විපතට පත්වූ පවුල් සඳහා වන දීමනා වැනි සුභසාධන ආධාර වැඩසටහන් සඳහා වන වියදම රු. මිලියන 17,264 ක් ලෙස ගණනය කර ඇත. මෙම මුළු සුභසාධන වියදමින් රු. මිලියන 9,032 ක් මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ සේවක වන්දි වෙනුවෙන් 2017 වර්ෂයේ පළමු මාස හතර තුළ දරන ලද අතර, 2016 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී එය රු. මිලියන 8,622 ක් විය.

රජය විසින් 2017 වර්ෂයේ පළමු මාස හතර තුළදී පෝෂණ මල්ල, ත්‍රිපෝෂ වැඩසටහන, දියර කිරි හා පාසල් පෝෂණ වැඩසටහන් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 2,919 ක් වැය කර ඇත. මෙයින් ත්‍රිපෝෂ සහ පෝෂණ මල්ල වැඩසටහන්

සඳහා දරන ලද වියදම් පිළිවෙලින් රු. මිලියන 516 ක් සහ රු. මිලියන 1,258 ක් විය. මෙම කාලසීමාව තුලදී රු. මිලියන 2,472 ක වියදමින් පාසල් සිසුන් සඳහා නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, වාර ප්‍රවේශ පත්‍ර, නොමිලේ දහම් පාසල් පෙළපොත් හා ශිෂ්‍යාධාර ප්‍රතිලාභද ලබාදෙන ලදී. රජය විසින් රෝගීන් සඳහා බාධාවකින් තොරව නොමිලේ ඖෂධ ලබාදීමට 2017 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. මිලියන 11,318 ක වියදමක් දරා ඇත.

සමාලෝචන කාලසීමාව තුළදී රජය විසින් පොහොර සහනාධාර වැඩසටහන යටතේ වී ගොවීන් සහ අනෙකුත් කුඩා බෝග වගාකරුවන් සඳහා පොහොර ලබාගැනීමට මුදල් ප්‍රදාන ලබාදීම වෙනුවෙන් රු. මිලියන 7,762 ක වියදමක් දරා ඇත.

වගුව 3.12: **සුභසාධන වියදම්. 2017 ජනවාරි - අප්‍රේල්**

රු. මිලියන

| අයිතමය | 2016 ජනවාරි - අප්‍රේල් | 2017 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| **මවුවරුන් හා ළමුන්** | | |
| ත්‍රිපෝෂ වැඩසටහන සහ ළදරු කිරි සහනාධාර /පෝෂණ මල්ල | 1,753 | 1,913 |
| නොමිළයේ පෙළපොත් හා නිල ඇඳුම් | 2,570 | 2,041 |
| පාසල් වාර ප්‍රවේශ පත්‍ර | 1,263 | 245 |
| පාසල් පෝෂණ වැඩසටහන | 863 | 1,143 |
| **කෘෂිකර්මාන්තය** | | |
| පොහොර සහනාධාරය | 7,360 | 7,762 |
| **සුභසාධන ගෙවීම්** | | |
| සමෘද්ධි සහනාධාරය | 13,817 | 13,311 |
| ආබාධිත රණවිරු දීමනාව | 8,622 | 9,032 |
| වැඩිහිටි දීමනාව | 3,008 | 3,010 |
| ආබාධිත දීමනාව | 354 | 356 |
| ගංවතුර හා නියඟයට ගොදුරු වූ අයට ආහාර | 2 | 163 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## රාජ්‍ය ආයෝජන වියදම්

### (1) අධ්‍යාපනය

2017 වර්ෂයේ පළමු මාස හතර තුල දී සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, තෘතීය හා වෘත්තීය අධ්‍යාපනය, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ඇතුලත්ව අධ්‍යාපන අංශය සඳහා වන මුළු වියදම රු. මිලියන 38,810 ක් ලෙස ගණනය කරන ලදී. මෙය 2016 වර්ෂයේ පළමු මාස හතරට වඩා සියයට 20 ක වැඩිවීමකි.

### සාමාන්‍ය අධ්‍යාපනය:

2017 වර්ෂයේ පළමු මාස හතර සඳහා සාමාන්‍ය අධ්‍යාපනය වෙනුවෙන් දැරීමට සිදුවූ මුළු වියදම රු. මිලියන 23,043 ක් වන අතර, එයින් රු. මිලියන 15,927 ක් පුනරාවර්තන වියදම් සඳහාද, රු. මිලියන 7,116ක් මූලධන වියදම් සඳහාද විය.

සමාලෝචන කාලසීමාවට අදාළව 2016 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී සුබසාධන වැඩසටහන් සඳහා වන වියදම රු. මිලියන 3,237 ක් දක්වා සියයට 6 කින් අඩුවිය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ 2016 වර්ෂය සඳහා වන පාසල් පෙළපොත් මුද්‍රණය කිරීමට අදාළ බිල්පත් බොහෝ ප්‍රමාණයක් 2017 වර්ෂයේ පළමු කාර්තුවේ නිරවුල් කිරීම වෙනුවට 2016 වර්ෂයේදීම නිරවුල් කිරීමයි.

2016 වර්ෂයේ දී ආරම්භ කරන ලද "ළඟම පාසල හොඳම පාසල"(NSBS) වැඩසටහන සමාලෝචන කාලසීමාවේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2017 අප්‍රේල් මස අවසානය වනවිට මෙම NSBS වැඩසටහන සඳහා දරන ලද මුළු ආයෝජනය රු. මිලියන 5,464 ක් විය.

### උසස් අධ්‍යාපනය :

2017 වර්ෂයේ පළමු මාස හතර තුල දී උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් රු. මිලියන 12,646 ක් වියදම් කර ඇති අතර, එයින් රු. මිලියන 9,798 ක් සහ රු. මිලියන 2,848 ක් පිළිවෙලින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා විය.

2017 වර්ෂයේ අප්‍රේල් මස අවසානයේ දී විශ්වවිද්‍යාල දහයක (10) තාක්ෂණ පීඨ පිහිටුවීම සඳහා නව ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම වෙනුවෙන් රු.

මිලියන 255 ක් වියදම් දරා ඇත. 2017 වර්ෂයේ පළමු මාස හතර තුළදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් 3,379 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම වෙනුවෙන් ණය ලබාගෙන ඇති අතර, 2016 වර්ෂයේ සිට ලබාදුන් ණය සඳහා වන පොලී වියදම් දැරීම සඳහා මහජන බැංකුවට සහ ලංකා බැංකුවට රු.මිලියන 40 ක් ගෙවා ඇත. තාක්ෂණය වෙත පහසුවෙන් ප්‍රවේශවීමට හැකිවනු පිණිස සියළුම රජයේ විශ්වවිද්‍යාල සඳහා වයිෆයි (WiFi) සැපයුම්කරු ලෙස සී/ස.පැත් ඕඩියෝ (පුද්.) සමාගම තෝරාගෙන ඇති අතර, 2017 වර්ෂයේ අප්‍රේල් මස අවසානය වනවිට රජයේ විශ්වවිද්‍යාල හතරක් (04)WiFi පහසුකම් ලබාදීමට භාරගෙන ඇත.

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ දී නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ මුළු වියදම රු. මිලියන 2,085 ක් වූ අතර, එයින් රු. මිලියන 360 ක් මූලධන වියදම් විය. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරෙමින් පවතිනු ලබන ප්‍රධාන ව්‍යාපෘතීන් දෙකක් වන කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය පිහිටුවීම සහ නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන වෙනුවෙන් පළමු මාස හතර සඳහා දරන ලද මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. මිලියන 41.2 ක් හා රු. මිලියන 205 ක් විය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා 2017 වර්ෂයේ මුල් මාස හතර තුළදී දරන ලද මුළු වියදම රු. මිලියන 1,036 ක් වූ අතර, එයින් රු. මිලියන 473 ක් ප්‍රාග්ධන වියදම් සඳහා විය. මෙම කාලසීමාව තුළදී ක්‍රියාත්මක කෙරෙනු ලැබූ ප්‍රධාන ව්‍යාපෘතීන් තුනක් වන්නේ,(i) නැනෝ තාක්ෂණ වැඩසටහන (ii) ජාතික විද්‍යා මධ්‍යස්ථානය පිහිටුවීම (iii) දියවැඩියාව, ඩෙංගු සහ නිදන්ගත වකුගඩු රෝග හා පිළිකා පිළිබඳ පර්යේෂණ සඳහා සහාය වීම වේ.

2017 වර්ෂයේ පළමු මාස හතර තුළදී මෙම ව්‍යාපෘතීන් සඳහා වූ මුළු ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.මිලියන 63.75, රු. මිලියන 100 ක් සහ රු. මිලියන 92.79 ක් විය.

වගුව 3.13 : අධ්‍යාපන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල වියදම්

රු. මිලියන

| විස්තරය | 2016 ජනවාරි - අප්‍රේල් | 2017 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| **සාමාන්‍ය අධ්‍යාපනය** | | |
| පාසල් ගුරුවරු සහ වෙනත් සහාය මණ්ඩල පුද්ගල පඩිනඩි | 10,115 | 10,843 |
| සුභසාධන වැඩසටහන් | 3,463 | 3,237 |
| විභාග ඇගයීම් | 687 | 833 |
| පළාත් අධ්‍යාපනය | 39,800 | 40,214 |
| **උසස් අධ්‍යාපනය** | | |
| විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි | 7,440 | 8,004 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 339 | 199 |
| **තෘතීය සහ වෘත්තීය පුහුණු** | | |
| වෘත්තීය පුහුණු සහ වෙනත් සහාය මණ්ඩල වැටුප් | 1,327 | 1,365 |
| කාර්මික පුහුණු සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍ර සැපයීම | 3 | 6.5 |
| **විද්‍යා,තාක්ෂණ සහ පර්යේෂණ** | | |
| විද්‍යා, තාක්ෂණික සහ පර්යේෂණ ආයතන සහ වෙනත් මණ්ඩල සඳහා පුද්ගල පඩිනඩි | 407 | 424 |
| **රජයේ ආයෝජන වියදම** | | |
| **සාමාන්‍ය ජාතික අධ්‍යාපනය** | | |
| ප්‍රාථමික පාසල් සංවර්ධනය | 22 | 110 |
| ද්විතීක පාසල් සංවර්ධනය | 1,304 | 588 |
| විශේෂ අධ්‍යාපන සංවර්ධනය | 14 | 17 |
| ගුරු සංවර්ධනය | 132 | 405 |
| සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 53 | 5,821 |

රු. මිලියන

| විස්තරය | 2016 ජනවාරි - අප්‍රේල් | 2017 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| **පළාත්** | | |
| පළාත් අධ්‍යාපනය | 1,121 | 1,783 |
| **උසස් අධ්‍යාපන** | | |
| විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සංවර්ධනය | 3,147 | 1,180 |
| නේවාසිකාගාර සංකීර්ණ 8,460ක් ඉදිකිරීම | 755 | 1,272 |
| විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණික පීඨ පිහිටුවීම | - | 255 |
| ලැප්ටොප් පරිගණක සඳහා ණය පොලී (විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට) | 246 | 40 |
| ධීවර හා නාවුක විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය | - | 56 |
| අග්නිදිග විශ්වවිද්‍යාලයේ 1 බී අදියරේ සංවර්ධන සැලසුම | 98 | 45 |
| **තෘතීය සහ වෘත්තීය පුහුණු** | | |
| වෘත්තීය පුහුණු ආයතනයන් * | 40 | 65 |
| නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන | 196 | 206 |
| කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය පිහිටුවීම | 128 | 402 |
| **විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ** | | |
| විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ ආයතනයන් හා වෙනත් ප්‍රාග්ධන ආයෝජන | 95 | 473 |

*මූලාශ්‍රය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

** 2015 වර්ෂයේ සිට ප්‍රතිපත්ති සැලසුම් ආර්ථික කටයුතු, ළමා තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත තරුණ සංවර්ධන සංරචකය මාරුකර ඇති බැවින් තරුණ සේවා සභාවේ සහ ජාතික යොවුන් සේනාංකයේ වියදම් ඇතුළත් කර නැත.*

### (2) සෞඛ්‍යය

2017 වර්ෂයේ පළමු මාස 4 තුළදී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම පළාත් සහ මධ්‍යම රජයේ සෞඛ්‍යය සඳහා වන වියදම ආවරණය කරමින් 2016 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී රු. මිලියන 61,606 ක් දක්වා සියයට 4.7 කින් වැඩිවී ඇත. සෞඛ්‍යය සඳහා වන මුළු වියදමින් රු. මිලියන 52,993 ක් පුනරාවර්ථන වියදම් සඳහා වන අතර මූලධන ආයෝජනය රු. මිලියන 8,663 ක් විය.

වගුව 3.14 : **සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2016 ජනවාරි - අප්‍රේල් | 2017 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | 53,270 | 52,993 |
| සේවා සැපයීමේ වියදම | 24,132 | 25,773 |
| එයින්, වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 20,372 | 21,209 |
| වෛද්‍ය සැපයීම් | 13,138 | 11,325 |
| පළාත්සෞඛ්‍ය | 16,000 | 15,895 |
| **රාජ්‍ය ආයෝජන වියදම** | 5,572 | 8,663 |
| පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල සංවර්ධනය කිරීම | 23 | 53 |
| අපස්මාර ඒකකය - ජාතික රෝහල කොළඹ | 699 | 129 |

රු. මිලියන

| විස්තරය | 2016 ජනවාරි - අප්‍රේල් | 2017 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| හම්බන්තොට හා නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල සංවර්ධනය කිරීම | 1 | 3 |
| මහරගම ජාතික පිළිකායතනය සඳහා වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම (රසාවි ව්‍යාපෘතිය) | 15 | - |
| මාතෘවාට්ටුසංකීර්ණය - ශික්ෂණ රෝහල කුරුණෑගල | 21 | 95 |
| වතු අංශයේ රෝහල් සංවර්ධනය කිරීම | 31 | 23 |
| හදිසි අනතුරු සේවා ඒකකය සහ  වාට්ටු සංකීර්ණය ශික්ෂණ රෝහල - රාගම | 33 | 87 |
| හෙල්මට්කෝල් මාතෘ රෝහල ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය -ජර්මන් රජය) | 46 | 64 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබා දීම | 471 | - |
| වෙනත් මූලධන ආයෝජන | 3,238 | 6,453 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 994 | 1,757 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### (3) වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය

2017 වර්ෂයේ පළමු මාස 4 තුළදී වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණයට අදාළ සංවර්ධන කටයුතු වෙනුවෙන් රජය විසින් රු. මිලියන 15,195 ක් ආයෝජනය කර ඇත. එයින් රු. මිලියන 11,455 ක් වැය කර ඇත්තේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ නව ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම හා ඉදිකිරීම මගින් මහවැලි වාරිමාර්ග යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම වෙනුවෙනි. සමාලෝචන කාලසීමාව තුළ දී මොරගහකන්ද, කළුගඟ හා උමා ඔය ව්‍යාපෘති වැනි ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා දරන ලද වියදම රු.මිලියන 9,960 කි.

වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම සහ ජලාශ ඉදිකිරීම සඳහා වාරිමාර්ග හා ජලසම්පත් අමාත්‍යාංශය විසින් ඉතිරි රු. මිලියන 3,740 ආයෝජනය කර ඇත. 2017 වර්ෂයේ පළමු මාස හතර අවසාන වන විට සංවර්ධන කටයුතු සඳහා දරන ලද විශාලතම වියදම දැරීමට සිදුවූ යාන්ඔය ව්‍යාපෘතිය සියයට සියයක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරන ලදි.

### (4) කෘෂිකර්මය

ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වන විශේෂ වැඩසටහන් ඇතුලත්ව ප්‍රධාන සංවර්ධන කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් රු. මිලියන 7,860 ක මුළු ප්‍රතිපාදනයක් වෙන්කර ඇත. මෙම කටයුතු සඳහා 2017 වර්ෂයේ පළමු මාස පහ තුළදී දැරීමට සිදුවූ වියදම රු. මිලියන 1,284 කි. මෙම කාලසීමාව තුළදී කාබනික පොහොර නිෂ්පාදනය සහ කඩිනම් බීජ ගොවිපල සංවර්ධන වැඩසටහන ඇතුලත්ව මෙවැනි ක්‍රියාකාරකම් කිහිපයක ස්ථාවර මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

### (5) ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ ජල සම්පාදනය සහ සනීපාරක්ෂක කටයුතු සඳහා රජය රු. මිලියන 9,961 ක් ආයෝජනය කර ඇත. එයින් රු. මිලියන 9,121 ක් වියදම් කර ඇත්තේ මහා පරිමාණ ජලසම්පාදන හා සනීපාරක්ෂාව සම්බන්ධ ව්‍යාපෘති වන බදුල්ල, හාලිඇල හා ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, කොළඹ ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 01, කොළඹ ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 02, ලබුගම හා කලටුවාව ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම, මොණරාගල-බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, යාපනය කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, වියලි කලාපීය නාගරික ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, මහනුවර නගර අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය, කුරුණෑගල ජල සැපයුම් හා මලාපවාහන ව්‍යාපෘතිය, කතරගම පූජාභූමි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වේ. මෙයට අමතරව පිළිවෙලින් රු. මිලියන 742 ක්, රු. මිලියන 76 ක් සහ රු. මිලියන 22 ක් ජල සැපයුම් අංශයේ ප්‍රජා පහසුකම් ව්‍යාපෘති කුඩා හා මධ්‍යම ජල සැපයුම් යෝජනා ක්‍රම හා ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘති වැඩිදියුණු කිරීම සඳහා වැයකර ඇත.

**3.15 වගුව : ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව සඳහා වන වියදම්**

රු. මිලියන

| ව්‍යාපෘතිය | දේශීය අරමුදල් | භාණ්ඩාගාර බැඳුම්කර | විදේශීය අරමුදල් | මුළු වියදම |
|---|---|---|---|---|
| විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන මහා පරිමාණයේ ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති | 10 | 3,730 | 5,381 | 9,121 |
| ජලසම්පාදන අංශයේ ප්‍රජා පහසුකම් ව්‍යාපෘති | 172 | - | 570 | 742 |
| කුඩා නගර ජලසම්පාදන යෝජනා ක්‍රම | 76 | - | - | 76 |
| ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති වැඩිදියුණු කිරීම | 22 | - | - | 22 |
| **මුළු ආයෝජනය** | **280** | **3,730** | **5,951** | **9,961** |

*මූලාශ්‍රය: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය*

### (6) මහාමාර්ග සහ පාළම්

ජාතික මාර්ග හා පාලම් සංවර්ධන කටයුතු සඳහා මූලධන වියදම් ලෙස රජය විසින් 2017 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. මිලියන 36,226 ක් වැය කර ඇත. එයින් රු. මිලියන 9,400 ක් අධිවේගී මාර්ග සංවර්ධනය කිරීම සඳහා දැරීමට සිදුවී ඇති අතර, රු. මිලියන 5,532 ක් මහාමාර්ග සංවර්ධනය කිරීම සඳහා වැය විය. මේ අතර, රජය විසින් මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 4,939 ක්ද, පාළම් සහ ගුවන් පාළම් ඉදිකිරීම සඳහා රු. මිලියන 1,096 ක්ද, මඟ-නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා රු.මිලියන 238 ක්ද වැය කරන ලදී.

විදේශීය හා දේශීය ප්‍රභවයන්ගේ මූල්‍ය ආධාර මත මාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් හා නඩත්තු කිරීම් ව්‍යාපෘති කිහිපයක්ම අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒවා අතුරින් මධ්‍යම අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම, ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති, i-road ව්‍යාපෘති, නව කැළණි පාලම ව්‍යාපෘතිය සහ රාජගිරිය, පොල්ගහවෙල හා ගනේමුල්ල හි ගුවන් පාලම් 3 ක් ඉදිකිරීම සඳහා ජාතික ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

දේශීය බැංකු මගින් මූල්‍යාධාර සපයනු ලබන මාර්ග ව්‍යාපෘතීන්හි පොලී සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා රජයට සැළකිය යුතු මුදලක් දැරීමට සිදුවූ අතර, පළමු මාස 06 ක කාලසීමාවේ දී මේ සඳහා රු. මිලියන 12,000 ක් ගෙවන ලදී. මීට අමතරව, ඉහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ පළමු මාස හතරක කාලය තුළදී රු. මිලියන 3,984 ක් දැරීමට සිදුවිය.

**වගුව 3.16: මහාමාර්ග සහ පාළම් සඳහා වියදම ජනවාරි - අප්‍රේල් 2017**

රු. මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | 2016 අප්‍රේල් 30 දක්වා වියදම (රු.මි) | 2017 අප්‍රේල් 30 දක්වා වියදම (රු.මි) |
|---|---|---|---|
| 1. | **අධිවේගී මාර්ග සංවර්ධනය** | 1,578 | 9,458 |
| | පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය - අදියර III | 899 | 1,161 |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 65 | 742 |
| | දක්ෂිණ අධිවේගී මාර්ගයේ දිගුව | 592 | 7,489 |
| | වෙනත් | 23 | 66 |
| 2. | **මහාමාර්ග සංවර්ධනය** | **1,842** | **5,532** |
| | මාර්ග නඩත්තු කිරීම | 497 | 2,195 |
| | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - III | 613 | 1,214 |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 589 | 243 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 15 | 799 |
| | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන | 23 | 807 |
| | වෙනත් | 106 | 274 |

රු. මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | 2016 අප්‍රේල් 30 දක්වා වියදම (රු.මි) | 2017 අප්‍රේල් 30 දක්වා වියදම (රු.මි) |
|---|---|---|---|
| 3. | **මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම** | **2,216** | **4,939** |
| 4. | **පාළම් හා ගුවන් පාළම් ඉදිකිරීම** | **782** | **1,096** |
| | බ්‍රිතාන්‍ය යකඩ පාළම් ව්‍යාපෘතිය | 162 | 233 |
| | ජාතික මහාමාර්ගවල කැඩුණු/දුර්වල පාළම් නැවත ඉදිකිරීම | 51 | 110 |
| | පාළම් 46ක් නැවත ඉදිකිරීම | 304 | 109 |
| | ප්‍රධාන පාළම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 14 | 62 |
| | පැරණි පාළම් කොටස් භාවිතයෙන් ග්‍රාමීය පාළම් ඉදිකිරීම | 41 | 129 |
| | දෙවන නව කැළණි පාළම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 109 | 302 |
| | වෙනත්(ගුවන් පාළම් 3ක් ඇතුළත්ව) | 103 | 151 |
| 5. | **ස්වාභාවික ආපදාවන්ගෙන් බලපෑමට පත් මාර්ග වැඩිදියුණු කිරීම** | 12 | 13 |
| 6. | **මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන** | **293** | **238** |
| 7. | **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ප්‍රදාන** | **2,000** | **2,038** |
| 8. | **ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම** | 823 | 912 |
| 9. | **රජයේ සුරක්ෂිතතාවය මත දේශීය බැංකු මූල්‍යනය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය** | 7,808 | 12,000 |
| 10. | **වෙනත්** | 21 | - |
| | **එකතුව** | 17,375 | **36,226** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## (7) ප්‍රවාහනය

සමාලෝචිත කාලසීමාව තුළ ප්‍රවාහන අංශයේ ආයෝජනය රු. මිලියන 3,842 ක් වන අතර එය ප්‍රධාන වශයෙන් දරා ඇත්තේ පොදු ප්‍රවාහන සේවාවල ධාරිතාවය සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් රට තුල නවීන ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම සඳහා වේ. මුලු වියදමින් රු. මිලියන 889 ක් වැයකර ඇත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගමයේ) නව බස්රථ මිලදී ගැනීම සඳහා වන කල්බදු වාරික ගෙවීම සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා වේ. ඉතිරි රු. මිලියන 2,953 මාතර - බෙලිඅත්ත - කතරගම නව දුම්රිය මාර්ගය, මඩු-තලෙයිමන්නාරම දුම්රිය මාර්ගය, පලෙයි - කන්කසන්තුරේ නව දුම්රිය මාර්ග ඉදිකිරීම් සහ අනුරාධපුර/තලෙයිමන්නාරම/කන්කසන්තුරේ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වේ.

වගුව 3.17 : දුම්රිය අංශයේ වියදම ජනවාරි - අප්‍රේල් 2017

රු. මිලියන

| ව්‍යාපෘතියේ නම | දේශීය මූල්‍යනය | විදේශීය මූල්‍යනය | මුළු වියදම |
|---|---|---|---|
| මාතර - බෙලිඅත්ත - කතරගම නව දුම්රිය මාර්ගය | 44 | - | 44 |
| මඩු - තලෙයිමන්නාරම දුම්රිය මාර්ගය | 27 | - | 27 |
| | | | |
| අනුරාධපුරය සිට මඩු සහ තලෙයිමන්නාරම සහ කන්කසන්තුරය දක්වා දුම්රිය මාර්ගයේ සංඥා හා සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම | 14 | 409 | 423 |
| ස්ථිර දුම්රිය මාර්ගයේ නව රේල් පීලි සහ සිල්පර යොදා ප්‍රතිසංස්කරණය කිරීම | 818 | - | 818 |
| කොන්ක්‍රීට් සිල්පර නිෂ්පාදන ඒකකය | 102 | - | 102 |
| වාහන අළුත්වැඩියා කිරීම | 854 | - | 854 |
| **මුළු ආයෝජනය** | **1,873** | **409** | **2,282** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### (8) විදුලිබල හා බලශක්ති

2014 වර්ෂයේ සිට රජය මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ ණය, ප්‍රාග්ධන කොටස් බවට පත්කිරීමට ගත් තීරණය මගින් එහි මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමත්, ඒ අනුව එහි ස්වයං-උත්පාදක ඉපැයීම් මගින් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමත් කරගෙන යනුලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් උපයන විදුලිබලය උත්පාදනය කිරීමේ ව්‍යාපෘති සඳහා රාජ්‍ය ආයෝජනය ක්‍රමයෙන් අඩුවී ඇත.

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යාපෘති සඳහා රජයේ ආයෝජනය රු. මිලියන 40.2 ක් විය. මෙයට, පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, භූතානයේ, නේපාලයේ සහ ශ්‍රී ලංකාවේ පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සහ පුනර්ජනනීය ජෛව වායු බලශක්ති නිෂ්පාදන හා නවීන ජෛව -බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් පිළිවෙලින් රු. මිලියන 23.67, රු. මිලියන 16.3 සහ රු. මිලියන 0.5 ක් ඇතුලත් වේ. මේ අතර, 2017 වර්ෂයේ පළමු මාස හතර තුළ සී.ස. පොලිප්ටෝ ලංකා (පුද්.) සමාගම මගින් ඉවතලන ප්ලාස්ටික් යොදා ඉන්ධන නිපදවීම සඳහා රු. මිලියන 8 ක් වැය කර ඇත.

### (9) නාගරික සංවර්ධනය

ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීම සඳහා රජයේ නව උපායමාර්ග යක් ලෙස මහානගර සංවර්ධන සංකල්පය හැඳින්විය හැක. ඒ අනුව, බස්නාහිර කලාපීය මහානගරය සැලසුම්සහගත මහානගරයක් බවට පත් කිරීම සඳහා හඳුනාගෙන සැලසුම්කර ඇති අතර එය මාර්ග තදබද ගැටළු, කැලිකසල බැහැර කිරීමේ ගැටළු, පැල්පත්, පාරිසරික ගැටළු ආදී ප්‍රශ්න සඳහා පිළිතුරක් ලබාදේ. එයට අමතරව ගාල්ල, මහනුවර, යාපනය, අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය වැනි උපායමාර්ගික නගර සංවර්ධනය කිරීමට ද බලාපොරොත්තු වේ.

2017 වර්ෂයේ පළමු මාස හතර තුළ නාගරික සංවර්ධනය සඳහා රු. මිලියන 14,914 ක් වැය කර ඇති අතර ඉන් රු. මිලියන 13,988 ක් ප්‍රධාන කොට මහා පරිමාණ නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කර ඇත.

වගුව 3.18: මහා පරිමාණ නාගරික සංවර්ධන ව්‍යාපෘති පිරිවැය - 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| ව්‍යාපෘතිය | දේශීය අරමුදල් | විදේශ අරමුදල් | මුළු පිරිවැය |
|---|---|---|---|
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 323.66 | 458.58 | 782.24 |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1 | 128.74 | | 128.74 |
| උපායමාර්ගික නගර සංවර්ධනය - මහනුවර සහ ගාල්ල (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 186.76 | 629.77 | 816.53 |
| මහකොළඹ ගංවතුර පාලන සහ පරිසර සංවර්ධන ව්‍යාපෘතිය | 266.73 | | 266.73 |
| මැනිං වෙළඳපොළ පැලියගොඩ ප්‍රතිශ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතිය | 102.62 | | 102.62 |
| නගර සංවර්ධනය සහ නාගරික සනඅපද්‍රව්‍ය කළමනාකරණය | 2,391.50 | | 2,391.50 |
| නාගරික පුනර්ජීවන වැඩසටහන | 8,500.00 | | 8,500.00 |
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 662.68 | | 662.68 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 337.09 | | 337.09 |
| **මුළු ආයෝජනය** | **12,899.78** | **1,088.35** | **13,988.13** |

*මූලාශ්‍රය: මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය*

### (10) නිවාස සංවර්ධනය

"සැමට සෙවණ" තේමාව යටතේ සියලු දෙනාටම සුදුසු නිවාස ලබාදීම සහ පවත්නා නිවාස වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, 2017 වර්ෂයේ මුල් මාස හතර තුළදී නිවාස සංවර්ධන වැඩසටහන් ශක්තිමත් කිරීම සහ කඩිනම් කිරීම සිදුකරන ලදී. 2017 වර්ෂයේ නිවාස සංවර්ධනය සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත ලබාදුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 6,707 ක් විය. ප්‍රතිලාභීන්ගේ ආදායම සහ අවශ්‍යතාවන් මත පදනම්ව සහනදායී ණය මුදල් මූල්‍ය ප්‍රදාන ලබාදීම මගින් ආදර්ශ ගම්මාන හා විසිරි නිවාස වැඩසටහන වැනි විවිධ වැඩසටහන් යටතේ මෙම ආයෝජනය උපයෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.

පසුගිය වර්ෂයේ පළමු මාස හතර තුළදී වැය කරන ලද රු. මිලියන 671 හා සැසඳීමේ දී 2017 වර්ෂයේ පළමු මාස හතර තුළ දී නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මගින් නිවාස සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන

1,343 ක් වැය කරන ලදී. මෙම ආයෝජනය මගින් නව ආදර්ශ ගම්මානයන්හි නිවාස 484 ක් සඳහා සහ විසිරි නිවාස වැඩසටහනෙහි නිවාස 8,578 ක් සඳහා නිවාස ණය ලබාදී ඇත. තවද, උතුරු සහ නැගෙනහිර පළාත්වල ප්‍රතිලාභීන් 2,534 දෙනෙකු සඳහා නිවාස ප්‍රදාන ලබාදී ඇත.

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| **1 - 22** | විශේෂ වියදම් ඒකක | | - | - |
| 1 | අතිගරු ජනාධිපති | "වස විස නැති රටක්" ජාතික වැඩසටහන," සිරිසර පිවිසුම" වැඩසටහන, ආගමික ස්ථාන සංවර්ධනය කිරීම, කලාපීය මට්ටමේ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමේ අයවැය යෝජනාව, කලාකරුවන්, ජනමාධ්‍යවේදීන් සහ ලේඛකයින් සඳහා වූ විශේෂ අරමුදල, 2014 වර්ෂයේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 375,741,710 | 10,393,360,000 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන, ජපන් - ශ්‍රී ලංකා ඒකාබද්ධ අවබෝධාත්මක සහයෝගිතා මහලේකම් කාර්යාලය පිහිටුවීම, උපකරණ මිලදී ගැනීම, වාහනයක් සහ ගිලන් රථ ලබාගැනීම, 2016 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 23,696,000 | 90,373,304 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | 300,000 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 2016 වර්ෂයේ අයවැය යෝජනා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අනුව කොමිෂන් සභාව ශක්තිමත් කිරීම | | 20,000,000 |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම | 1,200,000 | |
| 16 | පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තු සංකීර්ණය නවීකරණය කිරීම, මාසික දීමනා ගෙවීම, වාහනයක් ලබාගැනීම, පුද්ගල පඩිනඩි, යටිතල පහසුකම් සංවර්ධනය, පාර්ලිමේන්තු ක්‍රමය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය. | 258,960,000 | 392,221,430 |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | විදේශ ගමන් වියදම්, රාජ්‍ය සේවකයින් සඳහා දේපළ ණය සඳහා පොලිය | 1,548,250 | |
| 18 | පාරලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | විදේශ ගමන් වියදම්, වැටුප් සහ දීමනා ගෙවීම | 11,476,000 | |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය | වාහනයක් ලබාගැනීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම | | 58,973,540 |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අදාළව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් මෙහෙයවීම, මැතිවරණ පැමිණිලි සොයා බැලීමේ ක්‍රමය පිළිබඳ ව්‍යාපෘතිය සහ ආපදා සහන මධ්‍යස්ථානය | 4,800,000 | 29,100,000 |
| 21 | විගණකාධිපතිතුමා | වාහන සඳහා බදු කුලී, විදේශ ගමන් වියදම් සහ මූලධන වත්කම් අත්පත් කරගැනීම | 92,250,000 | 7,800,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | විදේශ ගමන් වියදම් | 289,040 | |
| 101 | බුද්ධශාසන අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ නිල වෙසක් දින සැමරුම, බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම සහ උඩුවියනක් ඉදිකිරීම | 250,000,000 | 20,796,800 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | දහම් පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම , පුස්තකාල පොත් දීමනාව, දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් සහ මාසික දීමනාවක් ලබාදීම, ගුරු පුහුණුව සහ දහම් සරසවිය වැඩසටහන | 824,075,000 | 5,000,000 |
| 102 | මුදල් අමාත්‍යාංශය | අයවැය යෝජනාව අනුව මූල්‍ය වත්කම් කළමනාකරණ ඒජන්සිය පිහිටුවීම, ගමන් වියදම්, වාහනයක් ලබාගැනීම, පුද්ගල පඩිනඩි | 33,700,000 | 10,130,000,000 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | විදේශ ගමන් වියදම් | 6,500,000 | |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | ජූලි වැඩවර්ජකයින් සඳහා එක් වරක් පමණක් ලබාදෙන දීමනාව ගෙවීම | 100,000,000 | |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම්ගත කිරීම | | 10,000,000,000 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, ඉන්ධන, ප්‍රවාහන සහ තැපැල් සේවා, මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | 9,074,000 | 200,000 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | කෘෂි, පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය , ජනමාධ්‍යවේදීන්, කලාකරුවන්, තේ කම්හල් හිමිකරුවන් සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් වල ස්ථාවර තැන්පතු හිමි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය සඳහා පොලී සහනාධාර, දේශීය කිරිපිටි නිෂ්පාදකයින් සඳහා මිල සහනාධාර ලබාදීම, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ණය සුරැකුම් යෝජනා ක්‍රමය, අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය සඳහා පොලී සහනාධාර ලබාදීම, ප්‍රචාරණ වියදම් | 14,223,066,050 | 500,000,000 |
| 244 | වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | සාක් සංවර්ධන අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ සාමූහිකව ගැටලු විසඳීම පිළිබඳව වැඩමුළුව | 1,000,000 | |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 245 | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව | හතරවන දකුණු ආසියානු කලාපීය රාජ්‍ය ප්‍රසම්පාදන සම්මන්ත්‍රණය | 3,000,000 | |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | නව දේශීය ආදායම් පනත සහ ආදායම් පාලන කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | 209,100,000 |
| 247 | ශ්‍රී ලංකා රේගුව | මුහුදේ නිරීක්ෂණ කටයුතු සඳහා බෝට්ටු මිලදී ගැනීම පිළිබඳ අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම, නව රේගු ගොඩනැගිල්ල ඉදිකිරීම | | 323,060,000 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | නිෂ්පාදන අධීක්ෂණ සහ බදු ස්වයංක්‍රීයකරණය කිරීමේ පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 17,000,000 | 28,600,000 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | විදේශ ගමන් වියදම්, බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජා ශක්ති සංවිධානයේ උප ණය මුදල කපා හැරීම | 8,020,000 | |
| | | | | |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | ආබාධිත රණවිරුවන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සහ ත්‍රිවිධ හමුදාවේ නීති නිලධාරීන් සඳහා දීමනා ගෙවීම පිළිබඳ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, ජාතික සයිබර් ආරක්ෂණ පද්ධතිය ලබාගැනීම, පීපීපී පදනම යටතේ නව දේශීය ගුවන් සේවයක් හඳුන්වා දීම, ආරක්ෂක රථ ලබාගැනීම | 4,370,000,000 | 204,016,870 |
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් | | 4,338,000,000 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | විදුර නාවුක බඳවා ගැනීම් පුහුණු මධ්‍යස්ථානය නව ස්ථානයක පිහිටුවීම, ත්‍රිකුණාමලයේ නාවික තටාකාංගනයේ තොටුපල ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, වෙරළාසන්න මෙහෙයුම් යාත්‍රාවක් ඉදිකිරීම, ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ ලබාගැනීම, 2016 වර්ෂයේ හිඟ ගෙවීම් නිරවුල් කිරීම. | | 576,606,000 |
| 104 | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | වෘත්තීය පුහුණු වැඩසටහන් පිළිබඳ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, කුඩා ව්‍යාපාර මූල්‍යනය කිරීම සඳහා පොලී රහිත ණය යෝජනා ක්‍රම, දේශීය නායකයින් සවිබල ගැන්වීම සඳහා විශේෂ අරමුදලක් පිහිටුවීම, තෝරාගත් ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයක් පිහිටුවීම, මත්ද්‍රව්‍ය නිවාරණය සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම, තෝරාගත් ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, දිළිඳුකම තුරන් කිරීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය, "ශ්‍රී ලංකාවේ එක්සිම් බැංකුවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම", ගෝල්ඩන් කී තැන්පතුකරුවන් සඳහා ගෙවීම් සිදුකිරීම සහ විශ්ව අලෙවි ව්‍යාපාරය, ජල බවුසරයක් ආනයනය කිරීමේ බදු, මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයක් ක්‍රියාත්මක කිරීම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීමට සහ රැකියා උත්පාදනය සඳහා ණය ලබාදීම | | 27,056,130,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | සංඛ්‍යාලේඛන ධාරිතා ඉහළ නැංවීමේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | 12,000,000 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | ගංවතුර සහ නියං සහනාධාර පිළිබඳ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පැතලි පතුල සහිත බෝට්ටු 25 ක් සහ ගිනිනිවීම් ඒකක මිලදී ගැනීම, පැල්මඩුල්ල ප්‍රදේශයේ ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ ස්වභාවික ආපදා සහ හදිසි සහන යෝජනා ක්‍රමයේ ආවරණය පුළුල් කිරීම, ජල බවුසර් මිලදී ගැනීම, ගංවතුර සහ නායයෑම් ආපදා ප්‍රතිචාර වැඩසටහනේ ඉතිරි වී ඇති කටයුතු සම්පූර්ණ කිරීම, කළුතර බෝට්ටු අනතුරින් විපතට පත්වූවන් සඳහා සහන ලබාදීම, ජල ටැංකි 2,000 ක් මිලදී ගැනීම,ඉන්දිනීසියානු රජය මගින් ප්‍රදානය කරන ලද සහල් රේගුවෙන් නිදහස් කර ගැනීම, ප්‍රවාහන වියදම්, බදුල්ල දිස්ත්‍රික්කයේ නිවාස 24 ක් ඉදිකිරීම,මීතොටමුල්ල බෙදවාචකයෙන් විපතට පත්වූවන් සඳහා නිවාස 98 ක් ඉදිකිරීම සහ ගෘහ භාණ්ඩ, ප්‍රවාහනය සහ කුලී සහන ලබාදීම | 329,471,500 | 1,260,000,000 |
| 108 | තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | යාපනය දිස්ත්‍රික්කයේ තැපැල් ජාලය වැඩිදියුණු කිරීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම, වාහනයක් සහ පරිගණක උපාංග ලබාගැනීම | | 75,903,180 |
| 202 | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් සහ පුස්තකාල දීමනා ලබාදීම සහ දහම් පාසැල් පෙළපොත් මුද්‍රණය, මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම හා මුස්ලිම් පල්ලි වැඩිදියුණු කිරීම | 20,000,000 | 20,000,000 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය සඳහා පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීම, 2016 අයවැය යෝජනා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අනුව ලේඛනාගාරය ඩිජිටල්කරණය කිරීම හා අනු නීති සම්පාදනය කිරීම සහ නීති ප්‍රතිසංස්කරණ වැඩසටහන් මෙහෙයවීම | 10,000,000 | 14,000,000 |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | ප්‍රවාහන වියදම් | 1,000,000 | |
| 228 | අධිකරණ පරිපාලනය | අයවැය යෝජනා අනුව අනුරාධපුර, මාතලේ, යාපනය හි අධිකරණ සංකීර්ණ ඉදිකිරීම සහ විනිසුරුවරුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම, අධිකරණය ස්වයංක්‍රීයකරණය කිරීම, අයවැය යෝජනා අනුව වාණිජ මහාධිකරණ 4 ක් පිහිටුවීම | | 700,000,000 |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදුකුලී | 5,865,000 | |
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදුකුලී, කාර්ය මණ්ඩල පුහුණුව | 1,242,000 | 15,000,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | පිටපත් කිරීමේ ගාස්තු සඳහා ප්‍රතිපාදන සැලසීම | 804,283 | |
| 111 | සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | වාහන ලබාගැනීම, පෙර පාසල් සෞඛ්‍ය සහ හෙද පුහුණු පාසැල් වැඩිදියුණු කිරීම, විශේෂිත ළමා රෝග සංකීර්ණ ඉදිකිරීම, නින්දවූර් මූලික රෝහල, කරාපිටිය රෝහලේ මුඛ සෞඛ්‍ය මධ්‍යස්ථානය හා නුවර මහ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකය, වකුගඩු රෝග නිවාරණ වැඩසටහන, අයවැය යෝජනා අනුව වසර 3 ක් තුල පෝෂණවේදීන් සංඛ්‍යාව 300 ක් දක්වා වැඩිකිරීම | 100,000,000 | 2,782,000,000 |
| 112 | විදේශ කටයුතු අමාත්‍යාංශය | ඉතියෝපියාවේ අඩිඩිස්අබාබා, බීරූට්, ක්වෙට්, මිලාන්, ලන්ඩන් සහ ඔස්ලෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාල සඳහා ධජ සවිකළ මෝටර් රථ මිලදී ගැනීම, ජාතික සාගර කටයුතු කමිටු මහලේකම් කාර්යාලය, විදේශ ගමන් වියදම් | 53,607,900 | 49,425,000 |
| 114 | ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | පාසැල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර සඳහා වන සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ලාබ නොලබන මාර්ගවල ශ්‍රී ලංගම බස්රථ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රදානයන් ලබාදීම,යුද හමුදාව සඳහා ශ්‍රී ලංගම නිදහස් ගමන් බලපත්‍ර, ශ්‍රී ලංගම සඳහා නව එන්ජින් කට්ටල 489 ක් මිලදී ගැනීම | 10,392,579,000 | 1,100,000,000 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව කන්කසන්තුරේ සිට පොන්නලේ හංදිය දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම, පොල්ගහවෙල-කුරුණෑගල කොටසේ සහ අලුත්ගම ගාල්ල කොටසේ දුම්රිය මාර්ගය ද්විත්ව කිරීම | | 1,050,000,000 |
| 117 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | වාහනයක් ලබාගැනීම, රාජ්‍ය විශ්වවිද්‍යාලවල උසස් දක්ෂතා සහිත උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම, අවම වශයෙන් උපාධිධාරීන් 1,000 ක් සඳහා රු.මි. 1.5 ක සම්පූර්ණ පොලී රහිත ණය සහනාධාර, ශිෂ්‍යයින් 5,000 ක් සඳහා ණය පොලී සහනාධාර, රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 10 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම,පශ්චාත් උපාධි ආයුර්වේද වෛද්‍ය ආයතනය වැඩිදියුණු කිරීම, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉ-ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම, මොරටුව විශ්වවිද්‍යාලයේ උසස් ඉලෙක්ට්‍රොනික සැලසුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම, ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මය සඳහා වන මධ්‍යස්ථානයක් පිහිටුවීම හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම, ග්‍රාමීය ප්‍රදේශවල කි.මී. 1,000 ක මාර්ග සංවර්ධනය කිරීම, පාලම් නඩත්තු ඒකකයක් සහ පාලම් තක්සේරු ඒකකයක් පිහිටුවීම, හලාවත නගරය හරහා උමං මාර්ගයක් ඉදිකිරීම, ග්‍රාමීය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය, මාර්ග ව්‍යාපෘති පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, මාතර- කඹුරුපිටිය ප්‍රදේශයේ මාර්ග වැඩිදියුණු කිරීම | 1,050,000,000 | 5,372,900,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහපොල සහ ශිෂ්‍යාධාර පිළිබඳ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, 8%ක් දක්වා අතිරේක මාසික වන්දි දීමනා ගෙවීම, පරිගණක සහ තාක්ෂණික පීඨය ඉදිකිරීම | 593,000,000 | 50,000,000 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | කුඩා වැව් 1,500ක් පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය සහ රොන් මඩ ඉවත් කිරීම, පොහොර සහනාධාරය, නියගයෙන් පීඩාවට පත්වූ ගොවීන් සඳහා මූල්‍ය සහනාධාර, ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ බෙදා වෙන් කිරීම හා මිලදී ගැනීම, ලොකු ලූණු බීජ නිෂ්පාදන වැඩසටහන, සහල් අපනයන කලාප 4 ක් පිහිටුවීම, නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන්, කුඩා වැව් සහ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම,පීපීපී ක්‍රමය හරහා උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය කිරීම, විදේශ ගමන් වියදම් | 39,067,400,100 | 4,396,905,286 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පසු අස්වනු කළමනාකරණය සහ පලතුරු නිෂ්පාදන වැඩසටහන් සඳහා අගය එකතුකිරීම, බීජ සහතික කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම, වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ කිරීම | | 79,029,200 |
| 119 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව මාසික විදුලිබිල රු.2,000 ට වැඩි නිවාස සූර්ය බලශක්තියට පරිවර්තනය කිරීම සඳහා ණය සහනාධාර ලබාදීම, රාජ්‍ය අංශයේ ගොඩනැගිලි හරිත බලශක්තියට පරිවර්තනය කිරීම, තාප විදුලිබල උත්පාදනය සඳහා ලංවිමට දැරීමට සිදුවූ අතිරේක වියදම, පුනර්ජනනීය ජීවවායු බලශක්ති නිෂ්පාදනය සහ නවීන ජෛව බලශක්ති තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම | | 6,865,000,000 |
| 120 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | සුබසාධන වැඩසටහන් අනුව ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීම, පෙරපාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය ලබාදීම හා ළමා දිරිය වැඩසටහන - පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා, වාහනයක් ලබාගැනීම, ළමා ආරක්ෂණය සහ ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘතිය, නිල නිවස සඳහා ගෘහභාණ්ඩග සහ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම | 2,885,000,000 | 53,371,000 |
| 121 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | "සේවා පියස" මධ්‍යස්ථාන 1,000 ක් පිහිටුවීම, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව හිඟ බිල්පත් නිරවුල් කිරීම, කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, පොලොන්නරුව, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි 2011 - 2014 දක්වා බිල්පත් නිරවුල් කිරීම, රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති | | 4,649,697,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය-මාතර | මූලටියන ප්‍රදේශයේ ප්‍රවේශ මාර්ග සහ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | | 6,200,000 |
| 267 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය-මුලතිව් | ප්‍රවාහන වියදම් | 1,200,000 | |
| 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | 2016 මැයි මස ආපදාවෙන් හානියට පත්වූ පළාත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීම | | 22,000,000 |
| | | | | |
| 122 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමට ආධාර කිරීම, චිත්‍රපට ලේඛනාගාරයක් සහ සංරක්ෂණය කිරීමේ ඒකකයක් පිහිටුවීම හා ජාතික චිත්‍රපට ඇකඩමියක් පිහිටුවීම, වාහනයක් ලබාගැනීම, "පණ්ඩිත් අමරදේව සංගීත ආශ්‍රමය" පිහිටුවීම, ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා වන වියදම්, කාර්ය මණ්ඩල පුහුණුව, ජනමාධ්‍යවේදීන්ට යතුරුපැදි මිලදී ගැනීම සඳහා පොලී සහන සහිත ණය යෝජනා ක්‍රමයක්, ජනාධිපති සිනමා සම්මාන උලෙල 2015 | 54,200,000 | 177,000,000 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | "තිරසර යුගයක තෙවසර පිවිසුම සහ ජාතික සංවර්ධන වැඩසටහන" හා උත්තමාවී වන්දනා විරු සමරු උත්සවය සඳහා වන වියදම් | 25,000,000 | |
| | | | | |
| 123 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | රට තුළ නිවාස 50,000 ක් ඉදිකිරීම, අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම, ඉදිකිරීම්, උපකරණ සහ ක්‍රමෝපායන් පිළිබඳ පුහුණු මෙහෙයවීම | | 3,275,000,000 |
| | | | | |
| 124 | සමාජ සවිබල ගැන්වීම් සහ සුබසාධන අමාත්‍යාංශය | අඩු ආදායම්ලාභී ආබාධිත පුරවැසියන් සඳහා සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අවුරුදු 70 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මූල්‍යාධාර, වකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර, මූලධන වත්කම් අත්පත් කර ගැනීම, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා වන වියදම්, මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම. | 5,538,342,000 | 24,110,000 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ආබාධිත ළමුන් සඳහා වන දෛනික දීමනාව ඉහළ නැංවීම, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වෑන් රථ 2 සඳහා බදු කුලී | 28,127,000 | |
| 331 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | සමෘද්ධි සහ භූමිතෙල් සහනාධාරය | 21,975,000,000 | |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | පාසැල් පෝෂ්‍යදායී ආහාර පිළිබඳ සුබසාධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දුෂ්කර සහ අති දුෂ්කර පාසැල් ශිෂ්‍යයින් සඳහා පාවහන් ලබාදීම, පාසැල් නිල ඇඳුම්, පෙළපොත් මුද්‍රණය කිරීම, පාසැල් ශිෂ්‍යයින් සඳහා කිරි වීදුරුවක් ලබාදීම හා 5 වසර ශිෂ්‍යාධාර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ ලබාගත් වාහන 6 ක් සඳහා බදුකුලී වාහනයක් ලබා ගැනීම, කුලී පදනම මත උපරිම වශයෙන් පාසැලකට පරිගණක 50 ක් ලබාදීම, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පුළුල් කිරීම, අර්ධ රාජ්‍ය පාසැල් සඳහා දේපල ණය සහ ආපදා ණය පහසුකම්, උ.පෙ.ගුරුවරුන් හා ශිෂ්‍යයන් සඳහා ටැබ් පරිගණක ලබාග ැනීම, විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වන විශේෂ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, පිරවෙන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා පිරිවෙන් ගුරුවරුන්ගේ හැකියා ප්‍රවර්ධනය, විදුලිබලය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික පහසුකම් සෑම පාසැලකටම ලබාදීම, වතු පාසැල් 25 ක් වැඩිදියුණු කිරීම හා පාලක මණ්ඩලයේ කටයුතු සඳහා පහසුකම් සලසා දීම,සුබග ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය, ශිෂ්‍යයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, පිරිවෙන්හි ඉගෙනුම ලබන භික්ෂූන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම හා කොළඹ ජාතික පුස්තකාලය වැඩිදියුණු කිරීම, අයවැය යෝජනා අනුව වසර 13 ක අනිවාර්ය පාසැල් අධ්‍යාපන ප්‍රතිපත්තිය, කාර්ය මණ්ඩල පුහුණුව(යුනිසෙප්) | 21,197,100,000 | 13,052,197,000 |
| 130 | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය | ඵලදායිතා ප්‍රවර්ධන ව්‍යාපෘති, 2017/2018 සේවා විශිෂ්ඨතා වැඩසටහනෙහි හැකියා ප්‍රවර්ධනය | | 87,300,000 |
| 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව National Finite Element Stimulation මධ්‍යස්ථානයක් පිහිටුවීම, ජානමය වශයෙන් ප්‍රශස්ථ ඉහළ ඵලදාවක් සහිත පොල් රෝපණ ද්‍රව්‍ය නිපදවීම, ස්වයංක්‍රීය වෙළඳ භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවීම, පොහොර සහනාධාරය ලබාදීම පිළිබඳ සුබසාධන වැඩසටහන, සේවකයින් සඳහා වන්දි සහ පාරිතෝෂික,වාහනයක් ලබා ගැනීම, මූලධන වත්කම්, ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා අත්පත්කර ගැනීම, | | 1,869,258,000 |
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා පුහුණුකරුවන්ගේ හැකියා සංවර්ධනය, කුමාර් ආනන්දන් පිහිණුම් තටාකය සහ මානව කාර්ය සාධන විද්‍යාගාරය ඉදිකිරීම, ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීම, අයවැය යෝජනා අනුව සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය සඳහා කෘතිම ධාවන පථ ඉදිකිරීම, වාහනයක් ලබා ගැනීම. | | 1,063,200,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ක්‍රීඩා කුසලතා හඳුනාගැනීමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර ක්‍රීඩා වැඩසටහන්වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම , පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | | 259,000,000 |
| 140 | කඳුරට නවගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | රට තුළ නිවාස 50,000ක් ඉදි කිරීම, කුලී සහ දේශීය බදු සඳහා වියදම් | 600,000 | 1,000,000,000 |
| 145 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | උතුරු පළාතේ දීර්ඝකාලක් අවතැන් වී සිටින පුද්ගලයින් නැවත පදිංචි කරවීම, අයවැය යෝජනා අනුව මත්ද්‍රව්‍ය නිවාරණය, මත්ද්‍රව්‍ය තුරන්කිරීම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම, යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ආනයනය කරන ලද ද්‍රව්‍ය සඳහා වූ රේගු බදු සහ වෙනත් බදු, වැලිකඩ බන්ධනාගාර ගැටුමේදී විපතට පත්වූ පුද්ගලයින් සඳහා වන්දි. | 42,500,000 | 1,983,000,000 |
| 204 | හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්, පුස්තකාල සහ දහැම් දිරිය ගුරු දීමනාව | 30,000,000 | |
| 147 | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම | | 15,000,000 |
| 149 | කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය | රොබෝ විද්‍යා යෙදවුම් විශිෂ්ඨතා මධ්‍යස්ථානය පිහිටුවීම, ලක් සතොස සිල්ලර ජාලය පුළුල් කිරීම, ලක් සතොස සහ ඔසු සල නියෝජිත වෙළඳසැල් පුළුල් කිරීම, මිනිපේ වම් ඉවුර හා කිතුල් හා රුගම් ජලාශ සහ කුඹුක්කන් ඔය සහ තාරාපුරම් වැව ප්‍රතිසංස්කරණය කිරීම, වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්, ජාතික ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ කාර්යාලය සහ වෙළඳ නඩු පැවරීමේ කාර්යාලය පිහිටුවීම, අත්යන්ත්‍ර කර්මාන්තය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම,අයවැය යෝජනා අනුව "විශිෂ්ඨ ශිල්ප අලෙවි මධ්‍යස්ථානයක්" පිහිටුවීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවධ නීතිගත සංස්ථාව මගින් මෙගා ප්‍රදර්ශනාගාරයක් පිහිටුවීම, වාහන ලබා ගැනීම, හිඟුරාන සීනි කර්මාන්ත ශාලාවේ සේවකයින්ට වැටුප්, වෘත්තීය නිපුණතා පුහුණු වැඩසටහන, ශ්‍රී ලංකා පේශ කර්ම සහ ඇඟළුම් ආයතනයට විද්‍යාගාර උපකරණ සහ එහි පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම, කාර්මික නිෂ්පාදන ගම්මාන ප්‍රවර්ධනය සඳහා වියදම්, කුඩා කාර්මික ජනපද වැඩි දියුණු කිරීම සහ නවීකරණය කිරීම, ඇඟළුම් පදනම් කරගත් කුඩා කර්මාන්තශාලා සහ ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය මගින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම, දේශීය ටින් මාළු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම සහ කාර්මික ජනපද සංවර්ධනය කිරීම, බඩඉරිඟු කිලෝ ග්‍රෑමයක් සඳහා වන රු. 7.50ක මිල වෙනස සඳහා සහනාධාර ගෙවීම, වාහනයක් සඳහා බදු කුලී වියදම්, විදේශ ආධාර ලබන පුහුණු වැඩසටහන්. | 241,084,000 | 3,285,220,230 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදු කුලී, පෙහෙකම්හල්හි සේවය කරන ලද කම්කරුවන් සඳහා වන්දි. | 43,240,000 | |
| 150 | ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | විදේශ ගමන් වියදම් | 4,500,000 | |
| 151 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ත්‍රිකුණාමලය ජලසැපයුම් යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම, යාපනය සහ පුත්තලමෙහි කරදිය පිරිසිදු කිරීමේ යන්ත්‍ර පිහිටුවීම, සමන්තුරේ සහ කල්මුනේහි ඒකාබද්ධ නගර, ගන්දර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය, හම්බන්තොට, මන්නාරම සහ මඩකලපුවෙහි ජලජ කාර්මික කලාප පිහිටුවීම, හම්බන්තොට, යාපනය සහ මඩකලපුව ඇතුළත්ව මුහුදුබඩ දිස්ත්‍රික්ක 10ක ධීවර ගම්මාන නගා සිටුවීම, ඒකාබද්ධ අභ්‍යන්තර ධීවර ගම්මාන පිහිටුවීම, -"වැවක් සහිත ගමක් " වැඩසටහන සහ ජාතික ජලජීවී සංවර්ධන කටයුතු පුළුල් කිරීම, නව ධීවර සහ ජල ජීවී ප්‍රතිපත්තිය සකස් කිරීම | | 2,324,320,000 |
| 153 | ඉඩම් අමාත්‍යාංශය | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ සහ මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | 600,000 |
| 286 | ඉඩම් කොසාරිස් දෙපාර්තමේන්තුව | වාහන බදු කුලී | 1,800,000 | |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | මූලධන වත්කම් අත්පත් කර ගැනීම, වාහන බදු කුලී, ගමන් වියදම් සහ වෙනත් මූලධන වියදම් | 5,000,000 | 10,000,000 |
| 154 | ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ගොවීන් සඳහා උසස් තත්වයේ වැඩි කිරි ප්‍රමාණයක් නිපදවන එළදෙනුන් ලබා දීම, අයවැය යෝජනා අනුව නැගෙනහිර පළාතේ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම, නව ගොඩනැගිල්ලක් කොටස් වෙන් කිරීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම, වාහනයක් ලබා ගැනීම, කිතුල් සංවර්ධන ව්‍යාපෘතියේ හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | | 795,705,900 |
| 155 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සංවර්ධන සහාය, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය ප්‍රදේශවල කි.මී. 1,000ක් දීර්ඝ මාර්ග සංවර්ධනය කිරීම, මිශ්‍ර සංවර්ධනය සඳහා සිරස් ගොඩනැගිල්ලක්, අයවැය යෝජනා අනුව පුද්ගලික ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට විනෝදාස්වාද පහසුකම්, ෂැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සැලසීම, වාහනයක් ලබා ගැනීම, පැල්ලේපොල නගර සංවර්ධන වැඩසටහනෙහි බිල්පත් ගෙවීම, නව ගොඩනැගිලි ඉදි කිරීම, හදිසි ප්‍රතිචාර ශක්නුතා වයාපෘතිය සංවර්ධනය කිරීම සහ මුලටියන ප්‍රාදේශීය සභාවේ නඩත්තු වියදම් | | 5,299,083,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 312 | බස්නාහිර පළාත් සභාව | 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 1,034,840,000 |
| 313 | මධ්‍යම පළාත් සභාව | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස නවීකරණය කිරීම සහ 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 1,210,340,000 |
| 314 | දකුණු පළාත් සභාව | පළාත් වාරිමාර්ග වැව් , ඇළ මාර්ග සහ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, කඹුරුපිටිය බස් නැවතුම්පොළ ඉදි කිරීම, 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම. | | 1,072,871,020 |
| 315 | උතුරු පළාත් සභාව | පළාත් සභාවලට දායක වීම සඳහා විශේෂිත සංවර්ධන ප්‍රදාන, 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 516,500,000 |
| 316 | වයඹ පළාත් සභාව | 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 483,440,000 |
| 317 | උතුරු මැද පළාත් සභාව | 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 123,370,000 |
| 318 | ඌව පළාත් සභාව | කෘෂි මාර්ග සහ කුඩා වාරි මාර්ග ප්‍රතිසංස්කරය කිරීම | | 287,500,000 |
| 319 | සබරගමුව පළාත් සභාව | 2016 වර්ෂයේ බිල්පත් නිරවුල් කිරීම | | 506,010,000 |
| 321 | නැගෙනහිර පළාත් සභාව | වාහනයක් ලබා ගැනීම සහ සාම්පූර් රෝහල් ගොඩනැගිල්ලේ කටයුතු සම්පූර්ණ කිරීම හා ගෘහ භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම | | 79,000,000 |
| | | | | |
| 157 | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | "ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය කිරීම" පිළිබඳ අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම, වාහනයක් ලබා ගැනීම, කුලී හා දේශීය බදු සහ වාහන සඳහා බදු කුලී | 17,110,000 | 343,000,000 |
| | | | | |
| 158 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | වාහනයක් ලබා ගැනීම, ජනවසම, රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහ ඇල්කඩුව වැවිලි සමාගමේ පුද්ගල පඩි නඩි, අයවැය යෝජනා අනුව නිවාස බැංකුවක් ඇති කිරීම, පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීම් | | 7,797,290,000 |
| | | | | |
| 159 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික යටයුතු අමාත්‍යාංශය | වාහනයක් ලබා ගැනීම, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික පොත් යාවත්කාලීන කිරීම, පුහුණු මධ්‍යස්ථානයක් සහ ඒකාබද්ධ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම, සංචාරක පොලිස් ඒකක ව්‍යාප්ත කිරීම, ජැටි සඳහා ආයෝජනය කිරීම, පොළී සහන ණය යෝජනා ක්‍රම, අයවැය යෝජනා අනුව MICE සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් පිහිටුවීම | 510,000,000 | 1,293,000,000 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්, පුස්තකාල හා දහම් දිරිය ගුරු දීමනාව | 114,627,000 | 25,000,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 160 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | ජාතික ක්‍රියාත්මක සැලසුම පිළිබඳ ව්‍යාපෘතිය, ජාත්‍යන්තර පුහුණු වැඩමුළු, ප්‍රධාන ප්‍රවාහයේ කෘෂි ජෛව විවිධත්ව සංරක්ෂණය, ආක්‍රමණික විදේශීය ශාක විශේෂ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකාවේ තුන්වන ජාතික සංවාදය සකස්කිරීම පිළිබඳ ව්‍යාපෘතිය, "ප්‍රධාන ප්‍රවාහයේ ජෛව විවිධත්ව සංරක්ෂණය සහ වැඩි දියුණු කළ මානව පෝෂණය සහ යහ පැවැත්ම සඳහා වන පුනර්ජනනීය භාවිතය" සහ "වන විනාශයෙන් හා බාදනයෙන් ඇතිවන විමෝචකයන් අඩු කිරීමේ යාන්ත්‍රණය", පුද්ගල පඩි නඩි සහ වෙනත්, මොන්ට්‍රියල් ප්‍රොටොකෝලය ක්‍රියාත්මක කිරීම. | 8,034,000 | 31,941,800 |
| 283 | වන සංරක්ෂණ අමාත්‍යාංශය | කාර්මික වැවිලි ඇති කිරීම සහ කළමනාකරණය | | 40,000,000 |
| 161 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | වාහනයක් ලබා ගැනීම | | 43,000,000 |
| 162 | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | මහා නගර සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වියදම්, මහ කොළඹ ගංවතුර ආරක්ෂණය සහ පරිසර සංවර්ධනය, මැනිං වෙළඳපළ නැවත ස්ථානගත කිරීම, නගර සංවර්ධනය සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ සහ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, නාගරික පුනර්ජනන වැඩසටහන, අයවැය යෝජනා අනුව මාතර ගඟබඩ සංවර්ධනය සහ "නාගරික සංවර්ධන අධිකාරිය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් සන්ධිස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම" මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි, මුහුදු වැලි කැණීම සඳහා වන රජයේ ගාස්තු, උපාය මාර්ගික නගර සංවර්ධනය කිරීම, මහ කොළඹ ගංවතුර පාලන නාගරික පරිසර භාර අරමුදල, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීම, 2016 වර්ෂයේ බිලිපත් නිරවුල් කිරීම, ඌරුබොක්ක නගර සංවර්ධන ව්‍යාපෘතිය | 551,800,000 | 20,642,317,000 |
| 163 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ආගමන පොලීසියක් පිහිටුවීම, කලාකරුවන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක්, යටිතල පහසුකම් සංවර්ධනය, ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ ලබා ගැනීම | | 612,670,000 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ජෝන් ද සිල්වා රඟහල සහ ජාතික කලාගාරය නවීකරණය කිරීම | | 61,000,000 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වියදම් | | 2,500,000 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 165 | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | සාමය සහ එකමුතු බව ඉහළනැංවීමේ අරමුණින් යුතු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම, ප්‍රධාන යාන්ත්‍රණ ක්‍රියාවලිය පිළිබඳ වැඩසටහන, ආගමික සහ සංස්කෘතික උත්සව සැමරුම් පිළිබඳ අත්පොත් සහ වැඩමුළු, යාපනය දිස්ත්‍රික්කයේ යුද්ධයේ බලපෑමට ලක්වූ සිසුන් සඳහා පාපැදි 400ක් ප්‍රදානය කිරීම, සහජීවනය අරමුණුකරගත් ආර්ථික සවිබල ගැන්වීම | | 1,695,396,450 |
| 166 | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව නගර වැඩි දියුණු කිරීම සඳහා වන අවබෝධාත්මක සැලසුම සංවර්ධනය කිරීම, වාහනයක් ලබා ගැනීම, වියළි කලාප නාගරික ජලසම්පාදන යෝජනා ක්‍රමය සහ සනීපාරක්ෂක සංවර්ධන වැඩසටහන, නැවත පදිංචි කරවූ ගම්මාන සඳහා ජල පහසුකම්, ගලි බවුසර් 3ක් මිලදී ගැනීම, නැගීඑන කුඩා නගර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බිල්පත් නිරවුල් කිරීම | | 4,389,887,500 |
| 167 | විශේෂ කාර්යභාර අමාත්‍යාංශය | වාහනයක් ලබා ගැනීම | | 42,600,000 |
| 176 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බැඳීම් නිරවුල් කිරීම | | 32,255,000 |
| 182 | විදේශ රැකියා අමාත්‍යාංශය | වාහනයක් ලබා ගැනීම | | 43,000,000 |
| 192 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 2016 අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකා පොලිස් සේවයේ වැටුප් සකස් කිරීම, දක්ෂිණ සංවර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණය සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහ වූවන් පුනරුත්ථාපනය කිරීම, එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්, පුද්ගල පඩි නඩි | 297,600,000 | 1,968,330,000 |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | 2016 අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකා පොලිස් සේවයේ වැටුප් සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වල නිරතවීම, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්තාපනය, ගිලන් රථ 5ක් මිලදී ගැනීම, ආහාර සහ නිල ඇඳුම් | 2,932,000,000 | 5,097,700,000 |
| 193 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | අම්පාර සංචාරක නිවාසය ඉදිකිරීම සහ අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, දායකත්ව සහ සම්මාදම් ගාස්තු | 1,596,200 | 8,000,000 |
| 194 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පසහුකම් අමාත්‍යාංශය | මෙහෙයුම් කල්බදු, CIF සහ දේශීය ගාස්තු නිරවුල් කිරීම, වාහනයක් ලබා ගැනීම, වාහනයක් ලබා ගැනීම සඳහා වන රේගු ගාස්තු සහ වැට්, අයවැය යෝජනා අනුව ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම, ජාතික ඩිජිටල් හැඳුනුම්පත, ජාතික ගෙවීම් වේදිකාව, ජාතික දත්ත මධ්‍යස්ථානය පිහිටුවීම, ටොල් ගාස්තු ක්‍රමය, රහස් ලේඛන කියවීම හඳුන්වාදීම සහ වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම්, විදේශ ගමන් වියදම්, නිල නිවස නවීකරණය කිරීම | 5,670,590 | 15,082,781,250 |

වගුව 3.19 : 2017.04.30 දිනට අමාත්‍යාංශ අනුව ලබාදී ඇති අතිරේක ප්‍රතිපාදන සාරාංශය

රුපියල්

| වැය විෂය අංකය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 195 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | යටිතල පහසුකම් සංවර්ධනය, කොළඹ සල්පිල් ප්‍රදර්ශනය, විදේශ ගමන් වියදම්, වාහන සඳහා බදු කුලී සහ වාහනයක් ලබා ගැනීම | 66,000,000 | 1,036,000,000 |
| 296 | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | හැකියා ප්‍රවර්ධනය සඳහා වියදම් | | 700,000 |
| | | | | |
| 196 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | වාහන ලබා ගැනීම, දියවැඩියාව, ඩෙංගු, නිදනිගත වකුගඩු රෝග සහ පිළිකා සඳහා පර්යේෂණ සහාය, නවෝත්පාදන වැඩිදියුණු කිරීමේ අරමුදල සහ තාක්ෂණ නවෝත්පාදන උද්‍යාන පිහිටුවීම, නැනෝ තාක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, විශිෂ්ඨතා මධ්‍යස්ථානය පිහිටුවීම, ආනයනික නිෂ්පාදනවල තත්වය සහතික කිරීම,අයවැය යෝජනා අනුව නිෂ්පාදන සැලසුම් ඉංජිනේරු සේවා අරමුදල සහ නැණසල සමග සහයෝගිත්වයෙන් ඉන්කියුබේටර් උපකරණ පිහිටුවීම, COSTI වියදම්, විදේශ ගමන් වියදම් | 29,626,000 | 1,434,000,000 |
| | | | | |
| 197 | වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | නිල නිවස සඳහා වියදම්, සිසුන් සඳහා ශිෂ්‍යත්ව, ඇඟලුම්, සෞඛ්‍ය, සත්කාරක සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි පුහුණුව සඳහා තරුණයින්ට වැටුප්, අයවැය යෝජනා අනුව මාතර ජර්මානු කාර්මික අභ්‍යාස විද්‍යාලය සහ හෝටල් පුහුණු පාසල වැඩි දියුණු කිරීම, වාහන ලබා ගැනීම, කුලී වියදම්, විනිමය අනුපාත වෙනස් වීම | 640,600,000 | 229,283,600 |
| | | | | |
| 198 | වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | වාහන ලබා ගැනීම, පහළ මල්වතු ඔය වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රමය, අයවැය යෝජනා අනුව මිනිපේ වම් ඉවුර හා කිතුල් හා රුගම් ජලාශ සහ කුඹුක්කන් ඔය සහ තාරාපුරම් වැව ප්‍රතිසංස්කරණය කිරීම සහ භූගත ජලය අධීක්ෂණය කිරීමේ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විකිණුම්කරුවන්ගේ ණය වාරික, මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ අත්පත් කරගැනීම. | 7,242,669 | 1,266,272,422 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව යාන් ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | 1,000,000,000 |
| | | | | |
| 199 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදු කුලී | 6,411,900 | |
| | | **එකතුව** | **129,501,377,192** | **197,008,858,782** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### (11) ආපදා සහන කටයුතු

2017 වසරේ පළමු මාස හතර සඳහා ගංවතුර හා නියං ආධාර හා අනෙකුත් ආපදා සම්බන්ධ කටයුතු සඳහා රජය රු. මිලියන 1,396.5 ක් වැයකර ඇත. ඒ අතුරින් පානීය ජලය ලබාදීම සඳහා රු. මිලියන 163 ක් වැය කර ඇත. ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික රක්ෂණ භාර අරමුදල වෙත රක්ෂණ වාරිකය ගෙවීම සඳහා රු. මිලියන 500 ක් වැය කර ඇති අතර, කෑගල්ල දිස්ත්‍රික්කයේ නායයාමෙන් විපතට පත් වූ පවුල් සඳහා වන්දි ගෙවීමට හා නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 733.5 ක් වැය කර ඇත.

## 3.4 භාණ්ඩාගාර මෙහෙයුම්

### මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

රජයේ ආදායම් සහ වෙනත් ලැබීම් ලෙස භාණ්ඩාගාරය වෙත 2017 වර්ෂයේ පලමු මාස හතර තුල ලද මුදල් ප්‍රවාහයන් රු. බිලියන 578.5 ක් විය. මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් ගලායාම් වලින් පසුව ශුද්ධ මුදල් හිඟය රුපියල් බිලියන 222.1 ක් වූ අතර, එය 2016 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී රුපියල් බිලියන 13.6 ක වැඩිවීමකි. මෙම ශුද්ධ මුදල් හිඟය වැඩිවීම ප්‍රධාන වශයෙන් 2017 පලමු මාස හතර තුල ප්‍රාග්ධන කටයුතු සඳහා මුදල් ගලායාම් 58.8% කින් ඉහල යාම සහ භාණ්ඩාගාරය වෙත ලද මුදල් ප්‍රවාහයන් 24.1% කින් වැඩිවීම මෙයට හේතු විය. 2017 අප්‍රේල් මස අවසානයේදී පැවති සමස්ථ මුදල් ශේෂය (හිඟය) රුපියල් බිලියන 145.9 ක් වූ අතර, එය 2016 වර්ෂයේ අප්‍රේල් මස අවසානයේදී පැවති හිඟයට වඩා රුපියල් බිලියන 17.1 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

**වගුව 3.20 : රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය (2017 ජනවාරි සිට අප්‍රේල්)**

රු. (බිලියන)

| අයිතමය | 2016 | 2017 | |
|---|---|---|---|
| | ජනවාරි -අප්‍රේල් | ජනවාරි -අප්‍රේල් | |
| | තත්‍ය | ඇස්තමේන්තු | තථ්‍ය |
| ආරම්භක මුදල් ශේෂය (ජනවාරි 1 දිනට) | (196.8) | (160.3) | (160.3) |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 466.1 | 571.0 | 578.5 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සමස්ථ මුදල් ගලායාම් | (553.3) | (632.1) | (607.9) |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්* | (121.3) | (236.2) | (192.7) |
| ශුද්ධ මුදල් අතිරික්තය/(හිඟය) | (208.5) | (297.3) | (222.1) |
| දළ ණය ගැනීම්* | 453.4 | 618.7 | 618.3 |
| ණය ආපසුගෙවීම් | (218.0) | (372.1) | (380.9) |
| ශුද්ධ ණය ගැනීම් | 235.4 | 246.6 | 237.4 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු යනාදිය) | 6.9 | | (0.9) |
| **අවසාන මුදල් ශේෂය (අප්‍රේල් 30 දිනට)** | **(163.0)** | **(211.0)** | **(145.9)** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාරමෙහෙයුම් දෙපාර්තමේන්තුව*
** CS-DRMS හි වාර්තා කරඇති 2017/04/30 දිනදක්වා රජයට ලැබුනු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුලත් වේ.*

### රාජ්‍ය ණය කළමනාකරණය


2017 මුල් මාස හතර තුල රජය රු. බිලියන 618.3 ක සමස්ථ දල ණය ගැනීම් ප්‍රමාණයක් වාර්තා කර තිබිණි. එයින් බිලියන 553 ක් දේශීය ණය ගැනීම් වූ අතර රු. බිලියන 65.3 ක් විදේශීය ණය ගැනීම් විය. දේශීය ණය ගැනිම් වලින් රු. බිලියන 380.9 ක් ණය ආපසු ගෙවීම් සඳහා ද ඉතිරිය ණය සඳහා පොළි ගෙවීම සඳහා ද යොදා ගන්නා ලදි . මෙම කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 237.4 ක් විය.

2017 ජනවාරි - අප්‍රේල් කාලය තුළ රජයේ දල දේශීය ණය ගැනීම් පිළිබඳ විස්තර 3.21 වගුවේ සංක්ෂිප්තව දක්වා ඇත.

වගුව 3.21 : දේශීයණය ගැනීම් (2017 ජනවාරි -අප්‍රේල් )

| දළ දේශීය ණය ගැනීම් | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 181.7 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 0.3 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර | 217.3 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය | 33.3 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 120.4 |
| **එකතුව** | **553.0** |

3.3 රූපසටහන - දළ දේශීය ණය ගැනීම් (2017 ජනවාරි සිට අප්‍රේල්)




### භාණ්ඩාගාර ඇපකර මත වන වගකීම් හෙළිදරව් කිරීම

2017 අප්‍රේල් 30 න් අවසන් කාලය තුළ දී නිකුත් කල හා මෙතෙක් වලංගුව පවතින භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම රු. බිලියන 837.43 කි. මෙම ඇපකරවල අගය 2016 අංක 13 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතේ 2 වගන්තිය යටතේ දක්වා ඇති සීමාවන් ඉක්මවා නොමැත. 2017 අප්‍රේල් 30 දින දක්වා නොපියවූ ඇපකර පිළිබඳ තොරතුරු ඇමුණුම 3.22 හි සඳහන් පරිදි වේ.

3.22 : 2017.04.30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව

රු. මිලියන

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 16,813.89 |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 138,816.00 |
| | | සී/ස ලංකා ඛනිජ තෙල් ස්ටොරේජ් ටර්මිනල්ස් සමාගම | 6,215.87 |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 12,339.20 |
| | | සමූපකාර තොග වෙළඳ සංස්ථාව | 157.10 |
| | | ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | 6,000.00 |
| | | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 1,000.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 957.75 |
| | | වී අලෙවි මණ්ඩලය | 2,247.23 |
| | | මහජන බැංකු විශ්‍රාමික භාර අරමුදල | 2,500.00 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 19,153.56 |
| 2 | ලංකා බැංකුව | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 138,816.00 |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 835.00 |
| | | මිහින් ලංකා පුද්ගලික සමාගම | 367.00 |
| | | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය | 8,600.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 39,630.91 |
| | | නෝර්ත් සී ලිමිටඩ් | 50.00 |
| | | වී අලෙවි මණ්ඩලය | 3,129.78 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 40,803.31 |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 400.00 |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 750.00 |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 20,000.00 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 8,750.00 |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 31,099.41 |
| | | සී/ස ලක්ධනවි සමාගම | 2,992.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1,239.48 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 55,371.44 |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව | 3,500.00 |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 |
| 4 | කොමර්ෂල් බැංකුව | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 2,000.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1,929.61 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 7,209.81 |
| 5 | ඩී.එෆ්.සී.සී. බැංකුව | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 1,000.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 3,837.87 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 1,328.87 |
| 6 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | සී/ස ලක්ධනාවි සමාගම | 2,992.00 |
| 7 | චීනයේ එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 13,674.15 |
| 8 | හැටන් නැෂනල් බැංකුව | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 3,550.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 9,474.17 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 28,262.54 |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | ප්‍රමාණය |
|---|---|---|---|
| 9 | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | සී/ස වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම | 22,744.81 |
| 10 | චීනයේ කර්මාන්තත්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 10,754.17 |
| 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 104,029.33 |
| 12 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 3,874.13 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 8,353.31 |
| 13 | ඉන්දියාවේ එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 39,593.41 |
| 14 | චීනයේ සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7,522.08 |
| | | **එකතුව** | **837,435.18** |

# 4 පරිච්ඡේදය

## රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය

### 4.1 සමාලෝචනය

රජය සතු වාණිජ්‍ය ව්‍යාපාරයන් 55 හි 2015 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදනයට වූ ආංශික දායකත්වය වන සියයට 12.3 ට සාපේක්ෂව 2016 වසරේදී එය සියයට 13.3ක් වී ඇත. මෙම තත්වය තුළ මූල්‍ය තත්වය ඉහළ නැංවීම,සීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයක ඉල්ලුම සපුරාලීම සඳහා සේවා සැපයීම, යන උපාය මාර්ගික ප්‍රතිස්ථාපනයන් සිදු කිරීමේ අරමුණ සහිත රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් ලෙස තෝරාගත් ආයතන 5 ක් වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතන සමඟ 2017 වර්ෂයේ මුල භාගයේදී සාමූහික අවබෝධතා ගිවිසුම්[1] (SCI) ප්‍රකාශ සඳහා අත්සන් කිරිම සිදු කරන ලදී.

**සාමූහික ගිවිසුම් මගින් අපේක්ෂිත ප්‍රතිඵලයන් පහත සඳහන් පරිදි වේ.**

- රජය සතු වාණිජමය ව්‍යාපාර ආයතන අයවැයෙන් ස්වාධීනව වාණිජමය ශඛ්‍යතාවයක් සහිත ආයතන ලෙස කටයුතු කිරීම.
- පොදු වගවීමේ ක්‍රියාමාර්ග (Corporate Governance ) වැඩි දියුණු කිරීම
- කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද භාවිතා කිරිම
- මානව සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරිම
- මෙහෙයුම් පද්ධතිය වෙනස් කිරීම සහ ව්‍යාපාර සංස්කෘතිය වෙනස් කිරීම. (Reingenering)
- කාර්යක්ෂම හා ඵලදායී ව්‍යාපාර මෙහෙයුම් සහතික කිරිම හා ඒ තුළින් ආයෝජන මත ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ජනිත කිරීම

2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා බලපැවැත්වුණු වියළි කාලගුණික තත්වය හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය 2016 වර්ෂයේ පළමු මාස 4 ට සාපේක්ෂව අලාභ තත්වයක් පෙන්නුම් කර ඇති අතර ඒ අනුව 2017 වර්ෂයේ පළමු මාස 4 තුළ රාජ්‍ය ව්‍යාපාරයන් සම්මිශ්‍රිත කාර්යයසාධනයක් වාර්තා කර ඇත. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ මුල් මාස 4 තුළ ගෝලීය තෙල් මිල බැරලයකට ඇමරිකන් ඩොලර් 10-15 හෝ සියයට 20-25 කින් වැඩිවීම මෙම කාර්යයසාධනය කෙරෙහි වැඩිදුරටත් බලපා ඇත.

මෙම අහිතකර බලපෑම් මත ඇතිවූ මෙහෙයුම් කාර්යසාධනය පසුබෑස්ම හේතුවෙන් පෙර වර්ෂයේ මුල් මාස 4 තුල වාර්තා කළ ආයෝජන මත ප්‍රතිලාභ වන රු. මිලියන 7,891 ට සාපේක්ෂව 2017 මුල් මාස 4 තුලදී රාජ්‍ය ව්‍යාපාරවලින් ලද ආයෝජන ප්‍රතිලාභය රුපියල් මිලියන 4,371 ක් දක්වා අඩු වී ඇත.

මේ අතර ආයතන 42 ක් වූ රජය සතු මූල්‍ය නොවන ව්‍යවසායන්හි නොපියවූ බැංකු ණය ශේෂයන් 2016 වර්ෂය අගදී පැවති රු. මිලියන 758,160 ට සාපේක්ෂව 2017 මුල් මාස 4 ක කාලය තුලදී සියයට 17 කින් එනම් රු. මිලියන 889,132 දක්වා වැඩි වී ඇත.

### 4.2 රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් දහය පිළිබඳ කෙටි සමාලෝචනයක්

#### ලංකා බැංකුව

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ විශාලතම වත්කම් පදනම ලංකා බැංකුව සතු වන අතර පසුගිය වසර හතර තුළම එය රු. ට්‍රිලියනය ඉක්මවා පවත්වා ගැනීමට බැංකුව සමත් වී ඇත.

2016 වසර අවසානයේ පැවති වත්කම් පදනම වන රු. බිලියන 1,669, 2017 වසරේ අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,806 දක්වා සියයට 8.2 කින් වර්ධනය වී ඇත. 2016 වසර අවසානයේ පැවති තැන්පතු ප්‍රමාණය වන රු. බිලියන 1,256 ට සාපේක්ෂව 2017 වසරේ මුල් මාස හතර තුළ තැන්පතු ප්‍රමාණය රු. බිලියන 1,305 දක්වා සියයට 3.9 කින් ඉහළ ගොස් ඇත. බැංකුවේ අක්‍රිය ණය අනුපාතය 2016 වසර අවසානයේ පැවති සියයට 2.88 සිට 2017 වසරේ මුල්

[1] *සාමූහික අවබෝධතා ගිවිසුමත අදාළ රාජ්‍ය ව්‍යාපාරය, රේඛීය අමාත්‍යංශය හා මුදල් අමාත්‍යංශය විසින් අත්සන් කරන ලද ත්‍රෛපාර්ශවීය ගිවිසුම සාමූහික අවබෝධතා ගිවිසුම වේ. රජයේ ප්‍රතිපත්තිමය රාමුව තුළ එකඟ වූ කාලපරිච්ඡේදයක් සඳහා රාජ්‍ය ව්‍යාපාරයන්හි කාර්යසාධනය ඉහළ නැංවීම මෙමගින් අරමුණු කර ඇත. මූලික වශයෙන් මේ සඳහා මූල්‍යමය හා මෙහෙයුම් කාර්යසාධන පදනම්කර ගත් දර්ශකයන් ඉලක්කගත කර ඇත.*

මාස හතර තුළ සියයට 3.39 දක්වා ඉහළ ගොස් ඇත. ලංකා බැංකුව පසුගිය වසරේ අදාල කාලච්ජේදයේ වාර්තා කළ රු. බිලියන 10.1 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2017 මුල් මාස 04 තුළ රු. බිලියන 10.2 ක බදු පෙර ලාභයක් වාර්තා කොට ඇත.

### මහජන බැංකුව

මහජන බැංකුව රු. ට්‍රිලියනය ඉක්මවූ වත්කම් ප්‍රමාණයක් සහිතව, වත්කම් මත පදනම්ව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වාණිජ බැංකුව බවට පත් වී ඇත.

බැංකුවේ වත්කම් පදනම 2017 වසරේ මුල් මාස හතර තුල සියයට 12 ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 1,458 දක්වා ඉහළ ගොස් ඇති අතර 2016 වසර අවසානයේ පැවති වත්කම්පදනම රු. බිලියන 1,302 කි. පෙර වසර අවසානයේ පැවති තැන්පතු ප්‍රමාණය වන රු. බිලියන 1,078 ට සාපේක්ෂව 2017 වසරේ අප්‍රේල් අවසානය වන විට තැන්පතු ප්‍රමාණය රු.බිලියන 1,143 දක්වා සියයට 6 කින් වර්ධනය වී ඇත. 2017 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ ශුද්ධ ණය හා අත්තිකාරම් රු.බිලියන 995 දක්වා සියයට 11.8 ක වර්ධනයක් වාර්තා කරයි. 2016 වසරේ අදාළ කාලච්ජේදයේ ඉපයූ බදු පෙර ලාභය වන රු. බිලියන 5.6 ට සාපේක්ෂව මහජන බැංකුව 2017 වසරේ මුල් මාස 4 තුළ රු. බිලියන 4.6 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව රජය සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වේ. 2016 වසර දක්වා අඛණ්ඩව වසර 14 ක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෆිච් රේටින්ස් ලංකා ආයතනය මඟින් ලබා දෙන ශ්‍රේණිගත කිරීම් අනුව AAA(1KA) ස්ථානයේ රැඳී සිටි.

2017 වසරේ මුල් මාස 4 තුළ බැංකුවේ වත්කම් පදනම සියයට 2.3 කින් රු. බිලියන 933 දක්වා වර්ධනය වී ඇති අතර 2016 වසර අවසානයේ පැවති වත්කම් පදනම රු. බිලියන 912 කි. බැංකුවේ තැන්පතු 2017 අප්‍රේල් මස අවසානය වන විට සියයට 2.1 ක වර්ධනයක් වාර්තා කරමින් රු.බිලියන 671 ක අගයක පැවති අතර 2016 වසර අවසානයේ පැවති අගය රු. බිලියන 657 කි. ණය හා අත්තිකාරම් 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රු. බිලියන 313 දක්වා සියයට 7.2 කින් වර්ධනය වී ඇත. 2016 වසරේ අදාළ කාලච්ජේදයේ ඉපයූ බදු පෙර ලාභය වන රු. බිලියන 4.4 ට සාපේක්ෂව ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2017 වසරේ මුල් මාස 4 තුළ රු. බිලියන 3.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2017 වසරේ මුල් මාස 4 තුළ රු. මිලියන 5,139 ක බදු පෙර ලාභයක් හා රු. බිලියන 13.4 ක මුළු ආදායමක් උපයා ඇත. එය 2016 වසරේ මුල් මාස හය තුළ ඉපයූ මුළු ආදායම වන රු. බිලියන 10.8 ට සාපේක්ෂව සියයට 24 ක වැඩි වීමකි.

### ලංකා විදුලිබල මණ්ඩලය

2016 වර්ෂයේ අග භාගයේ සිට රටේ පවතින වියලි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය දැඩි අභියෝගයන්ට ලක් විය. එබැවින් 2016 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කරන ලද රුපියල් මිලියන 5,781 ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව 2016 එම කාලයේ දි රු. මිලියන 16,590 අලාභයක් වාර්තා වී ඇත. බදු රහිතව ඒකකයකට පිරිවැය 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළ කි.වො.පැයකට රු.20.28 වූ අතර 2016 වර්ෂයේ එම කාලපරිච්ඡේදය සඳහා එය කි.වො.පැයකට රු. 17.54 ක් වාර්තා කර ඇත. වියළි කාලගුණ තත්ත්වය හේතුවෙන් ජල විදුලි උත්පාදනය අඩුවීම නිසා 2016 දී ජල විදුලිය :තාප (ඉන්ධන) : තාප (ගල් අඟුරු) 36:31:33 ක් වූ උත්පාදන මිශ්‍රය 2017 වසරේ මුල් මාස තුන තුල 15:39:46 වූ අතර මුළු උත්පාදනය ජල විදුලිය ගි.වො.පැ 527 ,තාප (ඉන්ධන) ගි.වො.පැ 1,351 සහ තාප (ගල් අඟුරු) ගි.වො.පැ 1,603 ක් ලෙස වාර්තා කරන ලදී.
තවද, 2016.04.30 වාර්තා කල රු.මි.39,055 සමඟ සැසඳීමේ දී 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ බැංකු වෙත ඇති බැදීම් රු.මි. 31,744 ක් විය.

තාප විදුලිබල උත්පාදනය මඟින් අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීම සඳහා පළමු මාස පහ තුළ වැය වූ අතිරේක පිරිවැය පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 6,000 ක් ලබා දී ඇත,

2016 දී ගනු ලැබූ තීරණයක් මත 2017 වසරේ දී ලංකා විදුලිබල මණ්ඩලය එහි රේඛීය අමාත්‍යාංශය හරහා රජය සමඟ සාමූහික අවබෝධතා ගිවිසුමක් 2017 මාර්තු මාසය තුළ අත්සන් කරන ලදී. සාමූහික අවබෝධතා ගිවිසුමේ සඳහන් ප්‍රධාන කාර්යසාධන ඉලක්ක ලෙස පාරිභෝගිකයන්ට ලබාදෙන විදුලිබලයේ ගුණාත්වය වැඩි දියුණු කිරීම, අඩු පිරිවැය විදුලි සැපයුම්කරු බවට පත් වීම, විදුලිබල උත්පාදන ධාරිතාවය වැඩි කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම දැක්විය හැක.

### ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

2017 වර්ෂයේ ආරම්භක මාස කිහිපයේ ජාත්‍යන්තර වෙළෙඳපොළේ තෙල් මිල ගණන් වැඩිවීම නිසා මෙම වසරේ මුල් මාස හතර තුළ ඛනිජතෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයන මිල ගණන් පෙර වසරේ එම කාලය තුළ පැවති ඇ.ඩො මිලියන 470 සිට ඇ.ඩො

මිලියන 730 දක්වා සියයට 55 ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.බ්රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල පෙර වසරේ මුල් මාස හතර තුළ ඇ.ඩො 39. 61 ක පැවති අතර 2017 වසරේ මුල් මාස හතර තුළ එය ඇ. ඩො 53. 96 ක් විය.

සලකා බලන කාලය තුළ වැඩිවූ ආයනය පිරිවැය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් සිදු කර ඇත. 2016 වර්ෂයේ මුල් මාස හතර තුළ රු. බිලියන 37.6 ක්වූ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් ලාභය 2017 වර්ෂයේ එම කාලය තුළ රු. බිලියන 3.8 ක් අලාභයක් දක්වා පහත වැටී ඇත. ආනයනික භාණ්ඩ සඳහා වූ වැඩිවූ ඉල්ලුමත් සමඟ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණ වීම ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලද අතර එම කාලය තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ විනිමය හුවමාරු අලාභය රු. බිලියන 5.7 කි. 2017 වර්ෂයේ ආරම්භයත් සමඟ ඇතිවූ ආනයන පිරිවැයේ වැඩිවීම සහ ඇ.ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ වීම හේතුවෙන් බැංකු වෙත ගෙවීමට තිබූ ණය ප්‍රමාණය රු.බිලියන 309 සිට රු. බිලියන 73 කින් වැඩිවී ඇත. බැංකු කෙරෙහි ඇති ණය ප්‍රමාණය ඉහළ යාමේ ප්‍රවණතාව වසරේ ඉතිරි මාස කිහිපය තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය පිරිවැය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ඇත.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවිය යුතු ණය වෙනුවෙන් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක වෙත රජය විසින් ඇ.ඩො මිලියන 1,600 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර නිකුත් කර ඇත.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2017 වසරේ මුල් මාස 04 දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම රු. බිලියන 14.1 ක් වූ අතර එය 2016 වසරේ එම කාල සීමාවේදී පැවති ආදායමට සමාන වේ. වසරේ මුල් මාස 04 තුළ විදේශ විනිමය හුවමාරු අලාභය ගැලපීමට පෙර අධිකාරියේ බදු පෙර ලාභය රු. බිලියන 4.3 ක් වූ අතර එය 2016 වසරේ එම කාල සීමාවේ බදු පෙර ලාභය රු. බිලියන 4.6 ක් වේ. එම හේතුවෙන් විදේශ විනිමය හුවමාරු අලාභය ගැලපූ පසු 2017 වසරේ මුල් මාස 04 දී ආයතනය රු. බිලියන 0.5 ක අලාභයක් වාර්තා කර ඇත.

2017 අප්‍රේල් වන විට අධිකාරියේ සමස්ත ණය ප්‍රමාණය රු. බිලියන 237.6 ක් දක්වා සියයට 1.7 කින් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. අධිකාරියේ මෙහෙයුම් වියදම් වලින් ආසන්න වශයෙන් සියයට 28 ක් පමණ නියෝජනය වනුයේ වාර්ෂික පොළී පිරිවැය මගින් වේ.
වසරේ මුල් කාර්තුව තුළ වරාය අධිකාරිය විසින් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය සමග එක්ව ඉදිරි වසර තුනක කාලයකදී ආයතනය විසින් ළඟා කර ගත යුතු අරමුණු ලෙස හඳුනාගත් නිර්ණායකයන් පදනම් කර ගනිමින් සකස් කරන ලද මූලික කාර්ය සාධක දර්ශකයන් සහිත අවබෝධතා ගිවිසුම් ප්‍රකාශයකට අත්සන් කරන ලදි.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

දැනට පවතින සියයට 52 ක මට්ටමේ සිට 2020 වසර වන විට නලජල සැපයුම් ආවරණය සියයට 60 ක් දක්වා වර්ධනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වේ. එම නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා අයවැය මගින් සහන ලබා දීමට රජය තීරණය කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සැපයුම් යෝජනා ක්‍රම 337 ක් මේ වන විටත් ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේදී නව ව්‍යාපෘති 42ක් සිදු කිරීමට සැලසුම් කර ඇත.

කාන්දුවීම්, මණු කියවීමේ ගැටළු, නීති විරෝධී පරිභෝජනය යන හේතු මත ප්‍රධාන වශයෙන්ම ඇතිවන අදායම් නොලබන ජල සැපයුම මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කරයි. දැනට ආදායම් නොලබන ජලය සියයට 27.8 ක් වැනි ඉහළ මට්ටමක පවතින අතර 2019 වසර වන විට එම ප්‍රමාණය සියයට 26 දක්වා සුළු ප්‍රමාණයකින් අඩු කිරීමට පුරෝකථනය කර ඇත.

2017 වසරේ මුල් මාස 04 තුලදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුළු ආදායම 2016 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7 කින් එනම් රු. මිලියන 7,405 ක් දක්වා වැඩි වුවද මෙහෙයුම් පිරිවැය වැඩි වීම මත මණ්ඩලයේ ලාභය රු. මිලියන 140 ක් දක්වා සියයට 50 කින් පමණ අඩු වී ඇත. කෙසේ වෙතත්, අත්සන් කරන ලද සාමූහික අවබෝධතා ගිවිසුම අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 4,830 ක ලාභයක් ඉපයීමට බලාපොරොත්තුවේ.

## ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

නියමිත කාල සීමාව තුළ දී අළුත්වැඩියා නොකරන ලද බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් පථය රු. බිලියන 7.2 ක පිරිවැයකට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 මුල් භාගයේදී ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් ආරම්භ කර ඇත. ඒ අනුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ගුවන්පථය වාණිජ මෙහෙයුම් සඳහා උදෑසන 8.30 සිට පස්වරු 4.30 දක්වා අඛණ්ඩව මාස

තුනක කාල සීමාවක් සඳහා වසා තිබුණු අතර පුළුල් බඳ සහිත ගුවන්යානා මෙහෙයවීමේ හැකියාව ඇති කරමින් 2017.04.06 දින මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇත. මේ අනුව 2016 මුල් මාස 04 තුළ මෙහෙය වන ලද මගීන් මිලියන 3.2 ට සාපේක්ෂව බණ්ඩාරනායක ගුවන් තොටුපලේ 2017 මුල් මාස 04 ක කාලය තුළ මගීන් මෙහෙය වීම සියයට 3 කින් එනම් මිලියන 3.1 ක් දක්වා අඩු වී ඇත.

### මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල මෙහෙයුම් සංඛ්‍යා ලේඛණ

| කාලපරිච්ඡේදය | මුළු මගී මෙහෙයුම් | ජාත්‍යන්තර ගුවන් යානා මෙහෙයුම් |
|---|---|---|
| 2016 පළමු මාස 04 (කෙටුම්පත්) | 1,395 | 320 |
| 2017 පළමු මාස 04 (ප්‍රක්ෂේපිත) | 48,810 | 623 |

කෙසේ වුවද, 2016 වර්ෂයේ මුල් මාස 4 ට සාපේක්ෂව 2017 මුල් මාස 04 හි තක්සේරුගත ආදායම සියයට 1.6 කින් රුපියල් මිලියන 6,596 ක් දක්වා වර්ධනය කර ගැනීමට ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට හැකි වී ඇත.

උපාය මාර්ගික වශයෙන් වැදගත් ආයතන 5 අතුරින් එක් ආයතකයක් ලෙස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ ත්‍රෛපාර්ශවික ගිවිසුමක් එනම් සමුහික අවබෝධතා ගිවිසුමකට අත්සන් කරන ලදී. මෙම සාමුහික ගිවිසුමට අනුව 2017 වර්ෂය වෙනුවෙන් එකඟවූ අපේක්ෂිත ලාභය හා මගී මෙහෙයුම් ප්‍රමාණය පිළිවෙළින් රුපියල් මිලියන 6,699 ක් හා මගීන් මිලියන 10.5 ක් වේ.

### ශ්‍රී ලංකන් ගුවන් සමාගම

ශ්‍රී ලංකන් ගුවන් සමාගම වාණිජමය වශයෙන් ශක්‍යතාවයක් සහිත ආයතනයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණින් ප්‍රාග්ධන දායකත්වය හා කළමනාකරණ පාලනය පෞද්ගලික අංශයට ලබා දෙමින් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ ක්‍රියාවලියේ රජය මේවන විට නිරතව සිටියි. කෙසේ වුවද සුදුසු ව්‍යාපාරික හවුල්කරුවෙකු තෝරාගැනීමේ ප්‍රමාද වීම මත ආර්ථික කළමනාකරණය සඳහා වූ අමාත්‍ය මණ්ඩල කමිටුව (CCEM) විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වන සියළුම විකල්පයන් ඇගයීම සඳහා ඉහල පෙළේ කමිටුවක් පත් කර ඇත

පෙර වර්ෂයේ මුල් මාස 4 ක කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. මිලියන 6,125 සමග සංසන්දනය කිරීමේදී 2017 මුල් මාස 4 ක කාලය තුළදී ශ්‍රී ලංකන් ගුවන් සමාග මෙහි අලාභය රු. මිලියන 9,522 ක් දක්වා සියයට 55 කින් වර්ධනය වී ඇත. කෙසේවෙතත් 2017.04.30 දිනට සමුච්චිත අලාභය සහ සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙළින් රුපියල් බිලියන 170 ක් හා රු. බිලියන 116 ක් දක්වා වී ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ මිහින් ලංකා ගුවන් සමාගමේ දිගින් දිගටම පවතින මූල්‍ය ද්‍රවශීලතා ගැටළුකාරී තත්ත්වය සැලකිල්ලට ගනිමින් එම සමාග ම්වලට ණය සුරක්ෂණය කිරීම සඳහා මහා භාණ්ඩාග ාරය විසින් භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි නිකුත් කර ඇත. මෙමගින් ඇති වූ සමුච්චිත බැදීම්වල එකතුව 2017 අප්‍රියෙල් මස අවසන් වන විට රුපියල් මිලියන 29,917 ක් සහ ඇ.ඩො.මිලියන 210 ක් වී ඇත

අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටු (CCEM) තීරණයක් අනුව 2016 ඔක්තෝබර් 30 දින සිට මිහින් ලංකා ගුවන් සමාගමේ සියළු ගුවන් ගමන් ජාලය සහ ගුවන් යානා ඇණිය ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමග ඒකාබද්ධ කර ඇත. එමෙන්ම මිහින් ලංකා ගුවන් සමාගමේ සේවකයින්ට ස්වේච්ඡා වන්දි ක්‍රමයක් හඳුන්වා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී. ඒ අනුව එහි සේවකයින් 168 දෙනෙකු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගොස් ඇති අතර අවශ්‍යතාවය මත සේවකයින් 124 දෙනෙකු ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් අන්තර්ග්‍රහණය කර ගෙන ඇත.

### වගුව 4.1. මූල්‍ය නොවනරජය සතු ව්‍යවසායයන්හි නොපියවූ බැංකුණය

රු. මිලියන

| | රජය සතු වාණිජ ව්‍යාපාර | බැංකු සඳහා නොපියවූ ණය | | |
|---|---|---|---|---|
| | | 2015 | 2016 (කෙටුම්පත්) | 30.04.2017 (ඇස්තමේන්තුගත) |
| 1 | ලංකා විදුලිබල මණ්ඩලය | 41,824 | 33,468 | 31,744 |
| 2 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 354,094 | 308,516 | 382,552 |
| 3 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 233,148 | 233,189 | 237,656 |
| 4 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 9,413 | 35,728 | 42,267 |
| 5 | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 37,729 | 37,679 | 38,524 |
| 6 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම (අ) | 76,065 | 67,599 | 91,587 |

රු. මිලියන

| | රජය සතු වාණිජ ව්‍යාපාර | බැංකු සඳහා නොපියවූ ණය | | |
|---|---|---|---|---|
| | | 2015 | 2016 (කෙටුම්පත්) | 30.04.2017 (ඇස්තමේන්තුගත) |
| 7 | සීමාසහිත මිහින් ලංකා සමාගම | 165 | 3,372 | 4,817 |
| 8 | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | 3,395 | - | - |
| 9 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 431 | 560 | 1,205 |
| 10 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | - | - | - |
| 11 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 650 | 650 | 700 |
| 12 | සීමා සහිත මිල්කෝ පුද්ගලික සමාගම | 668 | 688 | 460 |
| 13 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 861 | 207 | 250 |
| 14 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 83 | 154 | 4.1 |
| 15 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 41 | - | 137 |
| 16 | සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම | - | - | - |
| 17 | සීමා සහිත හලාවත වැවිලි සමාගම | - | - | - |
| 18 | සීමා සහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව | - | - | 44.6 |
| 19 | ශ්‍රී ලංකා කපු සංස්ථාව | - | - | - |
| 20 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | - | 100 | - |
| 21 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | - | 15 | 25 |
| 22 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | - | - | - |
| 23 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | - | - | - |
| 24 | ජාතික ලොතරැයි මණ්ඩලය | - | - | - |
| 25 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | - | - | 434.6 |
| 26 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | 49 | 52 | 50 |
| 27 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 56 | 39 | 49.6 |
| 28 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | - | - | - |
| 29 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | - | - | - |
| 30 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 195 | 310 | 362 |
| 31 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | - | - | - |
| 32 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 673 | 592 | 544 |
| 33 | රාජ්‍ය දැව සංස්ථාව | - | - | - |
| 34 | සීමාසහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | - | - | 1360 |
| 35 | සීමාසහිත ලංකා සතොස | - | - | 12,133 |
| 36 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | - | - | 550.7 |
| 37 | ලංකා ධීවර සංස්ථාව | - | - | 63 |
| 38 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | 36 | 0.2 | - |
| 39 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 31,310 | 27,481 | 28,295 |
| 40 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 12,483 | 7,747 | 13,317 |
| 41 | සීමාසහිත හොටෙල් ඩිවෙලොපර්ස් ලංකා සමාගම | - | - | - |
| 42 | සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම | 23 | 14 | NA |
| | එකතුව | **803,392** | **758,160** | **889,132** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*
*a) සෑම ව්‍යාපාරයකම මාර්තු 31 කින් අවසන් වන මුදල් වර්ෂයක් සඳහා*

වගුව 4.2 : රජය සතු වාණිජ ව්‍යාපාරවල ලාභදායිත්වය

රු. මිලියන

| | රජය සතු වාණිජ ව්‍යාපාර | ලාභ /(අලාභ) | | 30.04.2017 (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|---|
| | | 2015 | 2016 (කෙටුම්පත්) | |
| 1 | ලංකා බැංකුව | 25,109 | 31,635 | 10,200 |
| 2 | මහජන බැංකුව | 19,497 | 19,399 | 6,954 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැකුව | 13,034 | 13,251 | 3,526 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 731 | 460 | 217 |
| 5 | නිවාස සංවර්ධනහා මූල්‍ය බැංකුව | 972 | 636 | 164 |
| 6 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 204 | 255 | 94 |
| 7 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2,112 | 2,089 | 345 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | 348 | 464 | 218 |
| 9 | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 18,152 | 15,846 | 7,534 |
| 10 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,017 | 9,903 | 5139 |
| 11 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 4,449 | 6,000 | 1,561 |
| 12 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 224 | 193 | 104 |
| 13 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | (256) | (3,261) | (842) |
| 14 | ලංකා විදුලිබල මණ්ඩලය | 28,845 | (14,499) | (16,590) |
| 15 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | (19,468) | 69,620 | (3,846) |
| 16 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | (9,575) | 2,212 | (571.64) |
| 17 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 252 | 835 | 140 |
| 18 | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 2,378 | 6,888 | 1,893 |
| 19 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම | (12,622) | (28,140) | (9,522) |
| 20 | සීමාසහිත මිහින් ලංකා සමාගම | (1,196) | (1,579) | NA |
| 21 | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | (3,438) | 3,617 | 3.5 |
| 22 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | (586) | (703) | (245) |
| 23 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 510 | 833 | 198 |
| 24 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 80 | 28 | 170 |
| 25 | සීමාසහිත මිල්කෝ පුද්ගලික සමාගම | (243) | 274 | 137 |
| 26 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 39 | (18) | (102) |
| 27 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | (189) | (134) | (12) |
| 28 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | (401) | (404) | (38) |
| 29 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 155 | 132 | 65 |
| 30 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 79 | 69 | 74 |
| 31 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව | 7 | 33 | 30 |
| 32 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 17 | 32 | 1.4 |
| 33 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 509 | 206 | 43 |
| 34 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 57 | (34) | (36) |
| 35 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 13 | 14 | 1.7 |
| 36 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 1,669 | 2,833 | 621 |
| 37 | ජාතික ලොතරැයි මණ්ඩලය | 700 | 414 | 34 |

රු. මිලියන

| | රජය සතු වාණිජ ව්‍යාපාර | ලාභ /(අලාභ) 2015 | 2016 (කෙටුම්පත්) | 30.04.2017 (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|---|
| 38 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 414 | 262 | 151.7 |
| 39 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | 49 | 72 | NA |
| 40 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 1,230 | 1,677 | 370 |
| 41 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | (250) | 418 | (36.5) |
| 42 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | 327 | (162) | (120) |
| 43 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | (375) | (160) | 8.8 |
| 44 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 62 | 84 | 20.3 |
| 45 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | (40) | 4 | 8.6 |
| 46 | රාජ්‍ය දැව සංස්ථාව | 795 | 531 | 80.5 |
| 47 | සීමාසහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | 19 | 26 | 15 |
| 48 | සීමාසහිත ලංකා සතොස | (3,647) | (4,805) | 742 |
| 49 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 3 | 10 | (145) |
| 50 | ලංකා ධීවර සංස්ථාව | (190) | (91) | 8 |
| 51 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | (60) | (113) | (22.28) |
| 52 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 411 | 713 | 45 |
| 53 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 436 | 147 | 12 |
| 54 | සීමාසහිත හොටෙල් ඩිවෙලොපර්ස් ලංකා සමාගම | 433 | 605 | 1.88 |
| 55 | සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම | (981) | 1,103 | (653) |
| | | **73,821** | **139,720** | **8,149.96** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

### වගුව 4.3. : රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම

රු. මිලියන

| අයිතමය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 30.04.2017 දිනට |
|---|---|---|---|---|---|---|---|
| අයභාර | **28,629** | **31,514** | **30,400** | **42,137** | **26,118** | **92,338** | **3,950** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 4,500 | 8,200 | 5,000 | 4,000 | 2,800 | 12,026 | - |
| ලංකා බැංකුව | 4,000 | 5,000 | 5,000 | 6,500 | 5,000 | 18,000 | 1000 |
| මහජන බැංකුව | 4,500 | 4,500 | 4,500 | 6,000 | 3,000 | 8,000 | 1000 |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 9,050 | 7,200 | 10,100 | 10,000 | 10,000 | 28,000 | - |
| ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | - | - | - | 10,000 | - | 10,000 | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | - | 25 | 40 | 10 | 10 | 10 | - |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | 500 | 500 | - | 87 | 88 | - |
| රාජ්‍ය දැව සංස්ථාව | 75 | 50 | 50 | 25 | 50 | 175 | 100 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 59 | 20 | 20 | 25 | 30 | 65 | |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 3,495 | 4,200 | 3,200 | 4,000 | 3,000 | 2,500 | 750 |
| භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 740 | 750 | 700 | 650 | 850 | 900 | - |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | - | 100 | - | 75 | 175 | - |
| ලංකා විදුලිබල මණ්ඩලය | 2,000 | - | - | - | - | 8,000 | - |

රු. මිලියන

| ආයතනය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 30.04.2017 දිනට |
|---|---|---|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩලය | 210 | 200 | - | 100 | 141 | 115 | - |
| ජාතික ලොතරැයි මණ්ඩලය | - | 502 | 500 | - | 50 | 550 | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | - | - | 500 | 500 | 1,500 | 500 |
| සුරැකුම්පත් හා විනිමය කොමිසම | - | - | 94 | - | - | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | - | - | 300 | - | - | - | - |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | 350 | 200 | 250 | 400 | 768 | 600 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | - | - | 50 | 75 | 100 | 216 | - |
| විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | - | - | - | - | - | 1000 | - |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | - | - | - | - | 200 | - |
| ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | - | - | - | - | 25 | 25 | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය | - | - | 25 | - | - | 25 | - |
| වෙනත් | - | 17 | 21 | 2 | - | - | - |
| **ලාභාංශ** | **5,722** | **4,548** | **4,770** | **4,664** | **3,678** | **15,821** | **421** |
| ලංකා බැංකුව | 20 | 346 | 346 | 346 | 346 | 346 | 173 |
| මහජන බැංකුව | - | 158 | 316 | 316 | 316 | 316 | 158 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 536 | 759 | 760 | 759 | 795 | 795 | - |
| ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 68 | 42 | 44 | 49 | 61 | 62 | - |
| ලංකා ඛණිජ වැලි සමාගම | 500 | 1,700 | - | 43 | 14 | - | - |
| ලංකා කර්මාන්ත වතු සමාගම | 31 | 47 | 55 | 55 | 55 | 47 | - |
| සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 2,406 | - | 500 | 500 | 497 | 1,500 | - |
| ලංකා විදුලිබල සමාගම | - | 75 | 75 | 25 | 87 | 152 | - |
| වැවිලි සමාගම්* | 219 | 179 | 139 | 80 | 62 | 10 | 54 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,750 | 1,001 | 2,199 | 2,001 | 1,003 | 11,857 | - |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 6 | 18 | 36 | 36 | 36 | 36 | - |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 60 | 60 | 60 | 60 | 30 |
| ජාතිකසංවර්ධන බැංකුව | 2 | 4 | 10 | 6 | 5 | 2 | 1 |
| ලංකා පොස්පේට් සමාගම | 20 | 40 | 25 | 35 | 30 | - | 5 |
| ස්වාධීන රූපවාහිනී ජාලය | 49 | 88 | 50 | 125 | 84 | - | - |
| රක්නා ආරක්ෂක ලංකා සමාගම | - | 10 | 17 | 68 | 93 | - | - |
| ලංකා පොහොර සමාගම | 12 | 4 | 9 | 38 | 54 | 116 | - |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | - | 8 | 10 | 12 | 10 | 25 | - |
| ලංකා ලේලන්ඩ් සමාගම | 35 | 5 | 97 | 11 | 54 | 34 | - |
| වෙනත් | 8 | 4 | 22 | 99 | 16 | 463 | - |
| **එකතුව** | **34,351** | **36,062** | **35,170** | **46,801** | **29,796** | **108,159** | **4,371** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 5 වන පරිච්ඡේදය


## 5.1 විදේශ මූල්‍යයන එකඟතා

2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන හා මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් ළඟා කරගත යුතු ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම සඳහා රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග 2017 වර්ෂයේ ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් දහයක් (10) මඟින් එ.ජ.ඩොලර් මිලියන 244.1 ක එකඟතා ඇති කරගෙන ඇත. මෙයින් එ.ජ.ඩොලර් මිලියන 174.3 ක් ණය ගිවිසුම් අනුව මූල්‍යයනය වන අතර, ඉතිරි එ.ජ.ඩොලර් මිලියන 69.8ක ප්‍රමාණය ප්‍රදාන එකඟතා අනුව මූල්‍යයනය වේ. මෙම කාලපරිච්ඡේදයේ දී ඇති කර ගත් මුළු එකඟතා පිළිබඳ ලැයිස්තුවක් එක් එක් ණය ලබාගත් මූල්‍ය කොන්දේසි සමග 5.1 වගුවෙහි දක්වා ඇත.

2017 ජනවාරි - අප්‍රේල් කාලය තුළ සංවර්ධන කටයුතු මූල්‍යයනය කිරීම සඳහා ඇති කරගත් එකඟතාවලින් ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය වැඩිම ප්‍රමාණයක් එකඟතා පළකරන ලද සංවර්ධන පාර්ශ්වකරු වන අතර, එම ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 119.4 කි. ඉන්පසු වැඩිම එකඟතා ප්‍රමාණයක් අත්සන් කර ඇත්තේ පිළිවෙළින් යුරෝපීය ආයෝජන බැංකුව (එ.ජ.ඩොලර් මිලියන 53.4), යුරෝපීය ප්‍රජාව (එ.ජ.ඩොලර් මිලියන 44.8), කොරියාව (එ.ජ.ඩොලර් මිලියන 13.0) හා ජපානය (එ.ජ.ඩොලර් මිලියන 11.2) යන ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරුවන් සමග වේ.

අංශ අනුව සැළකීමේ දී, 2017 වර්ෂයේ පළමු මාස 4 තුළ විවිධ සංවර්ධන කටයුතු සඳහා ඇතිකරගත් එකඟතාවන්ගෙන් වැඩිම ප්‍රමාණය කෘෂිකාර්මික අංශය (එ.ජ.ඩොලර් මිලියන 153.8) සඳහා වන අතර, ඉන්පසු වැඩි ප්‍රමාණයක් ජල සම්පාදන හා සනීපාරක්ෂක (එ.ජ.ඩොලර් මිලියන 53.4) අංශය සඳහා ඇතිකර ගෙන ඇත.

**රූපසටහන 5.1 : 2017 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා එක් එක් අංශ අනුව ඇතිකරගත් එකඟතා (එ.ජ.ඩොලර් මිලියන)**



**වගුව 5.1: 2017 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා ඇතිකරගත් විදේශ මූල්‍යයන එකඟතා අදාළ මූල්‍ය කොන්දේසි සමග**

| | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | විනිමය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | මූල්‍ය කොන්දේසි | | | | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | | |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| **ද්විපාර්ශවික** | | | | | | | | | | | | | |
| ජපානය | ප්‍රදාන | 2017/02/27 | ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන (මහජන ආරක්ෂාව වැඩි දියුණු කිරීම හා ප්‍රති-ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම) | යෙන් | 250.0 | 337.3 | 2.2 | අදාළ නොවේ | | | | | 3.8 |
| | ප්‍රදාන | 2017/04/12 | ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන (වරාය හා නාවුක කටයුතු) | යෙන් | 1,000.0 | 1,353.8 | 8.9 | අදාළ නොවේ | | | | | 3 |
| කොරියාව | ප්‍රදාන | 2017/02/22 | ජාතික අධ්‍යාපන විද්‍යාලය පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය(NCoE) | එ.ජ.ඩොලර් | 13.0 | 1,966.2 | 13.0 | අදාළ නොවේ | | | | | 5 |
| **බහුපාර්ශවීය** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 2017/02/17 | උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සැලසුම් අත්තිකාරම | එ.ජ.ඩොලර් | 1.3 | 196.0 | 1.3 | ස්ථාවර | 2 | අදාළ නොවේ | - | 1 | 6 |
| යුරෝපීය ප්‍රජාව | ප්‍රදාන | 2017/04/06 | ශ්‍රී ලංකාවේ ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | යූරෝ | 12.0 | 1,944.4 | 12.8 | අදාළ නොවේ | | | | | 0 |
| | ප්‍රදාන | 2017/04/06 | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ සහාය | යූරෝ | 30.0 | 4,860.9 | 32.0 | අදාළ නොවේ | | | | | 0 |

| | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | විනිමය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | මූල්‍ය කොන්දේසි | | | | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | පොලිය | | | | | |
| | | | | | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | එ.ජ.ඩොලර් | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | | |
| යුරෝපීය ආයෝජන බැංකුව | ණය | 2017/01/20 | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - ව්‍යාපෘතිය 3 | යූරෝ | 50.0 | 8,014.6 | 53.4 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 0 | - | 1 | 11 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | ප්‍රදාන | 2017/02/15 | තිරසාර භෝග නිෂ්පාදනය සඳහා ක්ෂේත්‍රයට අදාළ පොහොර කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම | එ.ජ.ඩොලර් | 0.3 | 40.8 | 0.3 | අදාළ නොවේ | | | | | 0 |
| | ප්‍රදාන | 2017/03/20 | නියඟයෙන් පීඩාවට පත් කෘෂිකාර්මික ජීවනෝපාය සහිත අවදානම් ගෘහ ඒකක යථා තත්වයට පත් කිරීම සඳහා හදිසි ආධාර | එ.ජ.ඩොලර් | 0.5 | 75.7 | 0.5 | අදාළ නොවේ | | | | | 0 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 2017/01/17 | කෘෂිකර්ම අංශය නවීකරණයකිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. | 89.2 | 17,963.2 | 119.7 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75% | 5 | 24 |
| එකතුව | | | | | | 36,752.9 | 244.1 | | | | | | |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : 1. ඛෂර්ධඝා = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය, වි.ගැ.හි. = විශේෂ ගැනුම් හිමිකම්*

*2. රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ඇතිකරගත් එකඟතා අඩංගු නොවේ*

*3. එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත*

### 5.2 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි

2017 වර්ෂයේ ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුවූ විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 440.6 (රු. මිලියන 66,514.0) ක් වන අතර, ඉන් එ.ජ.ඩොලර් මිලියන 431.9ක් ණය මඟින් මූල්‍යයනය වූ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය සඳහා ප්‍රතිලබ්ධිවී ඇතිඅතර, ඉතිරි එ.ජ.ඩොලර් මිලියන 8.7ක ප්‍රමාණය ප්‍රදාන මඟින් මූල්‍යයනය වන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය පිණිස ප්‍රතිලබ්ධි වී ඇත. 5.2වන රූපසටහනේ පෙන්වා ඇති පරිදි, මෙම ප්‍රතිලබ්ධිවලින් වැඩිම ප්‍රමාණය චීනය විසින් ලබාදුන් මූල්‍ය පහසුකම් වන අතර, එය මුළු ප්‍රමාණයෙන් සියයට 40ක් පමණ වේ. ඉන්පසු වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත්තේ පිළිවෙළින් ලෝක බැංකුව (සියයට 17) හා ආසියානු සංවර්ධන බැංකුව (සියයට 16) වේ.

**වගුව 5.2 : එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2017 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි**


| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (මිලියන)* | | | | | |
|---|---|---|---|---|---|---|
| | ණය | | ප්‍රදාන | | එකතුව | |
| | රුපියල් | එ.ජ.ඩොලර් | රුපියල් | එ.ජ.ඩොලර් | රුපියල් | එ.ජ.ඩොලර් |
| ද්විපාර්ශ්වික | 42,813.3 | 283.8 | 283.2 | 1.8 | 43,096.5 | 285.6 |
| චීනය | 25,650.1 | 170.1 | - | - | 25,650.1 | 170.1 |
| ජපානය | 3,990.5 | 26.4 | 216.4 | 1.4 | 4,206.9 | 27.8 |
| ප්‍රංශය | 1,630.1 | 10.8 | - | - | 1,630.1 | 10.8 |
| Deutsche Bank AGආයතනය (එක්සත් රාජධානිය) | 1,602.1 | 10.6 | - | - | 1,602.1 | 10.6 |
| ඉන්දියාව | 1,576.0 | 10.5 | - | - | 1,576.0 | 10.5 |
| ස්පාඤ්ඤය | 1,563.4 | 10.4 | - | - | 1,563.4 | 10.4 |
| සෞදි අරාබිය | 1,329.2 | 8.8 | - | - | 1,329.2 | 8.8 |
| HSBC ආයතනය (Denmark EKF ඇපකර සහිත) | 1,043.2 | 6.9 | - | - | 1,043.2 | 6.9 |
| හංගේරියාව | 810.8 | 5.4 | - | - | 810.8 | 5.4 |
| HSBC Bank PLC ආයතනය (එක්සත් රාජධානිය) | 569.5 | 3.8 | - | - | 569.5 | 3.8 |
| ආනයන අපනයන බැංකුව එක්සත් ජනපදය | 526.5 | 3.5 | - | - | 526.5 | 3.5 |
| ජ(ර්)මනිය | 397.2 | 2.7 | 66.8 | 0.4 | 464.0 | 3.1 |
| කුවේටය | 447.4 | 3.0 | - | - | 447.4 | 3.0 |
| Export Finance & Insurance Corporationආයතනය (ඔස්ට්‍රේලියාව) | 432.0 | 2.9 | - | - | 432.0 | 2.9 |
| Banco Bilbao Vizcaya Argentaria S.A. ආයතනය (ස්පාඤ්ඤය) | 397.0 | 2.6 | - | - | 397.0 | 2.6 |
| KBC Bank of Belgium ආයතනය බෙල්ජියම | 319.9 | 2.1 | - | - | 319.9 | 2.1 |
| UniCredit Bank Austria AG ආයතනය (ඔස්ට්‍රියාව) | 207.0 | 1.4 | - | - | 207.0 | 1.4 |
| Co-op Centrale Raiffeisen-Boerenleenbank ආයතනය (නෙද(ර්)ලන්තය) | 140.1 | 0.9 | - | - | 140.1 | 0.9 |
| කොරියාව | 139.1 | 0.9 | - | - | 139.1 | 0.9 |
| Raiffeisen Zentral Bank ආයතනය (ඔස්ට්‍රියාව) | 42.0 | 0.3 | - | - | 42.0 | 0.3 |
| **බහුපාර්ශ්වීය** | **22,383.4** | **148.1** | **1,034.2** | **6.9** | **23,417.6** | **155.0** |
| ආසියානු සංවර්ධන බැංකුව | 10,899.1 | 72.1 | - | - | 10,899.1 | 72.1 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | 8,379.1 | 55.5 | 902.5 | 6.0 | 9,281.6 | 61.5 |
| ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව | 1,727.2 | 11.4 | 55.8 | 0.4 | 1,783.0 | 11.8 |
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 727.1 | 4.8 | - | - | 727.1 | 4.8 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 650.8 | 4.3 | 75.9 | 0.5 | 726.7 | 4.8 |
| **එකතුව** | **65,196.6** | **431.9** | **1,317.4** | **8.7** | **66,514.0** | **440.6** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී 2017 අප්‍රේල් 30 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත*

* *තාවකාලික*


**රූපසටහන 5.2: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2017 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි**




*වෙනත් :ඩෙන්මා(ර්)කය, හංගේරියාව, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, එක්සත් ජනපදය, ජ(ර්)මනිය, කුවේටය, ඔස්ට්‍රේලියාව, බෙල්ජියම, ඔස්ට්‍රියාව, නෙද(ර්)ලන්තය සහ කොරියාව*

විමසුමට ලක්වන කාලච්ඡේදයේ සිදු වූ ප්‍රතිලබ්ධි අතරින් මාර්ග හා පාලම් අංශය සඳහා වැඩිම ප්‍රමාණය ප්‍රතිලබ්ධි වූ අතර, එය මුළු ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් සියයට 50ක් පමණ වේ. ඉන්පසු වැඩි ප්‍රමාණයක් ප්‍රතිලබ්ධි වී ඇත්තේ පිළිවෙළින් විදුලිබල හා බලශක්ති (සියයට 13), ජල සම්පාදන හා සනීපාරක්ෂාව (සියයට 9) හා සෞඛ්‍ය හා සමාජ සුබසාධන (සියයට 7) යන අංශයන්හිය.

**රූපසටහන 5.3 : එක් එක් අංශය වෙනුවෙන් 2017 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි (එ.ජ. ඩොලර් මිලියන)**





*වෙනත් : අධ්‍යාපන හා පුහුණු, පශු සම්පත් සංවර්ධනය, ආරක්ෂාව, ආපදා කළමනාකරණය, කම්කරු හා වෘත්තීය පුහුණු, පරිසරය, කෘෂිකර්මය, ආයතන කළමනාකරණය හා සංවර්ධනය*

## 5.3 පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය

දැනට එකඟතා පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2017 අප්‍රේල් 30 දින වන විට එ.ජ.ඩොලර් මිලියන 8,022.2 (රු. මිලියන 1,217,251.9) ක් විය. මුළු ශේෂයෙන් එ.ජ.ඩොලර් මිලියන 5,430.7ක් හෙවත් සියයට 68ක් පමණ ආර්ථික යටිතල පහසුකම් අංශයේ ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස වන අතර, ඉන් එ.ජ.ඩොලර් මිලියන 2,751.5ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ව්‍යාපෘතිවල ද එ.ජ.ඩොලර් මිලියන 1,488.5 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව හා එ.ජ.ඩොලර් මිලියන 751.5ක් විදුලිබල හා බලශක්ති අංශයේ ද ප්‍රධාන වශයෙන් උපයෝජනය වීමට නියමිතය.

**රූපසටහන : 5.4 පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව**




*සටහන : රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ඇතිකරගත් එකඟතා අනුව සිදුවීමට නියමිත ප්‍රතිලබ්ධි අඩංගු නොවේ*
*වෙනත් : නෙද(ර්)ලන්තය, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව, සෞදි අරමුදල, කොරියාව, කුවේටය, යුරෝපීය ආයෝජන බැංකුව, ස්පාඤ්ඤය, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල, එක්සත් රාජධානිය, ඩෙන්මා(ර්)කය, ජ(ර්)මනිය, එක්සත් ජනපදය, පකිස්තානය, ඔස්ට්‍රේලියාව, ස්වීඩනය සහ බෙල්ජියම*

**වගුව 5.3 : 2017 අප්‍රේල් 30 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය**


| අංශය | ශේෂය (මිලියන) | |
|---|---|---|
| | රුපියල් | එ.ජ.ඩොලර් |
| **කෘෂිකර්මය** | **135,270.5** | **891.5** |
| කෘෂිකර්මය | 19,442.1 | 128.1 |
| ධීවර | 197.3 | 1.3 |
| පශුසම්පත් සංවර්ධනය | 14,832.0 | 97.7 |
| ඉඩම්, වතු හා වාරිමාර්ග | 100,799.1 | 664.4 |
| **ආර්ථික යටිතල පහසුකම්** | **824,397.5** | **5,430.7** |
| ප්‍රවාහනය | 47,485.9 | 313.0 |
| වරාය හා නාවුක | 19,528.0 | 126.2 |
| විදුලිබල හා බලශක්ති | 114,023.4 | 751.5 |
| ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 225,865.5 | 1,488.5 |
| මාර්ග හා පාලම් | 417,494.7 | 2,751.5 |
| **ආර්ථික යටිතල පහසුකම්** | **113,171.8** | **746.0** |
| අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු | 39,256.5 | 258.8 |
| සෞඛ්‍ය හා සමාජ සුබ සාධනය | 20,933.7 | 138.0 |
| නිවාස හා නාගරික සංවර්ධනය | 50,720.5 | 334.3 |
| පුනරුත්ථාපනය | 2,261.1 | 14.9 |
| **මූල්‍ය හා බැංකු** | **53,680.5** | **353.8** |
| **ආයතන හා කර්මාන්ත සංවර්ධනය** | **2,907.0** | **19.2** |
| **පරිසරය** | **14,084.1** | **92.8** |
| **වෙනත්** | **73,740.5** | **488.2** |
| **එකතුව** | **1,217,251.9** | **8,022.2** |

### 5.4 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2017 අප්‍රේල් 30 වන විට රජය ලබාගත් ණය සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 25.6[1](හෝ රු. බිලියන 3,886.5)කි. තවද,2017 ජනවාරි 1සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] එ.ජ.ඩොලර් මිලියන 713.4කි. මෙයින්,එ.ජ.ඩොලර් මිලියන 332.9ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන එ.ජ.ඩොලර් මිලියන 313.3ක් පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

2017 සඳහා පුරෝකතනය කරන ලද ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,183.0කි. මෙයින්,සියයට 30ක් මෙම වර්ෂයේ අප්‍රේල් 30 වනවිට ගෙවා ඇත. 2017 වර්ෂයට අදාළව මාසික ණය සේවාකරණය 5.4 වන රූපසටහෙන් දක්වා ඇත.

**රූපසටහන 5.4: 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා සිදුකර ඇති ණය සේවාකරණ ගෙවීම් සහ වර්ෂයේ ඉදිරි කාලපරිච්ඡේදය සිදු කරනු ලබන පුරෝකථන (ඇ. ඩො. මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

1 *සංවර්ධන ණය, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා වෙනත් වෙළඳපොළ ණය අගයයන් අඩංගු වේ. රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.*

2 *මුළු ණය සේවාකරණය = පොලී ගෙවීම් + ණය වාරික ආපසු ගෙවීම්*

3 *පුරෝකතනය කර ඇත්තේ 2017 අප්‍රේල් 30 පැවති විනිමය අනුපාතිකයන් අනුව වේ.පුරෝකතනය සඳහා දැනට ඇති ණය ප්‍රමාණය පමණක් පදනම් කරගෙන ඇති අතර 2017 වර්ෂයේ සිදුවන නව ණය ගැනීම් අනුව එකතුවන ණය සේවාකරණ ගෙවීම් අගයයන් එකතුකර නැත*